සැ.යු. - මෙවර ගැසට් පත්‍රයේ VI කොටසේ 2015.12.31 දින දක්වා වූ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින්ගේ නාමාවලියක් භාෂාත්‍රයෙන්ම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,973 - 2016 ජුනි මස 24 වැනි සිකුරාදා - 2016.06.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1004 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1034 |

*සැ. යු.* - සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත 2016 මැයි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජූලි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ජූලි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''*

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2016 ජුනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — පුත්තලම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 ජූලි මස 25 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජුනි මස 06 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවිය යුතු කොට්ඨාසය* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පුත්තලම | කල්පිටිය | තලවිල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ කල්පිටිය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |

06-807

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 ජූලි මස 25 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජූනි මස 02 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අනුරාධපුර | ගල්නෑව | කලාගම් පළාත කොට්ඨාසයේ නෑගම්පහ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුර | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර |
| අනුරාධපුර | කැකිරාව | කලාගම් පළාත කොට්ඨාසයේ කැකිරාව හා තිබ්බොටුවැව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුර | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර. |

06-806

## ශ්‍රී ලංකා පොලීසිය

### පොලිස් කොස්තාපල් තනතුර - විශේෂ කාර්ය බලකාය

ශ්‍රී ලංකා පොලීසියේ විශේෂ කාර්ය බලකායේ ආධුනික පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, (බඳවා ගැනීම්), ආධුනිකයින් බඳවා ගන්නා කාර්යාලය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහලින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2016.08.24 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 3,54,480 - 7 x 3,600 - 27 x 4,440 - රු. 4,99,560.00

2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3-2016 හි II වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිටය.

තවද මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබාදී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇතඃ-

| | | | |
|---|---|---|---|
| *(අ)* | ජීවන වියදම් දීමනාව | රු. | 7,800.00 |
| *(ආ)* | දිරි දීමනාව | රු. | 1,500.00 |
| *(ඇ)* | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. | 250.00 |
| *(ඈ)* | මූලික වැටුපෙන් 1/4 දීමනාව | රු. | 3570.00 |
| *(ඉ)* | දුෂ්කර දීමනාව | රු. | 2000.00 |
| *(ඊ)* | සංයුක්ත දීමනා රු. 10,500.00 (400 x 30 මෙහෙයුම් ප්‍රදේශ සඳහා) | | |
| *(උ)* | සංයුක්ත දීමනා රු. 8,400.00 (400 x 24 මෙහෙයුම් නොවන ප්‍රදේශ සඳහා) | | |

මෙම දීමනාවලට අමතරව -

*(අ)* නොමිලේ ගමන් පහසුකම්,
*(ආ)* නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.),

*(ඇ)* සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ,

*(ඈ)* තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්,

*(ඉ)* රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ,

*(ඊ)* විශේෂ කාර්ය බලකායේ මූලික පුහුණුවෙන් පසු විශේෂ කාර්ය බලකායේ සේවය කරන කාලය තුළ පමණක් විශේෂ කාර්ය බලකායේ අනිකුත් නිලධාරීන්ට ගෙවනු ලබන විශේෂ දීමනාවලට හිමිකම් ඇත.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

*(අ) වයස් සීමාව* :

*ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-25 ත් අතර විය යුතු ය. එසේ වුව ද දැනට ශ්‍රී ලංකා පොලීසියේ රාජකාරියේ නියුතු පොලිස් නිලධාරීන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 27 දක්වා අයදුම්කළ හැකිය.*

*(ආ) අධ්‍යාපන සුදුසුකම්* :

- අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකකදී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේ දී විෂයයන් 05ක් සමත් විය යුතු ය.

**සටහන 01:** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් වශයෙන් ද, සලකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

සටහන 02 : අ.පො.ස. (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

සටහන 03: වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

*(ඇ)* ශාරීරික සුදුසුකම් :

- *උස අඩි 05 යි. අඟල් 04යි. (අවම),*
- පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා).

**සටහන** : විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර

දුන් අයදුම්කරුවකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඈ) *දෘෂ්ඨිය පිළිබඳ අවශ්‍යතාවයන්* .— එක් ඇසක දෘෂ්ඨිය 6/12 අඩු නොවිය යුතු ය. දෘෂ්ඨිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේනම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ඨිය සාමාන්‍ය විය යුතු ය. යම් අපේක්ෂකයෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඉ) *අනෙක් සුදුසුකම්* :

* අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කරන පොලිස් නිලධාරීන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත්විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

- ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය

| ව්‍යායාමය | වාර ගණන | කාලය (මිනිත්තු) |
|---|---|---|
| මීටර් 1000 දිවීම | - | 04 |
| චිනප්ස් (Chin ups) | 05 | 01 |
| පුෂප්ස් (Push ups) | 15 | 01 |
| සිටප් (Situps) | 15 | 01 |
| ස්කොට්ට්‍රස් (Scott thrush) | 12 | 01 |

යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

- *වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය.*—කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතු ය.

- *සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය.*— කාලය පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය* :

අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්‍ෂණයකින් සමත් විය යුතු ය. වෛද්‍ය පරීක්‍ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්‍ෂණයෙන් සමත් වූ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය, ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්‍ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. *පසුබිම් පරීක්ෂණය* :

(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :

- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.

- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

09. *පත්වීමේ කොන්දේසි* :—

මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

10. *සේවා කොන්දේසි* :—

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා

හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙලුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙක්ම ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරින් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් ගැසට් II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කළ යුතු වන අතර මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා, නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙලුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(උ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන් පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.

(ඌ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන් සේවය ස්ථිර කිරීමෙන් පසු ශ්‍රී ලංකා පොලීසියේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11\. (අ) මෙම ගැසට් පත්‍රයේ I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12.අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතු ය.) :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික, (තිබේ නම් පමණක්),

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13\. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතු ය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව භාර නොදිය යුතු ය.

14\. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.*

පොලිස්පති.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**ශ්‍රී ලංකා පොලිසිය**

**පොලිස් කොස්තාපල් තනතුර - විශේෂ කාර්ය බලකාය**

*ආදර්ශ අයදුම්පත්‍රය*

01. (අ) සම්පූර්ණ නම :————.
(පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතු ය.
(ආ) නම (මුලකුරු සමඟ) :————.

(ඇ) අයදුම් කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතු ය.)

03. පියාගේ සම්පූර්ණ නම :————.

04. අයදුම්කරු උපන් ස්ථානය :————.

උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :——— පළාත :————.

05. (අ) වර්තමාන ලිපිනය :————.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඇ) ස්ථිර ලිපිනය :————.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(ඊ) දුරකථන අංකය : නිවස :————. ජංගම :————.

06. (අ) ජාතිය :————.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.
* අයදුම්කරු :————.
* අයදුම්කරුගේ පියා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :————.

07. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)
වයස : (ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)

අවුරුදු :————. මාස :————. දින :————.

08. උස : අඩි :————. අඟල් :————.

පපුව : අඟල් :————.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :————.

10. අතිරේක සුදුසුකම් :————. (සහතික පත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය)

11. විවාහක/අවිවාහක බව :————.

12. (අ) දැනට කරන රැකියාව :————.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :————.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේ ද ? :————.

14. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් (ඥාතීන් නොවන) :

(අ) ————.

(ආ) ————.

15. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලිස් සේවයේ, සේවය කර තිබේ ද ? :————.

එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න :————.

16. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :————.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය :————.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :————.

18. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :————.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද් ද? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලිසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

20. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ......................... මයා/මිය/මෙනවිය ..................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර :———.
දිනය :———.

06-697

---

## ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව

### ආධුනික ශිෂ්‍යභට නිළධාරි පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ නියමු පොදු රාජකාරි ශාඛාවෙහි ආධුනික ශිෂ්‍යභට නිළධාරීන් සඳහා පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

BSc (Aviation Studies) උපාධි වැඩ සටහන් යටතේ ඇතුල්වීමේ සුදුසුකම් (ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය මගින් පිලිගත්)

අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 4 ක් සහිතව විෂයයන් 6 කින් සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද සිංහල / දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද ලබා සිටිය යුතුයි. තව ද අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරක දී භෞතික විද්‍යා විෂය ධාරාව ( භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා සංයුක්ත ගණිතය) / ජීව විද්‍යා විෂය ධාරාව ( භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා ජීව විද්‍යාව) යන විෂය ධාරාවන්ගෙන් (අදාළ පරිදි) විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා තිබිය යුතුයි.

3. *අනෙකුත් සුදුසුකම්* - අයදුම්කරුවන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන්ම සපුරාලිය යුතුයි.

*අ.* පුරවැසිභාවය : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.

*ආ.* වයස : 2016 නොවැම්බර් මස 15 දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 22 ට නොවැඩි විය යුතුයි.

*ඇ.* උස : අඩි 5 යි අඟල් 6 කට නොඅඩු විය යුතුයි.

*ඈ.* බර : 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26
ශරීර ස්කන්ධ දර්ශකය = $\frac{\text{බර (කි.ග්‍රෑ)}}{\text{උස}^2\text{ (මී)}}$

*ඉ.* පපුව : අඟල් 32 ට නොඅඩු විය යුතුයි.

*ඊ.* වර්ණ දෘෂ්ඨිය : සීපී 2

*උ.* දෘෂ්ටි තීක්ෂණත්වය : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් රහිත)

*ඌ.* සිවිල් තත්ත්වය : අපේක්ෂකයින් අවිවාහක විය යුතුයි. කිසිම ආධුනිකයෙකුට පුහුණුව ලබන කාලයේ දී සහ අධිකාරියට පත්කළ දින සිට වසරක් ගතවන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

4. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ඨ දක්ෂතා ගැන නිසි ලෙස සලකා බලනු ලැබේ.

5. ඉහත සඳහන් 2 සහ 3 ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කරනු ලැබේ. ගැසට් පත්‍රයේ ඉල්ලා ඇති මිම්වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ උස නියමිත පරිදි නොමැති වුව ද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඔහු ගැන සලකා බලනු ලැබේ.

6. *සේවා කොන්දේසි :*

(අ) අපේක්ෂකයින් අනෙකුත් නිළයන් හා සමානව මූලිකව නිත්‍ය සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර ඔවුන් මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ. ආධුනිකයා ලබා ඇති ශාඛාව අනුව මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාව සහ වෘත්තීය පුහුණුව නිමවීමෙන් පසු ඔහු ප්‍රථමයෙන් බඳවා ගනු ලැබූ නිළයෙන් වෙනස්ව නියමු නිළධාරි නිළයේ ස්ථිර අධිකාරියට පත් කරනු ලැබේ.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයන් සූදානමින් සිටිය යුතුයි.

(ඇ) පුහුණුව ලබන කාල සීමාව තුළදී හා ඉන් පසුව පුද්ගලයින් ගුවන් හමුදා නීතියට යටත් විය යුතුයි.

(ඈ) සෑම ආධුනිකයෙකුටම සියලුම ආයිත්තම් සහිත නිල ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(ඉ) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුදා භෝජනාගාර තුළින් ආහාර සපයනු ලැබේ.

(ඊ) අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුල දී යම් ආධුනිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියළුම වියදම් එම ආධුනිකයාගේ මව / පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

(උ) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදාළ ආධුනිකයාගේ මව / පියා හෝ භාරකරු විසින් එතෙක් ඔහු වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදාධිපති සමඟ බැඳුම්කරයකට ඇතුළත් විය යුතු ය.

(ඌ) මව, පියා හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) හා (උ) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයෙහි 27 වැනි කොටුවේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුයි. තෝරාගනු ලබන අපේක්ෂකයින් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ජනරජය සමඟ මේ බව තහවුරු කරන ඔප්පුවකට බැඳිය යුතුයි.

(එ) දෙවන සහ තෙවන ඡේදයේ පරිදි සුදුසුකම් ඇති අපේක්ෂකයින් මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් නිලධාරි තත්ත්ව පරීක්ෂාව සඳහා කැඳවනු ලැබේ. නිලධාරි තත්ත්ව පරීක්ෂාවෙන් සමත්වන්නන් වෛද්‍ය පරීක්ෂණයට (ආධුනිකයෙකු වශයෙන් බැඳීමට ප්‍රථම තෝරා ගනු ලබන සියලුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.) සුදුසුකම් ලබයි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන්හට පමණක් පියාසර යෝග්‍යතා පරීක්ෂණයට කැඳවනු ලැබේ. මෙම පරීක්ෂණයන්ගෙන් සාර්ථකව සමත්වන්නන් අවසාන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අපේක්ෂකයින්ගෙන් එම ශාඛාවන්ට අවශ්‍ය වන්නාවූ සංඛ්‍යාවන් ඔවුන් ඉහත විභාගයන්හි දී සහ සම්මුඛ පරීක්ෂණයන්හි දී දැක්වූ කුසලතා මත තෝරාගනු ලැබේ.

(ඒ) අවිවාහක නිලධාරීන්, නිලධාරී නිවස්නයේ සිටිය යුතුයි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. බැට්මන් සේවය සපයනු ලැබේ. අවිවාහක නිළධාරීන්ගේ ආහාර දීමනා හා බැට්මන් දීමනාව නිලධාරි නිවස්නයට ගෙවනු ලැබේ.

(ඔ) විවාහක නිලධාරීන් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

(ඕ) සියලුම නිළධාරීන් රාජකාරී හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

(ක) සියලුම නිලධාරීන් ගුවන් හමුදා පනත සහ වරින් වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

7. රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා .- තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

8. *වැටුප් හා දීමනා :*

*අ.* ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනික නිළධාරින්ගේ සහ අධිකාරිලත් නිලධාරින්ගේ වැටුප් ක්‍රමය පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| ඔෆිසර් කැඩෙට් | - | රු. 187,620.00 වසරකට |
| පයිලට් ඔෆිසර් | - | රු. 223,500.00 වසරකට (ශිෂ්‍ය හට) |
| පයිලට් ඔෆිසර් | - | රු. 242,700.00 වසරකට (ශිෂ්‍ය හට නොවන) |
| ප්ලයින් ඔෆිසර් | - | රු. 275,220.00 - 34 x 7,740.00 = රු. 538,380.00 වසරකට |
| ප්ලයට් ලෙප්ටිනන් | - | රු. 321,660.00 - 28 x 7,740.00 = රු. 538,380.00 වසරකට |
| ස්කොඩ්‍රන් ලීඩර් | - | රු. 352,620.00 - 24 x 7,740.00 = රු. 538,380.00 වසරකට |
| විංග් කොමාන්ඩර් | - | රු. 362,100.00 - 20 x 9,480.00 = රු. 551,700.00 වසරකට |
| ගෲප් කැප්ටන් | - | රු. 441,060.00 - 18 x 12,600.00 = රු. 667,860.00 වසරකට |

*(ආ) අනෙකුත් දීමනා*

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 7,800.00 ක් ගෙවනු ලැබේ.

(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනාව වශයෙන් මසකට රු. 250.00 ක් ගෙවනු ලැබේ.

(3) දුෂ්කර දීමනා මසකට රු. 600.00 ක් ගෙවනු ලැබේ. (දිනකට රු.20).

(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට මසකට රු. 4,400.00 ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව මසකට රු. 3,000.00 ක් ගෙවනු ලැබේ. රාජකාරි දිනකට රු. 100.00 බැගින් ගෙවනු ලැබේ.

(6) අතිරේක දීමනාව මසකට රු. 1,000.00 ක් ගෙවනු ලැබේ.

(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255.00 ක් ගෙවනු ලැබේ.

(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50 ක් ගෙවනු ලැබේ. (කඳවුරෙන් පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා).

(9) ආහාර දීමනාව මසකට රු. 16,138.20 ක් ගෙවනු ලැබේ. (දිනකට රු.537.94) කඳවුරෙන් පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා).

(10) සුදුසුකම් වේතනය අදාල පරිදි මසකට උපරිම රු. 637.50 ක් ගෙවනු ලැබේ.

(11) විශේෂ දීමනාවක් ලෙස මසකට මූලික වැටුපෙන් 20%ක මුදලක් මාසිකව ගෙවනු ලැබේ.

(12) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට, කලත්‍රයාට සහ ළමයින්ට) දෙනු ලැබේ.

(13) කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට මසකට වරක් නිලධාරී නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(14) නිල ඇඳුම් සහ ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.

(15) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයින්ට) සපයනු ලැබේ.

(16) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරීන් හට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට ගමන් කිරීම සඳහා නොමිලේ ගමන් කිරීමට බලපත්‍රයක් දෙනු ලැබේ.

(17) පියාසර දීමනාව ගෙවනු ලැබේ.

(18) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරීන්ට පහත සඳහන් පරිදි ගෙවල් කුලී දීමනාවන් හිමි වේ. පයිලට් ඔෆිසර් සිට ගෘප් කැප්ටන් සහ ඉන් ඉහළ නිලයන්ට මසකට රු.1,600.00 සිට රු. 4,250.00 දක්වා වේ.

(19) අතුරු දීමනාව රු. 10,000.00ක් ගෙවනු ලැබේ.

9. *විශ්‍රාම වැටුප් / පාරිතෝෂික දීමනා:*

වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් / පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. සියළුම නිලධාරීන් වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුව වේ.

10. *අයදුම්කරුවන්ට උපදෙස්:-*

*(අ)* පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියළුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2016 ජූනි මස 30 වැනි දින දහවල් 1200 ට ප්‍රථම ලැබෙන සේ "විධායක ආධුනිකයන් බඳවා ගැනීමේ නිලධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, ඒකල, කොටුගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ "ආධුනික ශිෂ්‍යභට නිලධාරි සඳහා ඉල්ලුම්පත නියමු පොදු රාජකාරි ශාඛාව" යනුවෙන් සටහන් කළ යුතුයි. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනයට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් භාර ගනු නොලැබේ.

*(ආ)* රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/ මණ්ඩලයේ/ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

*(ඇ)* සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය. :-

(1) උප්පැන්න සහතිකය (අධ්‍යාපන ව්‍යාවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය);

(2) අයදුම්කර ඇති ශාඛාවට අදාල අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන සහතික;

(3) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික;

(4) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතු ය;

(5) ක්‍රීඩා හා ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(ඇ) නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(ඉ) කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමඟ නොඑවිය යුතු ය.

(ඊ) අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා ඒවා නැතිවුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

11. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරාගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

12. *තෝරාගැනීම සම්මුඛ පරීක්ෂණ ආදිය :*

(අ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටීමට සිදුවන්නේය. ඉන් තෝරා ගනු ලබන අපේක්ෂකයින්, ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණ සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් හට පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ලිඛිතව දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිම වියදමක් ගෙවනු නොලැබේ.

(ඇ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු විසින් ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු ය.

(ඉ) අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීම් නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ කිරීම, අපේක්ෂකයා නුසුදුසු අයෙක් වීමට හේතු වන්නේය.

(ඊ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

ජී. පී. බුලත්සිංහල,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැපැල් පෙට්ටිය 594,
කොළඹ 02.

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ ආධුනික ශිෂ්‍යභට නිලධාරි සඳහා ඉල්ලුම්පත**

ගුවන් හමුදාවේ නියමු පොදු රාජකාරි ශාඛාව

1. පුරවැසිභාවය :——————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.)

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :——————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

4. ස්ථිර ලිපිනය :——————.

5. තැපැල් ලිපිනය:——————.

6. උපන් දිනය:——————.
වයස : ( 2016 නොවැම්බර් මස 15 දිනට)
අවුරුදු :........... මාස :............ දින :..............

7. උස: අඩි. ......... අඟල් ...........

8. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය:——————.

9. දිස්ත්‍රික්කය:——————.

10. ඡන්ද කොට්ඨාසය :——————.

11. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :——————.

12. දුරකථන අංකය:——————.

13. විවාහක හෝ අවිවාහක බව:——————.

14. ස්ත්‍රී පුරුෂ භාවය :——————.

15. අධ්‍යාපනය ලැබූ පාසල :——————.

16. පාසල් සහ/හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :

| පාසලේ/විශ්ව විද්‍යාලයේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව) |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) :<br>අ.පො.ස. (උ.පෙළ) :<br>වෙනත් : | | |

17. පාසලෙන්/විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රක්ෂා පිළිබඳ විස්තර :

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

18. මව්පියන් පිළිබඳ විස්තර ෑ

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | දැන් ලිපිනය |
|---|---|---|---|
| පියා : | | | |
| මව : | | | |

19. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම්ඃ——————.

20. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න)ඃ——————.

21. පාසලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමඟ විස්තර දක්වන්න)ඃ——————.

22. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවයඃ——————.

23. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලීම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්නඃ

24. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද? එසේ නම් විස්තර සඳහන් කරන්නඃ————

25. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්ව විද්‍යාල, රජය විසින් පාලන කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතුඃ————.

26. චරිත සහතික පිළිබඳ විස්තර ඃ

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

27. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය ඃ

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

...............................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :- ...........................

28. ඉල්ලුම්කරුගේ මව/පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය ඃ

(අ) ඉහත අයදුම්පතේ 26 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ............................................ නමැති අපේක්ෂකයාගේ මව/පියා/භාරකරු මම වෙමි.

(ආ) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරාගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමිඃ-

(1) පුහුණුව ලබන කාල සීමාව තුළදී පහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියළුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම;

(2) විෂමාචාරය නිසා නැතහොත් ඔහුටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අධිකාරියක් ලැබීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියළුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

.

............................................
දෙමව්පිය / භාරකරුගේ අත්සන.

දිනය : .............................

නම :.......................................................................
(පැහැදිලි අකුරෙන්)

ලිපිනයඃ ...........................................................................
...........................................................................

.....................................
පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

නම :.......................................................................
(පැහැදිලි අකුරෙන්)

ලිපිනයඃ ...........................................................................
...........................................................................

....................................
දෙවන සාක්ෂිකරුගේ අත්සන.

.නම :.......................................................................
(පැහැදිලි අකුරෙන්)

ලිපිනයඃ ...........................................................................
...........................................................................

* අදාළ නොවන වචන කපා හරින්න.

06-830

.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### නිලධාරි පුරප්පාඩු

1. අධිකාරියට පත්කොට බඳවා ගැනීමට පිරිමි/කාන්තා අපේක්ෂකයින් සඳහා පුරප්පාඩු පවතී.
   - (අ) කාර්මික ඉංජිනේරු ශාඛාව
   - (ආ) උපකරණ ශාඛාව
   - (ඇ) ගුවන් තොටුපළ නිර්මාණ ශාඛාව
   - (ඈ) වෛද්‍ය ශාඛාව
   - (ඉ) දන්ත වෛද්‍ය ශාඛාව
   - (ඊ) පාලන වෛද්‍ය ශාඛාව
   - (උ) පාලන පශු වෛද්‍ය ශාඛාව
   - (ඌ) පාලන කෘෂි ශාඛාව
   - (එ) පාලන තූර්යවාදක ශාඛාව

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති පිරිමි/කාන්තා අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*(අ) කාර්මික ඉංජිනේරු ශාඛාව*

කාර්මික ඉංජිනේරු නිලධාරි (ගුවන් යානා) - පිරිමි (නිත්‍ය)

* ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක සිව් (4) අවුරුදු පූර්ණ කාලීන ගුවන් යානා ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය ලබා තිබීම සමග උපාධිය ලබාගැනීමෙන් පසු ගුවන් යානා ඉංජිනේරු ක්ෂේත්‍රයේ වසර දෙකක (2) පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

* තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද මත ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් නිළයෙහි අධිකාරීලත් නිලධාරීන් ලෙස බඳවා ගනු ලැබේ.

කාර්මික ඉංජිනේරු නිලධාරි (යාන්ත්‍රික/මෝටර් රථ) - පිරිමි (නිත්‍ය)

* ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක සිව් (4) අවුරුදු පූර්ණ කාලීන යාන්ත්‍රික / මෝටර් රථ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ මොරටුව විශ්ව විද්‍යාලය මගින් පිරිනමන ලද තුන් (3) අවුරුදු පූර්ණ කාලීන යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්.ඩී.ටී.) හෝ ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ ආයතනය මගින් පිරිනමන ලද අවුරුදු තුන හමාරක (3 1/2) පූර්ණ කාලීන යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (එච්.එන්. ඩී. ඊ.) ලබා තිබීම සමග ඩිප්ලෝමාව ලබාගැනීමෙන් පසු යාන්ත්‍රික / මෝටර් රථ ඉංජිනේරු ක්ෂේත්‍රයේ වසර දෙකක (2) පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

* තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද මත ෆ්ලයින් ඔෆිසර් හෝ ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් නිලයෙහි අධිකාරිලත් නිලධාරීන් ලෙස බඳවා ගනු ලැබේ.

*(ආ) උපකරණ ශාඛාව*

භෝජනාගාර කළමණාකරු - පිරිමි (නිත්‍ය)

* හෝටල් කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම හෝ දේශීය / විදේශීය පිළිගත් ආයතනයක හදාරන ලද කාණ්ඩ 4 කින් සමන්විත පූර්ණකාලීන ආගන්තුක සත්කාර පිළිබඳ මූලික, මධ්‍යම සහ උසස් පාඨමාලාවක් හදාරා තිබීම හා තරු පංති හෝටලයක ආහාරපාන අංශයේ භෝජනාගාර හා ආහාර කළමණාකරණය පිළිබඳව ඉහත සුදුසුකම්වලින් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (2) පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

ඇඟළුම් තාක්‍ෂණික නිලධාරි - පිරිමි (නිත්‍ය)

* තාක්‍ෂණික හෝ ඉංජිනේරු විද්‍යාව සඳහා වූ විද්‍යාවේදී උපාධිය ලබා තිබීම, ඇඟළුම් සහ රෙදිපිළි තාක්‍ෂණය සඳහා වූ පශ්චාත් උපාධිය ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකන අතර ඇඟළුම් ක්ෂේත්‍රයේ අවුරුදු පහක (5) සේවා පළපුරුද්ද සහ අවම වශයෙන් අවුරුදු තුනක් (3) පුහුණුකරුවෙකු හෝ උපදේශකයෙකු ලෙස ඇඟළුම් හා රෙදිපිළි නිෂ්පාදන වැඩි දියුණු කිරීම්, වෙළෙඳ භාණ්ඩ සහ වැඩ අධ්‍යයනය සම්බන්ධ ක්ෂේත්‍රයේ සේවය කර තිබීම; හෝ

* ශ්‍රී ලංකා ඇඟළුම් ආයතනයෙන් හෝ පිළිගත් ඇඟළුම් ආයතනයකින් රෙදිපිළි හා ඇඟළුම් සම්බන්ධව ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ ඇඟළුම් සහ රෙදිපිළි තාක්‍ෂණය පිළිබඳව අවම වශයෙන් වසර දෙකක (2) සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතු ය.

(2016 නොවැම්බර් මස 15 වැනි දිනට උපාධිලාභීන් වයස අවුරුදු 33ට වඩා වැඩි නොවිය යුතු අතර ඩිප්ලෝමාලාභින් වයස අවුරුදු 26 ට වඩා වැඩි නොවිය යුතු ය.)

* තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද මත ෆ්ලයින් ඔෆිසර් හෝ ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් නිලයෙහි අධිකාරිලත් නිලධාරීන් ලෙස බඳවා ගනු ලැබේ.

*(ඇ) ගුවන් තොටුපළ නිර්මාණ ශාඛාව*

ගොඩනැගිලි සේවා ඉංජිනේරු නිලධාරින් - පිරිමි (නිත්‍ය/ස්වේච්ඡා)

* *තාවකාලික ස්කොඩ්‍රන් ලීඩර් .–* සිවිල් / යාන්ත්‍රික / විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂිත වූ විද්‍යාවේදී උපාධිය (ගොඩනැගිලි සේවා ඉංජිනේරු) සමග ශ්‍රී ලංකා වරලත් ඉංජිනේරු ආයතනයේ : [IE (SL) Charter Qualification] පූර්ණ සාමාජිකත්වය ලබා තිබිය යුතු ය.

* *ප්ලයිට් ලෙප්ටිනන්ට් .–* සිවිල්/යාන්ත්‍රික/විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂිත වූ විද්‍යාවේදී උපාධිය සමග විද්‍යාපති (ගොඩනැගිලි සේවා ඉංජිනේරු) උපාධිය ලබා තිබීම.

සිවිල් / කාර්මික / විදුලි ඉංජිනේරුවන් - පිරිමි (නිත්‍ය / ස්වේච්ඡා)

* *ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් .–* සිවිල් / යාන්ත්‍රික / විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂිත වූ විද්‍යාවේ දී උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම.

* *ෆ්ලයින් ඔෆිසර් .–* සිවිල් / යාන්ත්‍රික / විදුලි ඉංජිනේරු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්.ඩී.ටී.) / ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (එන්.ඩී.ඊ. එස්.) / උසස් ජාතික ඩිප්ලෝමාව (එච්. එන්.ඩී.ඊ.) හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබිය යුතු අතර ඩිප්ලෝමා සුදුසුකම්වලින් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර තුනකට (3) නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

* *පයිලට් ඔෆිසර් .–* සිවිල් / යාන්ත්‍රික / විදුලි ඉංජිනේරු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්.ඩී.ටී.) / ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (එන්.ඩී.ඊ.එස්.) / උසස් ජාතික ඩිප්ලෝමාව (එච්. එන්. ඩී.ඊ.) හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබිය යුතු අතර ඩිප්ලෝමා සුදුසුකම්වලින් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර තුනකට (3) නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

ප්‍රමාණ සමීක්ෂක නිළධාරින් - පිරිමි / කාන්තා (ස්වේච්ඡා)

* *ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් .–* මොරටුව විශ්ව විද්‍යාලය මගින් පිරිනමන ලද BSc in (QS) උපාධිය හෝ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයින්ගේ ආයතනයේ සාමාජිකත්වය (Graduate Member) සමග සාමාජිකත්වයෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ තනතුර පිළිබඳව වසර දෙකක (2) පළපුරුද්දක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයින්ගේ ආයතනයේ සාමාජිකත්වය (Technical Member) ලබා තිබීම සමග සාමාජිකත්වයෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ තනතුර පිළිබඳව වසර තුනක (3) පලපුරුද්දක් ලබා තිබීම.

* *ෆ්ලයින් ඔෆිසර් .–* ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයින්ගේ ආයතනයේ සාමාජිකත්වය (Technical Member) ලබා තිබීම හෝ රත්මලාන UNIVOTEC ආයතනයේ සම්පූර්ණයෙන් නිමකරන ලද ප්‍රමාණ සමීක්ෂක ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම සමග ඩිප්ලෝමා සුදුසුකම්වලින් පසුව අදාළ ක්ෂේත්‍රයේ තනතුර පිළිබඳව වසර දෙකක (2) පලපුරුද්දක් ලබා තිබීම.

මිනින්දෝරුවන් - පිරිමි (නිත්‍ය / ස්වේච්ඡා)

* *ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් .–* සබරගමුව විශ්ව විද්‍යාලය මගින් පිරිනමන ලද මිනින්දෝරු විද්‍යාවේදී උපාධිය හෝ දියතලාව මිණුම් සහ සිතියම් ගත කිරීමේ ආයතනයෙන් පිරිනමන ලද උපාධිය ලබා තිබීම.

* *ෆ්ලයින් ඔෆිසර් .–* දියතලාව මිණුම් සහ සිතියම් ගත කිරීමේ ආයතනයෙන් පරිනමන ලද මිනින්දෝරු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

ඈ. වෛද්‍ය ශාඛාව

වෛද්‍ය නිළධාරින් - පිරිමි / කාන්තා (නිත්‍ය / ස්වේච්ඡා)

* *ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් .–* පිළිගත් විශ්ව විද්‍යාලයක වෛද්‍ය (එම්. බී. බී. එස්) උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සහ වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබිය යුතුය.

පූර්ව සීමාවාසික වෛද්‍ය උපාධිලාභීන් - පිරිමි / කාන්තා (නිත්‍ය)

* MBBS (ශ්‍රී ලංකා) හෝ විදේශ වෛද්‍ය විද්‍යාලයකින් සමත්වූ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත හැකි MBBS (ශ්‍රී ලංකා) උපාධියට සමාන වෛද්‍ය උපාධියක් අනිවාර්යයෙන්ම ලබා තිබිය යුතු ය. සුදුසුකම් ඇති තෝරාගත් අයදුම්කරුවන් නිත්‍ය අධිකාරිලත් නිළධාරීන් ලෙස බඳවාගනු ලැබේ. බඳවාගත් දින සිට අවුරුදු පහක් (5) ඇතුළත ERPM විභාගය සමත් වී ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථිර ලියාපදිංචිය ලබා ගත යුතු ය.

* තෝරාගනු ලබන අයදුම්කරුවන් ෆ්ලයින් ඔෆිසර් නිළයෙහි අධිකාරිලත් නිළධාරින් ලෙස බඳවා ගනු ලබන අතර ERPM විභාගය සමත්වී ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථිර ලියාපදිංචියෙන් පසු ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් නිළය ලබා දීම පිළිබඳව සලකා බලනු ලැබේ.

ඉ. දන්ත වෛද්‍ය ශාඛාව

දන්ත වෛද්‍ය නිළධාරි - පිරිමි (නිත්‍ය / ස්වේච්ඡා)

* *ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් .–* පිළිගත් විශ්ව විද්‍යාලයක දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධිය හෝ ඒ හා සාමාන සුදුසුකම් තිබීම සහ වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබිය යුතු ය.

දන්ත වෛද්‍ය ශිෂ්‍ය - පිරිමි (නිත්‍ය)

* *ෆ්ලයින් ඔෆිසර් .–* අවසාන බී. ඩී. එස්. පළමු කොටස සම්පූර්ණ කර දැනට අවසන් වසරේ දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධිය සඳහා ඉගෙනුම ලබන සිසුන්හට මේ සඳහා අයදුම් කළ හැක.
* *පයිලට් ඔෆිසර් .–* බී. ඩී. එස්. දෙවෙනි කොටස සම්පූර්ණ කර දැනට තුන්වන වසරේ දන්ත වෛද්‍ය (බී.ඩී.එස්.) උපාධිය සඳහා ඉගෙනුම ලබන සිසුන්හට මේ සඳහා අයදුම් කළ හැක.

සැලකිය යුතුයි :

(1) තෝරාගනු ලබන දන්ත වෛද්‍ය ශිෂ්‍ය අයදුම්කරුවන් ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් නිළයෙහි ස්ථිර අධිකාරියට පත් කරනු ලැබූ දින සිට වසර දහයක (10) අනිවාර්ය සේවයකට යටත් කරනු ලැබේ.

(2) තෝරාගනු ලබන දන්ත වෛද්‍ය සිසුන් අවසන් වසර සම්පූර්ණ කරන තුරු ගුවන් හමුදාවෙන් නිදහස් කරනු ලැබේ. දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු සහ වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වීමෙන් අනතුරුව ඔවුන් ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් නිළයෙහි ස්ථිර අධිකාරියට පත් කරනු ලැබේ.

(3) පශ්චාත් උපාධි අධ්‍යාපන කටයුතු සඳහා සේවා අවශ්‍යතාවයන් මත අවස්ථාවක් දෙනු ලැබේ.

(4) දන්ත වෛද්‍ය සිසුන් තම විශ්ව විද්‍යාලයේ අධ්‍යයන වසර තහවුරු කර ගත හැකි ලියවිල්ලක් අයදුම්පත සමග එවිය යුතු ය.

ඊ. පාලන වෛද්‍ය ශාඛාව

මනෝ වෛද්‍යවරුන් - පිරිමි (නිත්‍ය / ස්වේච්ඡා)

* ෆ්ලයින් ඔෆිසර් .– පිළිගත් විශ්ව විද්‍යාලයක මනෝ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් හෝ මනෝ විද්‍යාව විෂයක් ලෙස ඇතුළත් වූ විද්‍යාවේදී උපාධියක් ලබා තිබිය යුතුය.

උ. පාලන පශු වෛද්‍ය ශාඛාව

පශු වෛද්‍ය නිළධාරී - පිරිමි/කාන්තා (නිත්‍ය / ස්වේච්ඡා)

* ෆ්ලයිට් ලෙප්ටිනන්ට් වසර හතරක පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධිය හෝ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඒ හා සමාන උපාධියක් ලබා තිබීම අනිවාර්‍ය වන අතර සේවා පලපුරුද්ද අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

ඌ. පාලන කෘෂි ශාඛාව

කෘෂි නිළධාරී - පිරිමි (නිත්‍ය )

* ෆ්ලයිට් ලෙප්ටිනන්ට් .– විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් කෘෂි විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම.

එ. පාලන තූර්ය වාදක ශාඛාව

තූර්ය වාදක නිලධාරී - පිරිමි (නිත්‍ය)

* එක් වතාවක දී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ඇතුළත්ව අවම වශයෙන් සම්මාන 04 ක් සහ සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව විෂයන් 06 කින් සමත්ව තිබීම; සහ

* ලන්ඩන් රාජකීය සංගීත විද්‍යාලයේ/ ට්‍රිනිටි විද්‍යාලයේ පස්වැනි ශ්‍රේණිය දක්වා හෝ එයට වැඩි හෝ එයට සමාන සුදුසුකම් ලබා තිබීම.

* තූර්ය වාදක කණ්ඩායම පුහුණු කිරීමේ සහ වාදක සමූහයක් විසින් වාදනය කල හැකි සේ සංගීත ප්‍රස්ථාරයන් සකස් කිරීමට ඇති හැකියාව සහ අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් සංගීත විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

* පෙරදිග සහ අපරදිග සංගීත භාණ්ඩ වාදනය කිරීමේ හැකියාව මෙන්ම ස්වර ඥානය තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

* තෝරාගනු ලබන අයදුම්කරුවන් පයිලට් ඔෆිසර් නිළයෙහි අධිකාරි ලත් නිළධාරීන් ලෙස බඳවා ගනු ලැබේ.

3. අනෙකුත් සුදුසුකම්:-

(අ) පුරවැසි භාවය : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ආ) සිවිල් තත්වය : විවාහක / අවිවාහක.

(ඇ) ස්ත්‍රී පුරුෂ භාවයඃ පිරිමි / කාන්තා (අදාළ පරිදි).

(ඈ) වයස : 2016 නොවැම්බර් මස 15 වැනි දිනට .

(1) කාර්මික ඉංජිනේරු ශාඛාව,
උපකරණ ශාඛාව (භෝජනාගාර කළමණාකරුවන්)
සහ දන්ත වෛද්‍ය ශිෂ්‍යයන් : අවුරුදු 18 සිට 30 දක්වා

(2) ගුවන් තොටුපළ නිර්මාණ ශාඛාව,
වෛද්‍ය ශාඛාව, පාලන වෛද්‍ය ශාඛාව,
දන්ත වෛද්‍ය (උපාධිලාභීන්)
පාලන පශු වෛද්‍ය ශාඛාව,
පාලන කෘෂි ශාඛාව සහ
පාලන තූර්ය වාදක ශාඛාව : අවුරුදු 18 සිට 35 දක්වා

(ඉ) උස :-
පිරිමි - අඩි 5 අඟල් 6 ක් හෝ ඊට වැඩි විය යුතු ය. (වෛද්‍ය, පාලන වෛද්‍ය සහ දන්ත වෛද්‍ය පිරිමි- අඩි 5 අඟල් 5 ක් හෝ ඊට වැඩි විය යුතු ය.)

කාන්තා - අඩි 5 අඟල් 4 ක් හෝ ඊට වැඩි විය යුතු ය. (වෛද්‍ය, පාලන වෛද්‍ය සහ දන්ත වෛද්‍ය කාන්තා අඩි 5 අඟල් 3 ක් හෝ ඊට වැඩි විය යුතු ය.)

(ඊ) බර :- 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 (පිරිමි)
17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 (කාන්තා)

$$\text{BMI} = \frac{\text{බර (කි.ග්‍රෑ)}}{\text{උස}^2\text{ (මී.)}}$$

(උ) පපුව :- අඟල් 32, ට නොඅඩු විය යුතුයි. (පිරිමි)

(ඌ) වර්ණ දෘෂ්ටීයඃ- සීපී2

එ. දෘෂ්ටි තීක්ෂණත්වය :- වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් රහිතව)

(වෛද්‍ය, පාලන වෛද්‍ය සහ දන්ත වෛද්‍ය ශාඛා අපේක්ෂකයින් උපැස් රහිතව ඇස්වල දෘෂ්ටි තීක්ෂණත්වය 6/18 තෙක් වන අයෙක් නම්, එය උපැස් සහිතව 6/6 තත්වයට තිබීම අනිවාර්ය වේ).

4. යම් අයදුම්කරුවෙකුගේ උස / බර නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඔහු / ඇය ගැන සලකා බලනු ලැබේ.

5. ගුවන් හමුදාධිපතිවරයා විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් වීමට හැකි ආකාරයට මනා සෞඛ්‍ය තත්වයකින් සිටිය යුතු ය.

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්ථමාන විශිෂ්ඨ දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. රාජ්‍ය භාෂා අවශ්‍යතා .– තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පවත්නා, පනවා ඇති සහ මතු පනවනු ලබන්නාවූ ද ව්‍යවස්ථා පිළිපැදිය යුතු ය.

8. තෝරාගනු ලබන අපේක්ෂකයින්ට ඔවුන්ගේ සුදුසුකම් හා පලපුරුද්ද අනුව ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර්/ ෆ්ලයින් ඔෆිසර් / ෆ්ලයිට් ලෙප්ටිනන්ට් / ස්කොඩ්‍රන් ලීඩර් යන නිළයන්හි නිත්‍ය / ස්වේච්ඡා අධිකාරියට පත් කරනු ලැබේ.

9. තෝරා ගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලැබිය හැකි ස්ථානයක දී පුහුණුවක් ලැබිය යුතු ය. පුහුණුවන අවස්ථාවේ දී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිළධාරියෙකුට නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්ථා කරනු ලැබුවහොත් එම නිළධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ / හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසිවලට අනුකූලව වෙන යම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත් වීමට හෝ බැඳී සිටින්නේ ය.

10. විටින් විට පනවනු ලබන ගුවන් හමුදා නියෝග අනුව ගුවන් හමුදා නිළධාරීන් පාලනය කරනු ලැබේ.

11. 1951 අප්‍රේල් මස 27 වැනි දින අංක 10,240 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිළධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. සුදුසුකම් අනුව පයිලට් ඔෆිසර් හෝ උසස් නිළයක නිත්‍ය / ස්වේච්ඡා අධිකාරියක් පිරිනමනු ලැබේ. ගුවන් හමුදා පනතේ 10 වන වගන්තිය අනුව "සෑම නිළධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක" කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිළධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ 11 වන වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප / ගිවිසුම් බැඳී ඇත්නම් පුහුණු කාලය සහ පාඨමාලාවන් හදාරන්නේනම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුදා පනතේ 11 වන වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදාවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත රෙගුලාසිවලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකි වේ.

12. ගුවන් හමුදා නිළධාරීන් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ කවර තැනකට වුව ද යවනු ලැබීමට යටත් වේ.

13. අවිවාහක නිළධාරීන්, නිළධාරි නිවස්නයේ වාසය කල යුතු ය. ගෘහ භාණ්ඩ, නාවාතැන් පහසුකම් හා අහාරපාන ඔහුට / ඇයට සපයනු ලැබේ. බැට්මන් සේවය ද සපයනු ලැබේ. අවිවාහක නිළධාරීන්ගේ ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

14. විවාහක නිළධාරීන්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිළධාරීන් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 15 (ඇ) (17) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

15. අ. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරිලත් නිළධාරීන්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ.

පයිලට් ඔෆිසර් = රු. 242,700.00 වසරකට
ෆ්ලයින් ඔෆිසර් - රු. 275,220.00-34 x 7,740.00
= රු. 538,380.00 වසරකට
ෆ්ලයිට් ලෙප්ටිනන්ට් - රු. 321,660.00-28 x 7,740.00
= රු. 538,380.00 වසරකට
ස්කොඩ්‍රන් ලීඩර් - රු. 352,620.00-24 x 7,740.00
= රු. 538,380.00 වසරකට
විංග් කමාන්ඩර් - රු. 362,100.00-20 x 9,480.00
= රු. 551,700.00 වසරකට
ගෲප් කැප්ටන් - රු. 441,060.00-18 x 12,600.00
= රු. 667,860.00 වසරකට

*ආ. වෛද්‍ය නිළධාරීන්ගේ වැටුප්*

ප්‍රාථමික ශ්‍රේණිය - රු. 313,920.00 - 2 x 7,740.00
= රු.. 329,400.00 වසරකට
2 වන ශ්‍රේණිය - රු. 337,140.00 - 8 x 7,800.00
= රු.. 399,540.00 වසරකට
1 වන ශ්‍රේණිය - රු. 412,140.00 - 15 x 12,600.00
= රු. 601,140.00 වසරකට
විශේෂ ශ්‍රේණිය - රු. 508,680.00 - 12 x 15,720.00
= රු. 697,320.00 වසරකට

*ඇ. දන්ත වෛද්‍ය නිළධාරීන්ගේ වැටුප්*

ප්‍රාථමික ශ්‍රේණිය - රු. 306,180.00 - 3 x 7,740.00
= රු. 329,400.00 වසරකට
2 වන ශ්‍රේණිය - රු. 337,140.00 - 8 x 7,800.00
= රු. 399,540.00 වසරකට

1 වන ශ්‍රේණිය - රු. 412,140.00 - 15 x 12,600.00
= රු. 601,140.00 වසරකට
දන්ත ශල්‍ය වෛද්‍ය- රු. 508,680.00- 12 x 15,720.00
= රු. 697,320.00 වසරකට

ඈ. අනෙකුත් දීමනා දන්ත වෛද්‍ය ශාඛාවේ නිලධාරීන් සඳහා-

(1) විශ්‍රාම හිමි වැටුප් දීමනා:

| | |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - රු. 1,700.00 (මසකට) |
| 2 වන ශ්‍රේණිය | - රු. 1,700.00 (මසකට) |
| 1 වන ශ්‍රේණිය | - රු. 3,400.00 (මසකට) |
| විශේෂ ශ්‍රේණිය | - රු. 3,400.00 (මසකට) |

(2) විශ්‍රාම වැටුප් රහිත දීමනා:

| | |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - රු. 2,125.00 (මසකට) |
| 2 වන ශ්‍රේණිය | - රු. 1,700.00 (මසකට) |
| 1 වන ශ්‍රේණිය | - රු. 400.00 (මසකට) |

(3) විවේක කාල රාජකාරි බාධා,
ප්‍රවාහන හා පැමිණ සිටීමේ දීමනාව - රු. 35,000.00 (මසකට)

(4) අතිරේක රාජකාරී දීමනාව :

| | |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - රු. 335.00 (පැයකට) |
| 2 වන ශ්‍රේණිය | - රු. 383.00 (පැයකට) |
| 1 වන ශ්‍රේණිය | - රු. 528.00 (පැයකට) |
| විශේෂ ශ්‍රේණිය | - රු. 628.00 (පැයකට) |

(5) භාෂා ප්‍රවීනතා දීමනාව:

| | |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - රු. 795.00 (පැයකට) |
| 2 වන ශ්‍රේණිය | - රු. 800.00 (පැයකට) |
| 1 වන ශ්‍රේණිය | - රු. 1,200.00 (පැයකට) |
| විශේෂ ශ්‍රේණිය | - රු. 1,450.00 (පැයකට) |

(6) (15) (ඉ) ඡේදයේ දැක්වෙන සේවා දීමනා අදාළ පරිදි අමතරව ගණනය කරනු ලැබේ.

ඉ. අනෙකුත් දීමනා :

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 7,800.00 ක් ගෙවනු ලැබේ.

(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250.00 ක් ගෙවනු ලැබේ.

(3) දුෂ්කර දීමනා දිනකට රු. 20.00 ක් ගෙවනු ලැබේ.

(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට අමතර දුෂ්කර දීමනා මසකට රු. 4,380.00 ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව (1) මසකට රු. 3,000.00 ක් ගෙවනු ලැබේ. (දිනකට රු. 100.00 බැගින් ගෙවනු ලැබේ. )

(6) අතිරේක දීමනාව මසකට රු. 1,000.00 ගෙවනු ලැබේ.

(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255.00 ක් ගෙවනු ලැබේ.

(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50 ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබුවන් සඳහා )

(9) ආහාර දීමනාව මසකට රු. 16,138.20 ක් ගෙවනු ලැබේ. (දිනකට රු. 537.20 පිටත වාසය කිරීමට අවසර ලැබුවන් සඳහා )

(10) සුදුසුකම් වේතනය අදාළ පරිදි (මසකට උපරිමය රු. 637.50 ක්) ගෙවනු ලැබේ.

(11) විශේෂ දීමනාව (2) ලෙස මසකට මූලික වැටුපෙන් 20% මුදලක් ගෙවනු ලැබේ.

(12) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට / බිරිඳ / සහ දරුවන්ට) දෙනු ලැබේ.

(13) කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට මසකට වරක් නිලධාරී නිවස්නයේ සිට තම නිවාසයට යෑම සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍රයක්, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(14) නිල ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.

(15) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයන්ට අදාළ පරිදි)

(16) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරීන්ට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා මධ්‍යම ගමනා ගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.

(17) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරීන් හට පහත සඳහන් පරිදි නිවාස කුලී දිමනාවක් හිමිවේ. පයිලට් ඔෆිසර් සිට ග්‍රෲප් කැප්ටන් සහ ඊට ඉහළ නිලයන් සඳහා මසකට - රු. 1,600.00 සිට රු. 4,250.00 දක්වා.

(18) සේවා දීමනා මාසිකව රු. 300.00, රු.400.00, රු. 500.00 සුදුසු පරිදි වේ. (සම්පූර්ණ කරන ලද සේවා කාලයන්ට අනුව දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)

(19) අමතර සේවා දීමනා මසකට රු. 1500.00 (වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)

(20) 1/20 දීමනාව මසකට - මූලික වැටුප X 1/20 X උපරිම දින 3 ( වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)

(21) අමතර රාජකාරී ගෙවීම් මසකට - උපරිම පැය 120 ( වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)

(22) අතුරු දීමනාව මසකට රු. 10,000.00 ක්

(23) දුරකථන බිල් දීමනාව

| | |
|---|---|
| විංග් කමාන්ඩර් | - රු. 2,500.00 (මසකට) |
| ගෲප් කැප්ටන් | - රු. 4,000.00 (මසකට) |
| විශේෂඥ වෛද්‍ය නිලධාරි | - රු. 8,000.00 (මසකට) |
| වෛද්‍ය නිලධාරි | - රු. 4,000.00 (මසකට) |

(24) ඉංජිනේරු දීමනාව මසකට රු. 15,000.00 ක් (ඉංජිනේරු නිළධාරින් සඳහා පමණයි)

(25) පශු වෛද්‍ය දීමනාව මසකට රු. 7,500.00 ක් ( පශු වෛද්‍ය නිලධාරින් සඳහා පමණයි)

16. *විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා* :- විටින් විට සංශෝධනය කරනු ලැබූ සහ 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියළුම නිලධාරින් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුවය.

17. ඉල්ලුම්කරුවන්ට උපදෙස්

අ. පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියළුම කොටු හැකි පමණ විස්තර හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතු ය. ඉල්ලුම්පත් 2016 ජුනි මස 30 වන දින මධ්‍යහ්න 1200 ට හෝ ඊට පෙර ලැබෙන සේ "විධායක අධුනිකයින් බඳවා ගැනීමේ නිළධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, ඒකල, කොටුගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ ."......... ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් විය යුතු ය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

ආ. රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. යම් හෙයකින් අයදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම් දිය යුතු ය.

ඇ. ඉල්ලුම්පත් සමඟ අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකපත්වල පිටපත් ඉදිරිපත් කළ යුතු යː-

(1) උප්පැන්න සහතිකය;
(2) ලබා ඇති උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික;
(3) ඉල්ලුම්කරු පෞද්ගලිකව දන්නා වගකිව යුතු පුද්ගලයන් යටත් පිරිසෙයින් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික;
(4) ක්‍රීඩා, ශිෂ්‍යභට පුහුණු ආදී සනාථ කරන සහතික;
(5) ඉල්ලුම්පතේ යම් යම් හිමිකම් කර ඇතොත් ඒවා සනාථ කරන සහතික.

* *සැලකිය යුතුයි* :- මෙම සහතිකවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබුවහොත් ඒ අවස්ථාවේදී පමණි.

18. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේනම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අහිමිවීමටද, තෝරා ගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වේ.

19. *තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය* :-

(අ) ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

(ඇ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) අවසාන සම්මුඛ පරීක්ෂණයට සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු ය.

(ඉ) අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහුට/ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

(ඊ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

ජී. පී. බුලත්සිංහල,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ 02.

ශ්‍රී ලංකා නිත්‍ය / ස්වේච්ඡා ගුවන් හමුදාවේ——————
ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත

1. පුරවැසිභාවයඃ——————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.)

2. සම්පූර්ණ නම : (ජාතික හැඳුනුම්පතට අනුව)ඃ—————.

3. ජාතික හැඳුනුම්පත් අංකයඃ——————.

4. ඉල්ලුම් කරන ශාඛාවඃ——————.

5. ඉල්ලුම් කරන තනතුර ඃ——————.

6. ස්ථිර ලිපිනය ඃ——————.

7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානයඃ——————.

8. තැපැල් ලිපිනයඃ——————.

9. විද්‍යුත් ලිපිනයඃ——————.

10. උපන් දිනයඃ——————.

11. උස ඃ අඩි......... අඟල් ...........

12. දිස්ත්‍රික්කය ඃ——————.

13. ඡන්ද කොට්ඨාසයඃ——————.

14. ග්‍රාම සේවක කොට්ඨාසය සහ අංකයඃ—————.

15. දුරකථන අංකයඃ——————.

16. විවාහක හෝ අවිවාහක බව ඃ——————.

17. අධ්‍යාපනය ලැබූ පාසලඃ——————.

18. පාසල් සහ/හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තරඃ—————.

| පාසලේ/විශ්ව විද්‍යාලයේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව) |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ)<br>අ.පො.ස. (උ.පෙළ)<br>වෘත්තීය සුදුසුකම්<br>වෙනත් | | |

19. පාසලෙන් /විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර ඃ

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

20. මව්පියන් පිළිබඳ විස්තර ඃ

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | දැනට ලිපිනය |
|---|---|---|---|
| පියා ඃ | | | |
| මව ඃ | | | |

21. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් ඃ——————.

22. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර : (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.)ඃ——————.

23. පාසලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා ( දිනයන් සමග විස්තර දක්වන්න.)ඃ——————.

24. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවයඃ——————.

25. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීන් පෙර ඉල්ලීම් කර තිබේ ද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න ඃ———.

26. සිවිල් හෝ යුද්ධ උසාවියක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද? එසේ නම් විස්තර සඳහන් කරන්නඃ——————.

27. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි / මණ්ඩලයක / සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්ව විද්‍යාල, රජය විසින් පාලන කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු ඃ——————.

28. චරිත සහතික පිළිබඳ විස්තර ඃ

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

29. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය ඃ

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළවන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

..............................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය ඃ............................

06-831

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### නිත්‍ය ගුවන් භට / ගුවන් කාන්තා / ස්වේච්ඡා ගුවන් භට වෘත්තීය පුරප්පාඩු සහ ස්වේච්ඡා ගුවන් භට / ගුවන් කාන්තාවන් ඉදුරාම බඳවා ගැනීම සඳහා පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ පහත සඳහන් වෘත්තීන්ට අදාළව ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු පවතී.

1. අ. වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්:

(1) සැපයුම් වෘත්තීන් :

*(අ) සැපයුම් සහයක (පිරිමි)*

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය / විද්‍යාව / ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිගණක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

*(ආ) භෝජනාගාර සහයක (පිරිමි / කාන්තා)*

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඉංග්‍රීසි භාෂාව භාවිතා කිරීමේ හැකියාවක් ඇති අයවළුන් සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දෙනු ලැබේ. ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා සමත් සහතිකයක් ලබා තිබීම සහ සංචාරක මණ්ඩලයේ අනුමැතිය ලත් හෝ පිළිගත් ප්‍රසිද්ධ හෝටලයක භෝජනාගාර සේවක, බීමහල් සේවක, කාමර සහයක යන අංශයන්ගෙන් සේවා පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ. (වැඩිදුර උසස් පුහුණුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බඳවා ගැනීමෙන් පසුව ප්‍රසිද්ධ හෝටල් ආශ්‍රයෙන් ලබා දෙනු ලැබේ.)

*(ඇ) සලාක සහයක (පිරිමි)*

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා ඇති අයවළුන්හට ප්‍රමුඛස්ථානයක් ලබා දෙනු ලැබේ.

ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත සඳහන් වෘත්තීන්ට අදාළව ගුවන් භටයින් සඳහා පුරප්පාඩු පවතී.

2. (අ) වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්:

(1) සිවිල් ඉංජිනේරු වෘත්තීන් (පිරිමි)

- *(අ)* ඉදිකිරීම් යන්ත්‍ර ශිල්පී,
- *(ආ)* දැව කාර්මික ශිල්පී (වඩු),
- *(ඇ)* ඉදිකිරීම් කාර්මික ශිල්පී (මේසන්),
- *(ඈ)* කම්මල් හා පෑස්සුම්කරු,
- *(ඉ)* විදුලි කාර්මික ශිල්පී,
- *(ඊ)* යාන්ත්‍රික කාර්මික ශිල්පී,
- *(උ)* ජලනල කාර්මික ශිල්පී,
- *(ඌ)* වායුසමීකරණ හා ශීතකරණ ශිල්පී.

අවම වශයෙන් 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්විය යුතු අතර, අදාළ ක්ෂේත්‍රයේ මාස තුනකට (3) නොඅඩු පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම හෝ වෘත්තියට අදාළව වසරකට නොඅඩු පළපුරුද්දක් සනාථ කරන සහතිකයක් ලබා තිබීම.

යාන්ත්‍රික කාර්මික ශිල්පී තනතුර සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යන්ත්‍ර හා උපකරණ අළුත්වැඩියා කටයුතු පිළිබඳ කාර්මික දැනුම හා පළපුරුද්ද ඇති අයවළුන්ට ද, ඉදිකිරීම් යන්ත්‍ර ශිල්පී තනතුර සඳහා ජෙනරේටර්, වතුර පොම්ප, කොන්ක්‍රීට් මිශ්‍රණ වැනි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අදාළ යන්ත්‍ර සූත්‍ර නඩත්තු කටයුතු පිළිබඳ දැනුම හා පළපුරුද්ද ඇති අයවළුන් හටද සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය හැක.

ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවේ ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් සඳහා පහත සඳහන් වෘත්තීන්ට අදාළව ඉදුරාම බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පවතී.

3. *(අ)* වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්:

(1) සිවිල් ඉංජිනේරු වෘත්තීන්

*(අ) ප්‍රමාණ සමීක්ෂක සහායක - (පිරිමි / කාන්තා)*

ජාතික තාක්ෂණික සහතිකය පරිමාණ හා මිනුම් (NCT Q/S) පූර්ණ කාලීන එක් අවුරුදු හෝ අර්ධ කාලීන තුන් අවුරුදු පාඨමාලාව සමත් සහතිකයක් ලබා ඇති අය සඳහා නායක ගුවන් භට / නායක ගුවන් කාන්තා නිළය ද ඉහත සුදුසුකම ලැබීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රමාණ බිල්පත් සැකසීම, ටෙන්ඩර් ලියවිලි සැකසීම, ටෙන්ඩර්පත් ඇගයීම, කොන්ත්‍රාත් බිල්පත් සැකසීම සඳහා වසර 3 ක පළපුරුද්දක් ඇති අයවළුන් සඳහා කෝප්‍රල් නිලය ද පිරිනැමේ.

*(ආ) සැලසුම් ශිල්පී - (පිරිමි / කාන්තා)*

ජාතික තාක්ෂණික සහතිකය ඉංජිනේරු සැලසුම් ශිල්පී (National Engineering Draughtsmanship) පූර්ණ කාලීන එක් අවුරුදු පාඨමාලාව සමත් සහතිකයක් ලබා ඇති අය සඳහා නායක ගුවන් භට / නායක ගුවන් කාන්තා නිලය ද සැලසුම් ශිල්පියෙකු වශයෙන් ඉහත සුදුසුකම ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 3 ක පළපුරුද්දක් ඇති අය සඳහා කෝප්‍රල් නිලය ද පිරිනැමේ.

*(ඇ) වැඩ මූලික (සිවිල්/විදුලි/යාන්ත්‍රික) - (පිරිමි)*

ජාතික තාක්ෂණික සහතිකය NCT (Civil /Electrical/ Mechanical Engineering)- අර්ධ කාලීන තුන් අවුරුදු

පාඨමාලාව හෝ රජයේ වෙනත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද ඊට සමාන සුදුසුකම් ඇති පාඨමාලාවක් සමත් සහතිකයක් සහ වසර 3 ක පළපුරුද්දක් ඇති අයවළුන් සඳහා කෝප්‍රල් නිලය සහ අදාළ ක්ෂේත්‍රයේ වසර 3 ට අඩු පලපුරුද්ද ඇති අයවළුන්හට නායක ගුවන් භට නිලය පිරිනැමේ.

4. අනෙකුත් සුදුසුකම් :

(අ) ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය / ස්වේච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින් / අපේක්ෂිකාවන් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුයි.

(1) පුරවැසිභාවය : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි,

(2) වයස : 2016 ජූලි මස 15 දිනට
අවුරුදු 18ත් 23ත් අතර (නිත්‍ය පිරිමි)
අවුරුදු 18ත් 22ත් අතර (නිත්‍ය කාන්තා)

*සිවිල් ඉංජිනේරු වෘත්තීන් සඳහා*
අවුරුදු 18ත් 35ත් අතර (ස්වේච්ඡා පිරිමි)
අවුරුදු 18ත් 25ත් අතර (ස්වේච්ඡා කාන්තා)

(3) උස : අඩි 5 අඟල් 5 ට නොඅඩු විය යුතුයි. (පිරිමි)
: අඩි 5 අඟල් 3 ට නොඅඩු විය යුතුයි. (කාන්තා)

*සිවිල් ඉංජිනේරු වෘත්තීන් සඳහා*
අඩි 5 ට නොඅඩු විය යුතුයි. (ස්වේච්ඡා පිරිමි / කාන්තා)

(4) බර : 17 $<$ ශරීර ස්කන්ධ දර්ශකය $<$ 26 (පිරිමි)
: 17 $<$ ශරීර ස්කන්ධ දර්ශකය $<$ 25 (කාන්තා)

(ශරීර ස්කන්ධ දර්ශකය) $\dfrac{\text{බර (කි.ග්‍රෑ)}}{\text{උස}^2 \text{ (මී)}}$

(5) වර්ණ දෘෂ්ටිය :- සිපි2

(6) දෘෂ්ටි තීක්ෂණත්වය :- වම් සහ දකුණු ඇස 6/6 (උපැස් රහිත)

*සිවිල් ඉංජිනේරු වෘත්තීන් සඳහා*

වම් සහ දකුණු ඇස 6/6 (උපැස් සහිත/රහිත)

(7) සිවිල් තත්ත්වය ඃ-

(අ) නිත්‍ය ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් අවිවාහක විය යුතුයි. (ගුවන් හමුදාවට බැදී වසර දෙකක් ගතවන තුරු මෙන්ම මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවනතුරුත් යන මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහවීමට ගුවන්භටයින්ට / ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.)

(ආ) ස්වේච්ඡා ගුවන් භට - විවාහක හෝ අවිවාහක (අවිවාහක ස්වේච්ඡා ගුවන් භටයින් ගුවන් හමුදාවට බැදී වසරක් ගතවන තුරු මෙන්ම මූලික පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවනතුරුත් යන මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහවීමට අවසර දෙනු ලැබේ.)

(ඇ) ඉඳුරාම බඳවා ගැනීමේ දී ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් ගුවන් හමුදාවට බැඳීමූලික පුහුණු පාඨමාලාව හදාරා නිමකරන තෙක් විවාහවීමට අවසර දෙනු නොලැබේ.

5. පළමුවන ඡේදයෙහි ''අ'' සහ දෙවන ඡේදයෙහි ''අ'' හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ තුන්වන ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් හෝ සපුරා ගනු නොලබන අපේක්ෂකයින් / අපේක්ෂිකාවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස , බර හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. ගැසට් පත්‍රයේ ඉල්ලා ඇති මිම්වලට අනුව උස, බර හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන් / අයදුම්කාරියන් පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. එහෙත් ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් විශේෂ සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය පරිදි ගුවන් හමුදාවට බඳවා ගැනීම පිළිබඳ සලකා බලනු ලැබේ.

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ටතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. සේවා කොන්දේසි :

(අ) ගුවන්භටයින් / ගුවන් කාන්තාවන් සේවයට බැඳුනුදා සිට ගුවන් හමුදා පනතට, ගුවන් හමුදා රෙගුලාසිවලට සහ ගුවන් හමුදා අණපනත්වලට යටත් විය යුතුයි.

(ආ) තෝරාගනු ලබන සියළුම ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට මූලික සටන් පුහුණුවත් ඉන් පසුව වෘත්තීය පුහුණුවත් ලබා දෙන අතර, ඔවුන් ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක, දිවා රාත්‍රී ඉතා දුෂ්කර තත්ත්වයන්හි වුවද, ඕනෑම ආකාරයක රාජකාරියක් තම මව් රට තුළ දී හෝ විදේශයක දී ඉටුකල යුතුය.

(ඇ) තෝරාගනු ලබන සියළුම ස්වේච්ඡා ගුවන් භටයින්ට/ ගුවන් කාන්තාවන්ට මූලික සටන් පුහුණුව ලබා දෙන අතර, ඔවුන් ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක, දිවා රාත්‍රී ඉතා දුෂ්කර තත්ත්වයන්හි වුවද, ඕනෑම ආකාරයක රාජකාරියක් තම මව් රට තුළ දී හෝ විදේශයක දී ඉටුකළ යුතුය.

8. *බඳවා ගැනීමේ කොන්දේසි :*

(අ) *නිත්‍ය ගුවන් භටයින් / නිත්‍ය ගුවන් කාන්තාවන් සඳහාඃ*

තෝරා ගනු ලබන අපේක්ෂකයින් / අපේක්ෂිකාවන් නිත්‍ය ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් භට / ගුවන් කාන්තා නිලයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 12ක සේවා කාලයකට යටත් විය යුතුයි. ඉන් වසර 08ක් අඛණ්ඩව සේවය කළ යුතු අතර එම කාල සීමාව නිමවීමෙන් පසු වසර 04ක් නිත්‍ය උප සේවයට (අපේක්ෂිත කණ්ඩායමේ) කැඳවීමක් කළ අවස්ථාවකදී වාර්තා කළ යුතුයි. අවුරුදු 08ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන් භටයින්ට / ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

*(ආ) ස්වේච්ඡා ගුවන් භටයින් සඳහා :*

තෝරා ගනු ලබන අපේක්ෂකයින් ස්වේච්ඡා ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ස්වේච්ඡා ගුවන්භට නිලයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 05 ක සේවා කාලයකට යටත් විය යුතුයි. අවුරුදු 05ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන් භටයින්ට අවස්ථාව ලබාදෙනු ඇත.

*(ඇ) ඉඳුරාම බඳවා ගැනීම ස්වේච්ඡා නායක ගුවන් භට/ නායක ගුවන් කාන්තා සහ කෝප්‍රල්වරුන් සඳහා:*

තෝරාගනු ලබන අපේක්ෂක අපේක්ෂිකාවන් ස්වේච්ඡා ගුවන් හමුදාවේ (සපුරා ඇති පාඨමාලා සහ ඔවුන්ගේ සේවා පළපුරුද්ද මත) අදාළ නිලවලට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 05ක සේවා කාලයකට යටත් විය යුතුයි. අවුරුදු 05ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන් භටයින්ට අවස්ථාව ලබාදෙනු ඇත.

9. *රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන් :*

තෝරාගනු ලබන අපේක්‍ෂකයින් / අපේක්ෂිකාවන් ශ්‍රී ලංකාණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාකළ යුතුයි.

10. *වැටුප් හා දීමනා :*

*(අ)* වත්මන් නව මූලික වැටුප් සංශෝධනය අනුව 2020 දක්වා වසරකට ගුවන් භටයින්ට අදාළ මූලික වැටුප් පරිමාණ පහත සඳහන් පරිදි වේ.

| *වර්ෂය*<br>*නිලය* | *2016* | *2017*<br>*(වාර්ෂිකව)* | *2018*<br>*(වාර්ෂිකව)* | *2019*<br>*(වාර්ෂිකව)* | *2020*<br>*(වාර්ෂිකව) (වාර්ෂිකව)* |
|---|---|---|---|---|---|
| ගුවන්භට | 207984.00 | 244608.00 | 281232.00 | 317856.00 | 354480.00 (7x300-19x370) |
| නායක ගුවන්භට | 214320.00 | 252060.00 | 289800.00 | 327540.00 | 365280.00 (4x300-19x370) |
| කෝප්‍රල් | 220656.00 | 259512.00 | 298368.00 | 337224.00 | 376080.00 (1x300-10x370-9x495) |
| සැරයන් | 227808.00 | 267996.00 | 308184.00 | 348372.00 | 388560.00 (3x370-9x495-3x660) |
| බලපන්ති සැරයන් | 232848.00 | 273996.00 | 315144.00 | 356292.00 | 397440.00 (1x370-9x495-3x660) |
| බලලත් නිලධාරී | 242352.00 | 285204.00 | 328056.00 | 370908.00 | 413760.00 (7x495-14x660) |
| ප්‍රධාන බලලත් නිලධාරී | 271452.00 | 319404.00 | 367356.00 | 415308.00 | 463260.00 (13x660) |

*(ආ) දීමනා :*

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 7800.00 ක් ගෙවනු ලැබේ.

(2) දිරි දීමනා මසකට රු.250.00 බැගින් සේවා කාලය වසර 5 සම්පූර්ණ කිරීමෙන් පසුව ගෙවනු ලැබේ.

(3) දුෂ්කර දීමනා දිනකට රු. 20.00 ක් ගෙවනු ලැබේ.

(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන්භට මසකට රු. 3880.00 ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව I: මසකට රු. 2400.00 ක් ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 80/- බැගින්)

(6) අන්තර් දීමනාව :-මසකට රු. 1000.00 ක් ගෙවනු ලැබේ.

(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව : මසකට රු. 170.00 ක් ගෙවනු ලැබේ.

(8) ආහාර දීමනා : පිටත වාසය කරන ගුවන් භටයින්ට මසකට රු 14213.70 බැගින් ගෙවනු ලැබේ. (කඳවුරු තුළ වාසය කරන ගුවන්භටයින්ට නොමිලේ ආහාර සපයනු ලැබේ.)

(9) සුදුසුකම් වැටුප් : ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් වූ විශේෂ පාඨමාලාවක් හදාරා ඇති හෝ විශේෂ සුදුසුකම් ඇති අයට මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට උපරිම රු. 637.50)

(10) ගමනාගමනය : වසරකට නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් (03) (ගුවන් භටයා, භාර්‍යාව සහ ළමයින්ට අදාළ පරිදි) දෙනු ලැබේ. ඊට අමතරව කඳවුර තුළ සිටින ගුවන් භටයින්ට /ගුවන් කාන්තාවන්ට මසකට එක් නිවාඩු බලපත්‍රයක් හෝ ලංගම බස් ගාස්තුව හෝ දෙනු ලැබේ.

(11) වෛද්‍ය පහසුකම් : ගුවන් හමුදාව මගින් සෑම ගුවන් භටයකුටම / ගුවන් කාන්තාවකටම නොමිලේ වෛද්‍ය පහසුකම් සපයන අතර විවාහක නම් ඔහුගේ / ඇයගේ පවුලේ අයට නොමිලේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(12) කඳවුරුවල සිට සැතපුම් 30ක (කි.මී. 48 ක) අරයක් තුළ පදිංචි කඳවුරෙන් පිටත වාසය කරන ගුවන් භටයන්/ගුවන් කාන්තාවන් සඳහා තම වාසස්ථානයේ සිට කඳවුරු වෙත ලංගම බස් මගින් නොමිලේ ගමන් කිරීම සඳහා නිදහස් ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(13) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක ගුවන් භටයින්ට / ගුවන් කාන්තාවකටම මසකට සැරයන් නිලයේ සිට පහළට රු. 1200.00 සිට රු. 2750.00 දක්වා ද, බලපත්‍ර සැරයන් නිලයේ සිට ඉහළට රු. 1350.00 සිට රු. 3300.00 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමිවේ.

(14) නේවාසික පහසුකම් : කඳවුර තුළ වාසය කරන ගුවන් භටයින්ට නොමිලේ සපයනු ලැබේ.

(15) වික්ෂේපණ දීමනා : මව් කඳවුරුවලින් වෙනත් ස්ථානයක රාජකාරි සඳහා යවනු ලැබූ විට මෙම දීමනාව ගෙවනු ලැබේ. (ගෙවීම් ප්‍රමාණය විවාහක / අවිවාහක බව අනුව වෙනස් වේ.)

(16) යහපත් කල්ක්‍රියා ලාංඡන දීමනා :- මෙම දීමනාව ගෙවනු ලබන්නේ තම හැසිරීම හා සාමාන්‍ය විනය ඉතා උසස් අන්දමින් පවත්වාගෙන යනු ලබන තැනැත්තන්ටය. (මසකට රු. 30.00 සිට රු. 511.50 දක්වා)

(17) නැවත සේවයට බැඳීමේ වැටුප් : නැවත සේවයට බැඳෙන ගුවන් භටයන්ට මසකට රු.300.00 බැගින් දීමනාවකට හිමිකම් ලැබේ.

(18) උපදේශක දීමනාව : මසකට රු.425.00 සිට රු. 510.00 දක්වා දීමනාවක් හිමිවේ.

(19) වෙනත් දීමනා : ( වෙන්ව සිටීමේ හා විදේශ ගතවීම් ආදිය) ශ්‍රී ලංකා ගුවන් හමුදා වැටුප් සංග්‍රහයට අනුව මෙම දීමනා ගෙවනු ලැබේ.

(20) වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලු ගුවන්භටයින් / ගුවන් කාන්තාවකටම දායක විය යුතුයි. අරමුදලට ගෙවිය යුතු දායක මුදල්වල අනුප්‍රමාණය 1970 වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදල් රෙගුලාසි අනුව වේ.

11. *ඉල්ලුම්කරුට / ඉල්ලුම්කාරියට උපදෙස් :*

(අ) පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඔබ විසින් සකස් කරනලද අයදුම්පතක් රැගෙන ආ යුතුයි. අයදුම්පත්‍රයේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුයි.

(ආ) රජයේ සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. තව ද යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද ඒ සමග තිබිය යුතුයි.

(ඇ) සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට හෝ ඉල්ලා සිටින අවස්ථාවක අපේක්ෂක විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි.

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ.),

(2) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට සහතික,

(3) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික,

(4) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්. මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය,

(5) ක්‍රීඩා, ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(ඈ) නියම කරනු ලැබූවිට ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

12. *සම්මුඛ පරීක්ෂණ :*

(අ) පිරිමි අයවළුන් සඳහා 2016 ජූනි මස 20,21,22,23,24, 27,28,29,30 යන දිනවල සහ 2016 ජූලි මස 01,04,05 යන දිනවල 0800 පැයේ සිට 1300 පැය දක්වා ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලික කඳවුර - අනුරාධපුරය, ශ්‍රී ලංකා ගුවන් හමුදා සටන් පුහුණු පාසල - දියතලාව, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල - ඒකළ, ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර - කොග්ගල යන කඳවුරුවලදී පැවැත්වේ.

(ආ) කාන්තා අයවළුන් සඳහා 2016 ජූලි මස 07 සහ 08 යන දිනවල 0800 පැයේ සිට 1300 පැය දක්වා ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල - ඒකළ කඳවුරේදී පැවැත්වේ.

(ඇ) ජාතික හැඳුනුම්පත, උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, වෘත්තීය පුහුණු නිපුනත්ව සහතික, වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීමේ සහතික, ක්‍රීඩා සහතික සහ අනෙකුත් සහතිකවල මුල් පිටපත් සමඟ ජායා පිටපත්ද රැගෙන පැමිණෙන්න.

13. මූලික සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වන සියළුම ස්වේච්ඡා ගුවන් හට/ ගුවන් කාන්තා අයදුම්කරුවන් එදිනම පැවැත්වෙන ප්‍රායෝගික පරීක්ෂණයටද පෙනී සිටීමට සූදානම්ව පැමිණිය යුතුය.

14. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් / අයදුම්කාරියන් කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම ඔහුගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් / අයදුම්කාරියන් සේවයට බඳවා ගනු නොලැබේ.

15. සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුසු වන අපේක්ෂකයින් / අපේක්ෂිකාවන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියෙහි පෙනී සිටිය යුතුයි. සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණු වල අගය අනුව අපේක්ෂකයන් / අපේක්ෂිකාවන් ලැයිස්තුගත කරන අතර වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂකයන් / අපේක්ෂිකාවන් තෝරාගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහළ මට්ටමේ සිටයි.

16. අයදුම්කරුවෙක් / අයදුම්කාරියක් නිර්දේශ කිරීමට කැමති ඕනෑම අයෙකු එසේ කළ යුත්තේ ඔහුට චරිත සහතිකයක් දීමෙනි. යම් අපේක්ෂකයෙක් / අපේක්ෂිකාවක් තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළඹවීමක් කිරීම, එසේ නැතහොත් එහිලා බලපෑමට උත්සාහ කිරීම ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වීමට හේතු වන්නේය.

17. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට / අයදුම්කාරියන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

ජී. පී. බුලත්සිංහල,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ.පෙ. 594,
කොළඹ.

*ශ්‍රී ලංකා නිත්‍ය / ස්වේච්ඡා ගුවන් හමුදාවේ ගුවන්හටයින් / ගුවන්කාන්තාවන් සඳහා අයදුම්පත*

1. සම්පූර්ණ නම :————————.

(ජාතික හැඳුනුම්පතට අනුව)

2. ජාතික හැඳුනුම්පත් අංකය :————————.

3. ඉල්ලුම් කරනු ලබන වෘත්තිය:————————.

4. තැපැල් ලිපිනය (ලිපි එවිය යුතු ලිපිනය) :————————.

5. ස්ථිර ලිපිනය :————————.

6. ආසන්නතම ගුවන් හමුදා කඳවුර:————————.

7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————————.

8. දිස්ත්‍රික්කය :————————

9. මැතිවරණ කොට්ඨාසය :————————

10. ග්‍රාම නිළධාරි කොට්ඨාසය:————————.

11. දුරකථන අංකය:————————.

12. උපන් දිනය :————————.

13. වයස (2016 ජූලි මස 15 වන දිනට)

අවුරුදු :———— මාස:———— දින:————

14. විවාහක/ අවිවාහක බව :————————.

15. ස්ත්‍රී/පුරුෂ භාවය:————————.

16. උස : අඩි .............. අඟල් ..................

17. අ.පො.ස. (සා/පෙළ) විභාගය :

| අවුරුද්ද | විභාග අංකය | සමත් වූ විෂයයන් | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

18. අ.පො.ස. (උ/පෙළ) විභාගය :

| අවුරුද්ද | විභාග අංකය | සමත් වූ විෂයයන් | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

19. තනතුර සඳහා විශේෂ සුදුසුකම් (උදාහරණ වශයෙන් කාර්මික හෝ වෙනත් වෘත්තීය පුහුණුව සහ පළපුරුද්ද ආදිය) :————.

20. ක්‍රීඩා අතින් ලබා ඇති විශිෂ්ටතා පිළිබඳ විස්තර:————.

21. පාසලේදී හෝ බාහිර සංවිධානවලදී ලබා ඇති වෙනත් විශිෂ්ටතා :————.

22. මීට පෙර සන්නද්ධ සේවා හෝ පොලිස් සේවයට ඉල්ලුම් කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

23. සිවිල් හෝ යුද්ධ අධිකරණයේදී වැරදිකරු වී ඇති හෝ ඇඟ බැඳ හෝ තිබේද? :————.
එසේ නම් විස්තර සඳහන් කරන්න.:————.

24. චරිත සහතික පිළිබඳ විස්තර ඃ-

| නම | පදවි නාමය | ලිපිනය |
|---|---|---|
| | | |

25. ඉල්ලුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශයඃ

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ උපරිම දැනුමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි

...............................

ඉල්ලුම්කරුගේ/ඉල්ලුම්කාරියගේ අත්සන.

දිනය ඃ- ............................

06-832

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

## නිත්‍ය ගුවන් හටයින් / ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු සහ නිත්‍ය ගුවන් හටයින් / ගුවන් කාන්තාවන් ඉඳුරාම බඳවා ගැනීම සඳහා පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ පහත සඳහන් වෘත්තීන්ට අදාළව ගුවන් හටයින් / ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු පවතී.

1. අ. වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඃ

(1) ගුවන් යානා ඉංජිනේරු වෘත්තීන් (පිරිමි)

*(අ)* ගුවන්යානා සැකිලි ශිල්පී
*(ආ)* ගුවන්යානා යන්ත්‍ර ශිල්පී
*(ඇ)* ගුවන්යානා විදුලි සහ මෙවලම් ශිල්පී

සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව යන විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන්ද ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයකට සම්මාන සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(2) සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන් (පිරිමි)

(අ) අවි අයුධ ශිල්පී
(ආ) රථවාහන කාර්මික ශිල්පී
(ඇ) මතුපිට කාර්මික ශිල්පී
(ඈ) ගුවන් ඡායාරූප ශිල්පී
(ඉ) සාමාන්‍ය යාන්ත්‍රික ශිල්පී
(ඊ) ලියවනපට්ටල් කාර්මික ශිල්පී
(උ) ලෝහ තහඩු කාර්මික ශිල්පී
(ඌ) යාන්ත්‍රික වඩු කාර්මික ශිල්පී

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ගණිතය / විද්‍යාව විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(එ) රථවාහන ක්‍රියාකරු

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. (සැහැල්ලු වාහන රියදුරු බලපත්‍රය ලබා තිබීම අනිවාර්ය වන අතර බර වාහන රියදුරු බලපත්‍රයක් ඇති අයවලුන් හට බඳවා ගැනීමේදී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.) මූලික සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයෙන්ද සමත්විය යුතුය.

(3) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු වෘත්තීන්

*(අ)* ගගන ගුවන් විදුලි කාර්මික ශිල්පී (පිරිමි)

සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව යන විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන්ද ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයකට සම්මාන සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

*(ආ)* දුරකථන ක්‍රියාකරු (පිරිමි)

*(ඇ)* පරිඝණක කාර්මික ශිල්පී (පිරිමි)

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(4) වෛද්‍ය වෘත්තීන්

(අ) හෙද සහායක (පිරිමි / කාන්තා)

සිංහල / දෙමළ, ගණිතය, විද්‍යාව සහ වෙනත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක්ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් **විද්‍යා/ගණිත** විෂය ධාරාවෙන් පහත දැක්වෙන ආකාරයෙන් සාමාර්ථයන් ලබා තිබීම එහි ඉදිරියෙන් දක්වා ඇති වෘත්තීන්ට (හෙද සහායක වෘත්තිය යටතේ) අදාලව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ උසස් වෘත්තිය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් වේ.

| | | |
|---|---|---|
| අ.පො.ස සා.පෙළ **ඉංග්‍රීසි** විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ.පො.ස උ.පෙළ **ජීව විද්‍යාව/ ගණිතය/ කෘෂි විද්‍යා විෂය ධාරාවන් යටතේ** සාමාන්‍ය සාමාර්ථ 3ක් ලබා තිබීම. | - | හෙද ඩිප්ලෝමාව |
| අ.පො.ස සා.පෙළ **ඉංග්‍රීසි** විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ.පො.ස උ.පෙළ විද්‍යා විෂය ධාරාව හදාරා **ජීව විද්‍යාව / සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව / කෘෂි විද්‍යාව** සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද **රසායන විද්‍යාව** සඳහා සම්මාන සාමාර්ථයක් ද ලබා තිබීම. | - | ඖෂධවේදී රසායනාගාර කාර්මික ශිල්පී |
| අ.පො.ස සා.පෙළ **ඉංග්‍රීසි** විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ.පො.ස උ.පෙළ **රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව / කෘෂි විද්‍යාව** යන විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන්ද, **ජීව විද්‍යාව / සංයුක්ත ගණිතය** සඳහා සම්මාන සාමාර්ථයන්ද සහිතව සමත්ව තිබීම. | - | විද්‍යුත් කන්තුක රේඛණ ශිල්පී<br>විද්‍යුත් නිකර්ෂණ රේඛන ශිල්පී |
| අ.පො.ස සා.පෙළ **ඉංග්‍රීසි** විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හා **රසායන විද්‍යාව, ජීව විද්‍යාව /සංයුක්ත ගණිතය** යන විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද **භෞතික විද්‍යාව** සඳහා සම්මාන සාමාර්ථයන් ලබා තිබීම. | - | වෘත්තීය චිකිත්සක<br>විකිරණ ශිල්පී<br>භෞත චිකිත්සක |

*(ආ) දන්ත සහායක (පිරිමි)*

සිංහල / දෙමළ, ගණිතය, විද්‍යාව සහ වෙනත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක්ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව / සංයුක්ත ගණිතය / රසායන විද්‍යාව / භෞතික විද්‍යාව / කෘෂි විද්‍යාව යන විද්‍යා විෂයධාරාවන්ගෙන් විෂයයන් තුනක් එක් වරකදී සමත්ව තිබීම සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ උසස් වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් ලෙස සැලකේ.

(5) ඉදිකිරීම් යන්ත්‍ර ශිල්පී (පිරිමි)

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(6) පරිපාලන වෘත්තීන්

(අ) *පරිපාලන සහායක (පිරිමි )*

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය / විද්‍යාව / ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක්ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිඝණක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

*(ආ) ගිණුම් සහායක (පිරිමි / කාන්තා)*

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය / ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක්ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිඝණක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(7) මෙහෙයුම් වෘත්තීන් :

*(අ) මෙහෙයුම් ගුවන් (පිරිමි)*

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක්ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

*(ආ) ගිනි නිවන්නා (පිරිමි)*

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(ඇ) මෙහෙයුම් භූමි (පිරිමි / කාන්තා)

(ඈ) සුනඛ පාලක (පිරිමි)

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(8) සැපයුම් වෘත්තීන් :

(අ) සැපයුම් සහයක (පිරිමි)

(ආ) ගුවන් යානා ඉන්ධන සැපයුම්කරු (පිරිමි)

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය / විද්‍යාව / ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක්ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිඝණක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(ඇ) භෝජනාගාර සහයක (පිරිමි / කාන්තා)

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී

විෂයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඉංග්‍රීසි භාෂාව භාවිතා කිරීමේ හැකියාවක් ඇති අයවළුන් සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දෙනු ලැබේ. ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා සමත් සහතිකයක් ලබා තිබීම සහ සංචාරක මණ්ඩලයේ අනුමැතිය ලත් හෝ පිළිගත් ප්‍රසිද්ධ හෝටලයක භෝජනාගාර සේවක, බීමහල් සේවක, කාමර සහයක යන අංශයන්ගෙන් සේවා පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ. (වැඩිදුර උසස් පුහුණුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බඳවා ගැනීමෙන් පසුව ප්‍රසිද්ධ හෝටල් ආශ්‍රයෙන් ලබා දෙනු ලැබේ.)

(ඈ) සලාක සහයක (පිරිමි)

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා ඇති අයවළුන් හට ප්‍රමුඛස්ථානයක් ලබා දෙනු ලැබේ.

(ඉ) නිළ ඇඳුම් පරිස්කාරක (පිරිමි / කාන්තා)

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අධිවේගී මහන මැෂින් ක්‍රියා කරවීමේ හැකියාව (Over lock, Button Hole, Button Attached, Double Needle, Bar Tack) ද, පතුරම් රහිතව මිම් අනුව මෝස්තර නිර්මාණය කිරීමේ හැකියාව, ඇඳුම් කැපීම සහ මහන මැෂින් පිළිබඳ කාර්මික දැනුම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(ඊ) ගුවන් යානා කාර්ය මණ්ඩල සහායක (පිරිමි / කාන්තා)

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක්ද සහිතව අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. මනා ලෙස ඉංග්‍රීසි භාෂාව කථාකිරීමේ හැකියාවක් තිබීම සහ ප්‍රියමනාප පෙනුමකින් යුක්ත වීම අනිවාර්ය වන අතර ගුවන් සේවකයෙකු / සේවිකාවක ලෙස පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. **(ඇඟිලි තුඩුවලින් සිට ගත් විට සෙන්ටි මීටර් 212 ක උසක් දක්වා තම දෑත් යොමු කළ හැකි විය යුතුය.)**

(9) පොලිස් (පිරිමි / කාන්තා) :

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. උස අඩි 5 අඟල් 8ට නොඅඩු පිරිමි හා අඩි 5 අඟල් 6ට නොඅඩු කාන්තා අයවළුන් හට බඳවා ගැනීමේ දී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

(10) නර්ථන ශිල්පී (කාන්තා) :

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතු ය. නර්ථනය පිළිබඳ මනා හැකියාවක් තිබීම, නර්ථනයට සුදුසු ශාරීරික හැඩයක් තිබීම, ජන ගී ගායනය, නර්ථනයට අදාළ තූර්ය වාදක භාණ්ඩ වාදනය සහ වේශ නිරූපනය පිළිබඳව ඇති හැකියාව විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(11) ශාරීරික අභ්‍යාස පුහුණුකරු (පිරිමි / කාන්තා) :

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. මලල ක්‍රීඩා වලින් ජාතික මට්ටමින් ලබාගත් ජයග්‍රහණයන් තෝරා ගැනීමේදී විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. මූලික සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයෙන් ද සමත්විය යුතු ය.

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් සඳහා පහත සඳහන් වෘත්තීන්ට අදාළව ඉදුරාම බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පවතී.**

2.(අ) වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් :

(1) සිවිල් ඉංජිනේරු වෘත්තීන්

(අ) ප්‍රමාණ සමීක්ෂක සහායක - (පිරිමි / කාන්තා)

(i) සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතු ය.

(ii) ජාතික තාක්‍ෂණික සහතිකය පරිමාණ හා මිනුම් (NCT Q/S ) පූර්ණ කාලීන එක් අවුරුදු හෝ අර්ධ කාලීන තුන් අවුරුදු පාඨමාලාව සමත් සහතිකයක් ලබා ඇති අය සඳහා නායක ගුවන්භට / නායක ගුවන්කාන්තා නිළය ද ඉහත සුදුසුකම ලැබීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රමාණ බිල්පත් සැකසීම, ටෙන්ඩර් ලියවිලි සැකසීම, ටෙන්ඩර්පත් ඇගයීම, කොන්ත්‍රාත් බිල්පත් සැකසීම සඳහා වසර 3 ක පළපුරුද්දක් ඇති අයවලුන් සඳහා **කෝප්‍රල් නිළය** ද පිරිනැමේ.

(ආ) සැලසුම් ශිල්පී - (පිරිමි)

(i) සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතු ය.

(ii) ජාතික තාක්‍ෂණික සහතිකය ඉංජිනේරු සැලසුම් ශිල්පී (National Engineering Drughtsmanship) - පූර්ණ කාලීන එක් අවුරුදු පාඨමාලාව සමත් සහතිකයක් ලබා ඇති අය සඳහා නායක ගුවන් භට නිළය ද සැලසුම් ශිල්පීයෙකු වශයෙන් ඉහත සුදුසුකම ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 3 ක පළපුරුද්දක් ඇති අය සඳහා කෝප්‍රල් නිළය ද පිරිනැමේ.

*(ඈ)* වැඩ මූලික (සිවිල්/විදුලි/යාන්ත්‍රික) - (පිරිමි)

(i) සිංහල /දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතු ය.

(ii) ජාතික තාක්ෂණික සහතිකය NCT (Civil /Electrical/ Mechanical Engineering)- අර්ධ කාලීන තුන් අවුරුදු පාඨමාලාව හෝ රජයේ වෙනත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද ඊට සමාන සුදුසුකම් ඇති පාඨමාලාවක් සමත් සහතිකයක් සහ වසර 3 ක පළපුරුද්දක් ඇති අයවලුන් සඳහා කෝප්‍රල් නිලය සහ අදාළ ක්ෂේත්‍රයේ වසර 3 ට අඩු පළපුරුද්ද ඇති අයවලුන්හට නායක ගුවන් භට නිලය පිරිනැමේ.

3. අනෙකුත් සුදුසුකම් :

(අ) ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින් / අපේක්ෂිකාවන් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුයි:-

(1) පුරවැසිභාවය : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.

(2) වයස : 2016 නොවැම්බර් මස 15 දිනට
අවුරුදු 18ත් 23ත් අතර (නිත්‍ය පිරිමි)
අවුරුදු 18ත් 22ත් අතර (නිත්‍ය කාන්තා)

සිවිල් ඉංජිනේරු වෘත්තීන්
අවුරුදු 18-28 ත් අතර (නිත්‍ය පිරිමි)
අවුරුදු 18-26 ත් අතර (නිත්‍ය කාන්තා)

(3) උස :- අඩි 5 අඟල් 5 ට නොඅඩු විය යුතුයි. (පිරිමි)
:- අඩි 5 අඟල් 3 ට නොඅඩු විය යුතුයි. (කාන්තා)

(4) බර : 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26 (පිරිමි)
: 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 (කාන්තා)

$$(\text{ශරීර ස්කන්ධ දර්ශකය}) \quad \frac{\text{බර (කි.ග්‍රෑ)}}{\text{උස}^2 \text{ (මී)}}$$

(5) වර්ණ දෘෂ්ටිය :- සීපී2

(6) දෘෂ්ටි තීක්ෂණත්වය :- වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් රහිත)

(7) සිවිල් තත්ත්වය :

*(අ)* නිත්‍ය ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් අවිවාහක විය යුතුයි. (ගුවන් හමුදාවට බැඳී වසර දෙකක් ගතවන තුරු මෙන්ම මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවනතුරුත් යන මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහවීමට ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ)

*(ආ)* නර්තන ශිල්පී වෘත්තියේ ගුවන් කාන්තාවන් සඳහා මූලික පුහුණු පාඨමාලාව හදාරා වසර පහක (5) කාලයක් ගතවීමෙන් පසුව විවාහ වීම සඳහා අවසර දෙනු ලැබේ.

*(ඇ)* ඉඳුරාම බඳවා ගැනීමේදී ගුවන් භටයින් හෝ ගුවන් කාන්තාවන් ගුවන් හමුදාවට බැඳී මූලික පුහුණු පාඨමාලාව හදාරා නිමකරන තෙක් විවාහවීමට අවසර දෙනු නොලැබේ.

4. පළමුවන ඡේදයෙහි "අ" සහ දෙවන ඡේදයෙහි "අ" හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ තුන්වන ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් හෝ සපුරා ගනු නොලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, බර හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. ගැසට් පත්‍රයේ ඉල්ලා ඇති මිම්වලට අනුව උස, බර හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරියන් පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. එහෙත් ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් විශේෂ සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය පරිදි ගුවන් හමුදාවට බඳවා ගැනීම පිළිබඳ සලකා බලනු ලැබේ.

5. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ටතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

*6. සේවා කොන්දේසි :*

අ. ගුවන්භටයින්/ගුවන් කාන්තාවන් සේවයට බැඳුනුදා සිට ගුවන් හමුදා පනතට, ගුවන් හමුදා රෙගුලාසිවලට සහ ගුවන් හමුදා අණපනත්වලට යටත් විය යුතුයි.

ආ. තෝරාගනු ලබන සියලුම ගුවන් භටයින්ට / ගුවන් කාන්තාවන්ට මූලික සටන් පුහුණුවත් ඉන් පසුව වෘත්තීය පුහුණුවත් ලබා දෙන අතර, ඔවුන් ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක, දිවා රාත්‍රී ඉතා දුෂ්කර තත්ත්වයන්හි වුව ද, ඕනෑම ආකාරයක රාජකාරියක් තම මව් රට තුළ දී හෝ විදේශයක දී ඉටුකළ යුතු ය.

7. *බඳවා ගැනීමේ කොන්දේසි :*

නිත්‍ය ගුවන් භටයින්/නිත්‍ය ගුවන් කාන්තාවන් සඳහා

තෝරා ගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නිත්‍ය ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් භට/ගුවන් කාන්තා නිළයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 12ක සේවා කාලයකට යටත් විය යුතුයි. ඉන් වසර 08ක් අඛණ්ඩව සේවය කළ යුතු අතර එම කාල සීමාව නිමවීමෙන් පසු වසර 04ක් නිත්‍ය උප සේවයට (අපේක්ෂිත කණ්ඩායමේ) කැඳවීමක් කළ අවස්ථාවකදී වාර්තා කළ යුතුයි. අවුරුදු 08ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන්භටයින්ට/ ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

8. *රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන් :*

තෝරාගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ශ්‍රී ලංකාණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාකළ යුතුයි.

*9. වැටුප් හා දීමනා :*

(අ) වත්මන් නව මූලික වැටුප් සංශෝධනය අනුව 2020 දක්වා වසරකට ගුවන් භටයින්ට අදාළ මූලික වැටුප් පරිමාණ පහත සඳහන් පරිදි වේ:-

| *වර්ෂය* / *නිලය* | *2016 (වාර්ෂිකව)* | *2017 (වාර්ෂිකව)* | *2018 (වාර්ෂිකව)* | *2019 (වාර්ෂිකව)* | *2020 (වාර්ෂිකව)* |
|---|---|---|---|---|---|
| ගුවන්භට | 2,07,984.00 | 2,44,608.00 | 2,81,232.00 | 3,17,856.00 | 3,54,480.00 (7x300-19x370) |
| නායක ගුවන්භට | 2,14,320.00 | 2,52,060.00 | 2,89,800.00 | 3,27,540.00 | 3,65,280.00 (4x300-19x370) |
| කෝප්‍රල් | 2,20,656.00 | 2,59,512.00 | 2,98,368.00 | 3,37,224.00 | 3,76,080.00(1x300-10x370-9x495) |
| සැරයන් | 2,27,808.00 | 2,67,996.00 | 3,08,184.00 | 3,48,372.00 | 3,88,560.00 (3x370-9x495-3x660) |
| බලපත්ති සැරයන් | 2,32,848.00 | 2,73,996.00 | 3,15,144.00 | 3,56,292.00 | 3,97,440.00 (1x370-9x495-3x660) |
| බලලත් නිලධාරීන් | 2,42,352.00 | 2,85,204.00 | 3,28,056.00 | 3,70,908.00 | 4,13,760.00 (7x495-14x660) |
| ප්‍රධාන බලලත් නිලධාරීන් | 2,71,452.00 | 3,19,404.00 | 3,67,356.00 | 4,15,308.00 | 4,63,260.00 (13x660) |

*(ආ) දීමනා :*

(1) ජීවනාධාර දීමනාව මසකට රු 7,800.00 ක් ගෙවනු ලැබේ.

(2) දිරි දීමනා මසකට රු.250.00 බැගින් සේවා කාලය වසර 5 සම්පූර්ණ කිරීමෙන් පසුව ගෙවනු ලැබේ.

(3) දුෂ්කර දීමනා දිනකට රු 20.00 ක් ගෙවනු ලැබේ.

(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන්හට මසකට රු. 3,880.00 ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව I: මසකට රු 2,400.00 ක් ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 80/- බැගින්)

(6) අන්තර් දීමනාව :- මසකට රු 1,000.00 ක් ගෙවනු ලැබේ.

(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව : මසකට රු. 170.00 ක් ගෙවනු ලැබේ.

(8) *ආහාර දීමනා* : පිටත වාසය කරන ගුවන් භටයින්ට මසකට රු 14,213.70 බැගින් ගෙවනු ලැබේ. (කඳවුරු තුළ වාසය කරන ගුවන් භටයින්ට නොමිලේ ආහාර සපයනු ලැබේ.)

(9) *සුදුසුකම් වැටුප්* :- ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් වූ විශේෂ පාඨමාලාවක් හදාරා ඇති හෝ විශේෂ සුදුසුකම් ඇති අයට මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට උපරිම රු. 637.50)

(10) *ගමනාගමනය* : වසරකට නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් (03) (ගුවන් භටයා, භාර්යාව සහ ළමයින්ට අදාළ පරිදි) දෙනු ලැබේ. ඊට අමතරව කඳවුර තුළ සිටින ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට මසකට එක් නිවාඩු බලපත්‍රයක් හෝ ලංගම බස් ගාස්තුව හෝ දෙනු ලැබේ.

(11) *වෛද්‍ය පහසුකම්* :- ගුවන් හමුදාව මගින් සෑම ගුවන් භටයකුටම/ගුවන් කාන්තාවකටම නොමිලේ වෛද්‍ය පහසුකම් සපයන අතර විවාහක නම් ඔහුගේ/ඇයගේ පවුලේ අයට නොමිලේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(12) කඳවුරුවල සිට සැතපුම් 30ක (කි.මී. 48 ක) අරයක් තුළ පදිංචි කඳවුරෙන් පිටත වාසය කරන ගුවන් භටයන්/ගුවන් කාන්තාවන් සඳහා තම වාසස්ථානයේ සිට කඳවුරු වෙත ලංගම බස් මගින් නොමිලේ ගමන් කිරීම සඳහා නිදහස් ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(13) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක ගුවන් හටයින්ට/ගුවන් කාන්තාවකටම මසකට සැරයන් නිලයේ සිට පහළට රු. 1,200.00 සිට රු. 2,750.00 දක්වාද, බලපත්‍ර සැරයන් නිලයේ සිට ඉහළට රු. 1,350.00 සිට රු. 3,300.00 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමිවේ.

(14) *නේවාසික පහසුකම්* :- කඳවුර තුළ වාසය කරන ගුවන් හටයින්ට නොමිලේ සපයනු ලැබේ.

(15) *වික්ෂේපණ දීමනා* :- මව් කඳවුරුවලින් වෙනත් ස්ථානයක රාජකාරි සඳහා යවනු ලැබූ විට මෙම දීමනාව ගෙවනු ලැඩේ. (ගෙවීම් ප්‍රමාණය විවාහක/අවිවාහක බව අනුව වෙනස් වේ.)

(16) *යහපත් කල්ක්‍රියා ලාංඡන දීමනා* :- මෙම දීමනාව ගෙවනු ලබන්නේ තම හැසිරීම හා සාමාන්‍ය විනය ඉතා උසස් අන්දමින් පවත්වාගෙන යනු ලබන තැනැත්තන්ටය. (මසකට රු. 30.00 සිට රු. 511.50 දක්වා)

(17) *නැවත සේවයට බැඳීමේ වැටුප්* :- නැවත සේවයට බැඳෙන ගුවන් හටයන්ට මසකට රු.300.00 බැගින් දීමනාවකට හිමිකම් ලැබේ.

(18) *උපදේශක දීමනාව* :- මසකට රු.425.00 සිට රු. 510.00 දක්වා දීමනාවක් හිමිවේ.

(19) *වෙනත් දීමනා* :- ( වෙන්ව සිටීමේ හා විදේශ ගතවීම් ආදිය) ශ්‍රී ලංකා ගුවන් හමුදා වැටුප් සංග්‍රහයට අනුව මෙම දීමනා ගෙවනු ලැබේ.

(20) වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියළු ගුවන්හටයින්/ගුවන් කාන්තාවකටම දායක විය යුතුයි. අරමුදලට ගෙවිය යුතු දායක මුදල්වල අනුප්‍රමාණය 1970 වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදල් රෙගුලාසි අනුව වේ.

10. ඉල්ලුම්කරුට/ඉලලුම්කාරියට උපදෙස් :-

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම්පත් සැකසිය යුතුයි. ඉල්ලුම්පතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2016 ජුනි මස 30 වන දින දහවල් 1200ට පෙර ලැබෙනසේ "විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරී, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, ඒකළ, කොටුගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. (ලියාපදිංචි තැපෑලෙන් එවනු නොලබන අයදුම්පත් බාරගනු නොලැබේ.) අයදුම්පතේ ඉහළ වම් කෙලවරේ "ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් කළයුතුයි. එක් අයදුම්කරුවෙක් එක් වෘත්තියකට පමණක් ඉල්ලුම් කළයුතු අතර, වෘත්තීන් කිහිපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව කොටුගොඩ, ඒකළ, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල වෙත ලැබුණාවූද, මේ නිවේදනයේ අවශ්‍යතාවලට අනුකූල නොවන්නාවූද ඉල්ලුම්පත් බාරගනු නොලැබේ.

(ආ) රජයේ සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. තවද යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද ඒ සමඟ තිබිය යුතුයි.

(ඇ) සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙනවිට හෝ ඉල්ලා සිටින අවස්ථාවක අපේක්ෂක විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි:

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ.);

(2) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට සහතික;

(3) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික;

(4) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්. ඉන් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය;

(5) ක්‍රීඩා, ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(ඈ) නියම කරනු ලැබූවිට ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

(ඉ) කිසිදු ලියකියවිලි හෝ සහතිකවල මුල් පිටපත් ඉලලුම්පත් සමග නොඑවිය යුතුයි.

(ඊ) ඉල්ලුම්පත් සමග සහතිකවල මුල් පිටපත් එවා ඒවා නැතිවුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

11. සම්මුඛ පරීක්ෂණයට සුදුසුයැයි සලකනු ලබන අපේක්ෂකයින් / අපේක්ෂිකාවන් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුදා බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය, දිනය සහ වේලාව පෞද්ගලිකව දන්වනු ලැබේ.

12. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන්/අයදුම්කාරින් කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම ඔහුගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුව ද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් /අයදුම්කාරියන් සේවයට බඳවා ගනු නොලැබේ.

13. සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුසු වන අපේක්ෂකයින් / අපේක්ෂිකාවන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියෙහි පෙනී සිටිය යුතුයි. සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණුවල අගය අනුව අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් ලැයිස්තුගත කරන අතර වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් තෝරා ගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහල මට්ටමේ සිටයි.

14. අයදුම්කරුවෙක්/අයදුම්කාරියක් නිර්දේශ කිරීමට කැමති ඕනෑම අයෙකු එසේ කල යුත්තේ ඔහුට චරිත සහතිකයක් දීමෙනි. යම් අපේක්ෂකයෙක්/අපේක්ෂිකාවක් තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළඹවීමක් කිරීම, එසේ නැතහොත් එහිලා බලපෑමට උත්සාහ කිරීම ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වීමට හේතු වන්නේය.

15. ඉල්ලුම් පත්‍රයෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා/අපේක්ෂිකාව තෝරා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වේ.

16. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/ අයදුම්කාරියන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

ජී. පී. බුලත්සිංහල
එයාර් මාර්ෂල්
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594
කොළඹ.

*ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා අයදුම්පත*

1. සම්පූර්ණ නම :——————.
   (ජාතික හැඳුනුම්පතට අනුව)
2. ජාතික හැඳුනුම්පත් අංකය :——————.
3. ඉල්ලුම් කරනු ලබන වෘත්තිය:——————.
4. තැපැල් ලිපිනය (ලිපි එවිය යුතු ලිපිනය) :——————.
5. ස්ථිර ලිපිනය :——————.
6. ආසන්නතම ගුවන් හමුදා කඳවුර:——————.
7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :——————.
8. දිස්ත්‍රික්කය :——————
9. මැතිවරණ කොට්ඨාසය :——————
10. ග්‍රාම නිලධාරි කොට්ඨාසය:——————.
11. දුරකථන අංකය:——————.
12. උපන් දිනය :——————.
13. වයස (2016 නොවැම්බර් මස 15 වන දිනට)
    අවුරුදු :————, මාස:————, දින:————
14. විවාහක/අවිවාහක බව :——————.
15. ස්ත්‍රී/පුරුෂ භාවය:——————.
16. උස : අඩි .............. අඟල් ..................
17. අ.පො.ස. (සා/පෙළ) විභාගය :

| අවුරුද්ද | විභාග අංකය | සමත් වූ විෂයයන් | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

18. අ.පො.ස. (උ/පෙළ) විභාගය:

| අවුරුද්ද | විභාග අංකය | සමත් වූ විෂයයන් | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

19. තනතුර සඳහා විශේෂ සුදුසුකම් (උදාහරණ වශයෙන් කාර්මික හෝ වෙනත් වෘත්තීය පුහුණුව සහ පළපුරුද්ද ආදිය) :————.
20. ක්‍රීඩා අතින් ලබා ඇති විශිෂ්ටතා පිළිබඳ විස්තර:————.
21. පාසලේ දී හෝ බාහිර සංවිධානවල දී ලබා ඇති වෙනත් විශිෂ්ඨතා :————.
22. මීට පෙර සන්නද්ධ සේවා හෝ පොලිස් සේවයට ඉල්ලුම් කර ඇත්තම් ඒ පිළිබඳ විස්තර ඃ-
23. සිවිල් හෝ යුද්ධ අධිකරණයේ දී වැරදිකරු වී ඇති හෝ ඇඟ බැඳ හෝ තිබේ ද? :
    එසේ නම් විස්තර සඳහන් කරන්න.
24. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවි නාමය | ලිපිනය |
|---|---|---|
| | | |

25. ඉල්ලුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය:

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ උපරිම දැනුමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාල වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

——————,
ඉල්ලුම්කරුගේ/ඉල්ලුම්කාරියගේ අත්සන.

දිනය :————.

06-833

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2012(I)(2016)

1.0 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරින් සඳහා අදළ අනුමත සේවා ව්‍යවස්ථාවන්හි විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2016 ඔක්තෝබර් මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 මෙම විභාගයට අදළ වන අයදුම්කරුවන් පිළිබඳව අංක 1840/ 34 සහ 2013.12.11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාවේ 08 ඡේදය, 15 අන්තර්කාලීන විධිවිධාන සහ ඇමුණුම 04හි තොරතුරු දක්වා ඇත.

3.0 මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර පැවති සේවා ව්‍යවස්ථාවේ, III ශ්‍රේණියේ නිලධාරින් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ නොකරන ලද එහෙත් එම විභාගයෙහි (1) කාර්යාල ක්‍රම (2) ගිණුම් ක්‍රම හා (3) පරිගණක පරීක්ෂණය යන විෂයයන් එකක් හෝ කිහිපයක් සමත් වූ හෝ නිදහස් කරන ලද නිලධාරීන් මෙම සේවා ව්‍යවස්ථාවෙහි III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙහි අදළ විෂයයන්ගෙන් විෂයයෙන් විෂයයට පදනම මත නිදහස් කරනු ලැබේ. පත්වීමේ දින සිට වසර තුනක් ඇතුළත මෙම විභාගය සමත් විය යුතුය.

4.0 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරින් සඳහා මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකළපුව, කුරුණෑගල, අනුරාධපුරය, බදුල්ල, රත්නපුරය හා කිලිනොච්චිය යන නගරවල දී පැවැත්වේ. අදළ නගර හා නගර අංක පහත වගුවේ දක්වේ. ඉල්ලුම් කළ නගරය/ නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| නගරය | නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 05 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| මුලතිව් | 12 |
| ත්‍රිකුණාමලය | 14 |
| මඩකළපුව | 15 |
| කුරුණෑගල | 18 |
| අනුරාධපුරය | 19 |
| බදුල්ල | 21 |
| රත්නපුරය | 24 |
| කිලිනොච්චිය | 25 |

ඉහත කිසියම් මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කර ඊට ආසන්න මධ්‍යස්ථානයක් වෙත අදළ අයදුම්කරුවන් යොමු කෙරෙනු ඇත.

5.0 (i) මෙම විභාගය,විභාගය කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති ගැසට් නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

6.0 ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2016 ජූලි මස 25 දින හෝ ඊට පෙර ලැබෙන සේ-

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503,
කොළඹ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

*සටහන.* - මෙම ගැසට් නිවේදනයට සමගාමීව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන අදළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා මඟින් ද අනෙකුත් අදළ ආයතන වල අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන එම ආයතන මඟින් ද නිකුත් කරනු ඇත.

ඒ ඒ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින් සහ මෙම විභාගයට අයදුම්කරන අනෙකුත් ආයතනවල නිලධාරීන්ගේ අයදුම්පත්‍ර වෙන්කර ගැනීමේ පහසුව සඳහා අයදුම්පත්‍රයේ ශීර්ෂයේ අදළ

සේවාව හෝ ආයතනය දැක්වීමේදී සංකේත අංකයක් ඇතුළත් කළ යුතු වේ. ඒ අනුව **ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ සංකේත අංකය 10 වේ**. එම අංකය අයදුම්පතේ දකුණු පස ඉහළ ඔබ අයත් සේවය යන ස්ථානයේ සටහන් කළ යුතුය.

7.0 *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* .- අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය;

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

8.0 *අයදුම්පත්‍ර*. - අංක 1.0 සිට 3.0 දක්වා ඡේදයන් පළමුවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලට ද ඇතුළත් වන පරිදි "ඒ 4" ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය පිළියෙල කළ යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත්අකුරින්ම පිරවිය යුතුය. අයදුම්පත මේ සමග ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. තවද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් ඉල්ලුම්කරන එක් විෂයයක් සඳහා රු.200/- ක් ද විෂයයන් දෙකක් හෝ සම්පූර්ණ විභාගය සඳහා ඉල්ලුම් කරන්නේ නම් රු.400/-ක් ද වශයෙන් විභාග ගාස්තුව ගෙවිය යුතුය. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ **2003- 02- 13** ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. තවද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මොනම කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ. විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

9.0 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින තුනකට වත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තරය සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් එලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම්, ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදනමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

10.0 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු/ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු ලබා දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12.0 තමන් කැමති වන්නේ නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිවේ. එතකුදු වුවත් සාමාර්ථයක් සඳහා එක් එක් විෂයය සඳහා වූ මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%ක්) නිලධාරීන් විසින් ලබාගත යුතුවේ.

13.0 විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන අතර විභාගය සමත් වූ අපේක්ෂකයන්ගේ නම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික

*සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු* කරනු ඇත.

14.0 *විභාග පරිපාටිය.*-අපේක්ෂකයන් පහත දක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. :

| *විෂයය* | *විෂය අංකය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 1. කාර්යාල ක්‍රම | 01 | 100 යි | පැය 02 යි |
| 2. ගිණුම් ක්‍රම | 02 | 100 යි | පැය 02 යි |
| 3. පරිගණක පරීක්ෂණය | 03 | 100 යි | පැය 01 1/2 යි |

14.1 *කාර්යාල ක්‍රම (විෂය අංකය* - 01) .- රජයේ කාර්යාලවල භාවිත වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව පරීක්‍ෂා කිරීම හා රාජකාරි ලිපිලේඛන මැනවින් අවබෝධ කොටගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස්/ නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝගය අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව ද පරීක්‍ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ. :-

*I වන කොටස* - කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතු ය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය. (ලකුණු 25 යි);

*II වන කොටස* - ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් තුනකට පිළිතුරු සැපයිය යුතු ය. (ලකුණු 75 යි)

14.2 *ගිණුම් ක්‍රම (විෂය අංකය - 02)* .- රජයේ කාර්යාලවල භාවිත වන මූලික ගිණුම් හා ගිණුම් ක්‍රම ද මුදල් පාලන පොත්වල කාර්යයන් පිළිබඳ අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

*I වන කොටස* - කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය. (ලකුණු 25 යි);

*II වන කොටස* - ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් තුනකට පිළිතුරු සැපයිය යුතු ය. (ලකුණු 75 යි)

14.3 *පරිගණක පරීක්ෂණය* (විෂය අංකය - 03)

අයදුම්කරුට පහත සඳහන් හැකියාවන් තිබේදැයි පරීක්ෂා කිරීම මෙම පරීක්ෂණයේ අරමුණ වේ. :-

(i) තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සංකල්ප;

(ii) වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය;

(iii) ගොනු කළමනාකරණය;

(iv) වදන් සැකසුම;

මූලික කුසලතා, තිරයට හුරුවීම, පාඨ සංස්කරණය
පාඨ එකේලි කිරීම, අකුරු වර්ග හා උපලක්ෂණ, අනුච්ඡේද, ඡේද, ජේළි අතර පරතරය වෙනස් කිරීම,
පිමි අනුයෝගය (Tab Settings), පාඨයක් සෙවීම හා ප්‍රතිෂ්ඨාපනය, අක්ෂර හා ව්‍යාකරණ දෝෂ, සමානාර්ථ පද,
තීරු යෙදීම, පිටු සැකසීම
ලේඛන මුද්‍රණය, වගු නිර්මාණය, අනුපිළිවෙළට සැකසීම, ගොනු කළමනාකරණය,
ලේඛනයක් ලිපිනයන් කිහිපයකට යැවීමට සැකසීම
මැක්‍රෝ භාවිතය

(v) පැතුරුම්පත්

මූලික කුසලතා
ආකෘතිකරණය (Formatting)
සංස්කරණය
තීරු හා පරාස, නව ඇතුළත් කිරීම් හා ඉවත් කිරීම්
දත්ත අනුපිළිවෙළට සැකසීම
ප්‍රස්තාර සැකසීම
මුද්‍රණය
@ ශ්‍රිතය (@ Function)
මැක්‍රෝ භාවිතය
ගොනු කළමනාකරණ

(vi) අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල

අන්තර්ජාලය හැඳින්වීම, මූලික කුසලතා, විද්‍යුත් තැපැල ලබා ගැනීම
විද්‍යුත් තැපැල යැවීම, ඊට ප්‍රතිචාර දැක්වීම
ඇමුණුම් භාවිතය, ලිපිනය හඳුනා ගැනීමට කෙටි නාම භාවිතය
පණිවුඩ සම්පාදනය

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ. :-

I වන කොටස- බහුවරණ/ කෙටි පිළිතුරු ප්‍රශ්න 40 කින් යුක්ත වේ. කාලය මිනිත්තු 45 යි. (ලකුණු 40) ;

II වන කොටස - අර්ධ ව්‍යුහගත ප්‍රශ්න 05 කි. කාලය මිනිත්තු 45 යි. (ලකුණු 60 යි).

*සටහන* .- 1840/ 34 සහ 2013.12.11 *දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද* 2013.04.02 දින සිට ක්‍රියාත්මක වන රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා නව ව්‍යවස්ථාවේ ඇමුණුම 04 අනුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන පරිගණක මෙහෙයුම් ප්‍රායෝගික බලපත්‍රය ලබා

ඇති නිලධරයෝ ද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පරිගණක උපාධිය ලබා ඇති නිලධරයෝ ද, තෘතීයික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතනයක NVQ 4 මට්ටම හෝ ඉන් ඉහළ මට්ටමක ප්‍රවීණතාවය ලද නිලධරයෝ ද ඉහත පරිගණක පරීක්ෂණයෙන් නිදහස් කරනු ලබති.

15.0 මෙම විභාග නිවේදනයට විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

16.0 "සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ."

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2016 ජුනි මස 10 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2012(I) 2016**

EFFICIENCY BAR EXAMINATION FOR OFFICERS IN GRADE III OF PUBLIC MANAGEMENT ASSISTANTS' SERVICE - 2012(I) 2016

ඔබ අයත් වන සේවය (මෙය සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනයේ 6.0 ඡේදයේ සටහන බලන්න) [ ]

| | නගරය | නගර අංකය |
|---|---|---|
| 1. | | |
| 2. | | |

(ගැසට් නිවේදනයේ 4.0 ඡේදයට අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර කැමැත්තෙන් අනුපිළිවෙලට සඳහන් කරන්න. මෙය පසුව වෙන් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා. : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොද නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා. : GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :————.

2.0 2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :-
ස්ත්‍රී - 1
පුරුෂ - 0 [ ]
(අදළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

3.3 ජාතික හැඳුනුම්පත් අංකය :- [ | | | | | | | | | ]

4.0 ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත් වන විෂයය/ විෂයයන් (ගැසට් නිවේදනයේ 14.0 වන ජේදය බලන්න.)

| අනු. අංකය | විෂයය | විෂය අංකය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |

5.0 දූනට දරන තනතුර :

5.1 තනතුර :————.

5.2 පත්වීම් ලිපියේ අංකය :————.

6.0 6.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද ? :————.

6.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.

6.3 තැපැල් කාර්යාලය :————.

6.4 ලදුපත් අංකය :————.

6.5 දිනය :————.

| |
|---|
| සම්පූර්ණ විභාග ගාස්තුව රු. 400 ක් ද, එක් විෂයයක් සඳහා රු. 200 ක් ද වන අතර එම මුදල ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. |

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව රු............. තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

.......................................................................,
අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

*සටහන* .- තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලය ලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියකු/ නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන.......................... මහතා/ මහත්මිය/ මෙනවිය ................. වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

.......................................................................,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

I ඉහත සපයා ඇති විස්තර පරීක්‍ෂා කර බැලූ බවත්,

II නිලධාරියා/ නිලධාරිනිය* මෙම විභාගයට මීට පෙර පෙනී සිටි/ නොසිටි* බවත්,

III නිලධාරියා/ නිලධාරිනිය* මෙයට පෙර විභාගයට පෙනී සිට ඇති නිසා නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත මෙම ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවත්,

IV නිලධාරියා/ නිලධාරිනිය* මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,

මම සහතික කරමි.

* අදාළ නොවන වචන කපා හරින්න.

.................................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

06 - 927

---

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014 (II) (2016)

1.0 2013.12.11 දිනැති හා අංක 1840/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 8 ඡේදය, 15 ඡේදය (අන්තර්කාලීන විධිවිධාන) සහ ඇමුණුම 06 හි විධිවිධානයන්ට අනුකූලව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයක්, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2016 ඔක්තෝබර් මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 (i) මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පෙර I ශ්‍රේණියට උසස් වීමෙන් පසු වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් වැටුප් වර්ධක 05 ක් උපයා ගෙන ඇති නිලධාරීන් මෙම සේවා ව්‍යවස්ථාව යටතේ I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(ii) මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පෙර I ශ්‍රේණියට උසස් වී තිබුණ ද I ශ්‍රේණියට පත්වීමෙන් පසු වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් වැටුප් වර්ධක 05 ක් උපයා ගෙන නොමැති නිලධාරීන් සඳහා මෙම සේවා ව්‍යවස්ථාව යටතේ I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීම සඳහා මෙම සේවා ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් වන දින සිට වසර 05 ක සහන කාලයක් දෙනු ලැබේ.

3.0 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිවු, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුරය, බදුල්ල, රත්නපුර හා කිලිනොච්චිය යන නගරවල දී පැවැත්වේ. අදාළ නගර හා නගර අංක පහතින් දක්වේ. ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතූන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අපේක්ෂකයින්ගේ දෙවන මනාපය පරිදි මධ්‍යස්ථානය තීරණය කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට තරම් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම්කොට නොමැති

නම් විභාගය කොළඹ දී පමණක් පැවත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු යොදනු ඇත. ඉල්ලුම්පත්‍රයේ අදාළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුවට අනුව සම්පූර්ණ කළ යුතු වේ. ඉල්ලුම් කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 05 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| මුලතිව් | 12 |
| ත්‍රිකුණාමලය | 14 |
| මඩකලපුව | 15 |
| කුරුණෑගල | 18 |
| අනුරාධපුරය | 19 |
| බදුල්ල | 21 |
| රත්නපුර | 24 |
| කිලිනොච්චිය | 25 |

4.0 (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති *ගැසට් නිවේදනයේ* වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

5.0 සුදුසුකම් - රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියේ පත්වීමක් ලබා ඇති නිලධරයන් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

සටහන - මෙම විභාගය I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් තුළ සමත්විය යුතු ය.

මෙම *ගැසට් නිවේදනයට* සමගාමීව පළාත් රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන අදළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ද අනෙකුත් අදළ ආයතනවල අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන එම ආයතන මගින් ද නිකුත් කරනු ඇත.

ඒ ඒ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින් සහ මෙම විභාගයට අයදුම්කරන අනෙකුත් ආයතනවල නිලධාරින්ගේ අයදුම්පත්‍ර වෙන්කර ගැනීමේ පහසුව සඳහා අයදුම්පත්‍රයේ ශීර්ෂයේ අදළ සේවාව හෝ ආයතනය දක්වීමේ දී සංකේත අංකයක් ඇතුළත් කළ යුතු වේ. ඒ අනුව **ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ සංකේත අංකය 10** වේ. එම අංකය අයදුම්පතේ දකුණු පස ඉහළ ඔබ අයත් සේවය යන ස්ථානයේ සටහන් කළ යුතු ය.

6.0 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙළ කරගත යුතු අතර, ඒ අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2016 ජූලි මස 25 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503,
කොළඹ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. **අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය.** අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

7.0 *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* - අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවෙකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

8.0 (I) *අයදුම්පත්‍ර* - ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 1.0 සිට 5.0 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලට ද ඇතුළත් වන පරිදි ''ඒ 4'' ප්‍රමාණයේ කඩදසිවල අයදුම්පත්‍රය පිළියෙළ කළ යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙළ කරගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. අයදුම්පත මේ සමග ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, එක් අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර, අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පත්‍රයේ ශිර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව

ඉංග්‍රීසියෙන් ද, සඳහන් කරන්න. තව ද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(II) පළමු වන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් හෝ එක් විෂයයකට වඩා පෙනී සිටින්නේ නම් රු. 400/- ක් ද, එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 200/- ක් ද විභාග ගාස්තු වශයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

9.0 අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමඟ විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත ද විභාග ගාස්තු ගෙවන ලද්දේ නම් ඊට අදාළ ලදුපතෙහි පිටපත ද අතැතිව, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් ඔබගේ ඉහත විස්තර සහ විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මඟින් ඔබවෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මඟින් යොමු කරමින්ම විමසා සිටීම ද වඩාත් ඵලදායී වනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

*සටහන:-අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.*

10.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11.0 ලිඛිත පරීක්ෂණය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වෙනු ඇත. අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් නිලධාරීන් විසින් ප්‍රශ්න පත්‍ර තුනකට පිළිතුරු සැපයිය යුතුවේ. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු අය සම්බන්ධ වූ නිලධාරීන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර තුනකට පිළිතුරු සැපයිය යුතුවේ. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12.0 තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිය. එතෙකුදු වුවත් සාමාර්ථ්‍යය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) බැගින් ලබාගත යුතුවේ. (වැඩි විස්තර සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ ඇමුණුම 06 බලන්න.)

13.0 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගය සමත් වූ අපේක්ෂකයන්ගේ නම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කිරීමට කටයුතු කරනු ඇත.

14.0 *විභාග පරිපාටිය* .- අපේක්ෂකයන් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

| *විෂයය* | *ලකුණු* | *කාලය* | *විෂය අංකය* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 1 ආයතන කාර්ය හා පරිපාටික රීති කාර්ය | 100 යි | පැය 01 1/2 යි | 01 | 40 |
| 2 රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 100 යි | පැය 01 1/2 යි | 02 | 40 |
| 3 කාලීන ප්‍රවණතා | 100 යි | පැය 01 යි | 03 | 40 |

14.1 *ආයතන කාර්ය හා කාර්ය පටිපාටික රීති* .- කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම, ඒවායෙහි වැදගත්කම, ලිඛිත සන්නිවේදනය, ලිපිගොනුකරණය හා ආකෘති සම්පාදනය යනාදී විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි රජයේ කාර්යාලවල ක්‍රියාත්මක වන කාර්යාල ක්‍රම පිළිබඳව දැනුම හා කාර්යාල කටයුතුවල දී ලබාගත් අත්දැකීම්වල ප්‍රවීණතාව පරීක්ෂා කෙරෙන කොටසකින් ද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි I වන කාණ්ඩය හා ආයතන සංග්‍රහයේ I වන හා II වන කාණ්ඩවල අන්තර්ගත කරුණු පිළිබඳ දැනුම පරීක්ෂා කරන කොටසකින් ද මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ.

I වැනි කොටස - බහුවර්ණ ප්‍රශ්න පත්‍රයකි. කාලය මිනිත්තු 30 යි. (ලකුණු 25 යි.)

II වැනි කොටස - අර්ධ ව්‍යුහගත රචනා ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතුය. කාලය මිනිත්තු 60 යි. (ලකුණු 75 යි.)

14.2 රාජ්‍ය මූල්‍ය කළමනාකරණය.— රජයේ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ කාර්යාලවල භාවිතා වන මුදල් පාලනය, මුදල් භාරකාරත්වය, ආදයම් හා ගෙවීම්, අයවැය ඇස්තමේන්තු සහ සැපයුම් වැඩ හා සේවා යන විෂයයන් (භාණ්ඩ සමීක්ෂණය හා ගබඩාකරණය, මුදල් රෙගුලාසි, විගණනය පිළිබඳ මූලික දැනුම, මූලික බැංකු පරිචය) පිළිබඳ දැනුම හා අවබෝධය විභාග කිරීම මෙම ප්‍රශ්න පත්‍රයෙන් අපේක්ෂා කෙරේ.

I වැනි කොටස - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය මිනිත්තු 30යි. (ලකුණු 25යි.)

II වැනි කොටස - අර්ධ ව්‍යුහගත රචනා ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතුය. කාලය මිනිත්තු 60යි. (ලකුණු 75යි.)

14.3 කාලීන ප්‍රවණතා.- දේශීය හා විදේශීය සිදුවීම් පිළිබඳ කාලීන දැනුම පරීක්ෂා කරන කොටසකින්, කාර්යාල කළමනාකරණය සම්බන්ධ නව ප්‍රවණතා, රාජ්‍ය සේවයේ සේවා සැපයීම පිළිබඳ නව ප්‍රවණතා හා යහපාලනය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන කොටසකින් ද මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ සහ අර්ධ ව්‍යුහගත රචනා මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. (ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය)

15.0 මෙම විභාග නිවේදනයට විධිවිධාන සලසා නොමැති කවර කරුණක් වුව ද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

16.0 ''සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.''

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2016 ජුනි මස 10 වැනි දින
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

ආදර්ශ අයදුම්පත්‍රය

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014(II)2016

Efficiency Bar Examination for Officers in Grade I of Public Management Assistants' Service - 2014(II) 2016

***(මෙම විභාග නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබනුයේ ඒකාබද්ධ සේවයට අයත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් පමණි.)***

ඔබ අයත්වන සේවය (මෙය සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනයේ 5.0 ඡේදයේ සටහන බලන්න)

(ගැසට් නිවේදනයේ 3.0 ඡේදයට අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

| නගරය | නගර අංකය |
|---|---|
| 1. | |
| 2. | |

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොද නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
(උදා : GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) :————.

2.0 සේවා ස්ථානය හා ලිපිනය :————.

2.1 කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම හා ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම හා ලිපිනය :————.
(සිංහලෙන් / දෙමළෙන්)

2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 ජාතික හැඳුනුම්පත් අංකය

5.0 ඔබ ඉදිරිපත් වන විෂයය / විෂයන් :-

| විෂය | විෂය අංකය |
|---|---|
| | |
| | |
| | |

6.0 දැනට දරන තනතුර :

6.1 තනතුර :————.

6.2 පත්වීම් ලිපියේ අංකය :————.

6.3 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියට පත් වූ දිනය :————.

7.0 7.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවටද? :————.

7.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.

7.3 තැපැල් කාර්යාලය :————.

7.4 ලදුපත් අංකය :————.

7.5 දිනය :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

8.0 අයදුම්කරුගේ සහතිකය :

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත්, මා විභාගයට පෙනී සිටින්නේ ....................වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/රුපියල්....................ක විභාග ගාස්තුව ............ තැපැල් කාර්යාලයට....................දින ගෙවා ලබාගත් ලදුපත ඉහත අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණ වලට හා විභාග පනතේ සියලු විධිවිධානයන්ට මම යටත් වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

...................................................................
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

සටහන : තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලය ලත් නිලධාරියෙකු හෝ ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ................................මහතා/මහත්මිය/මෙනවිය ................................වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, ඔහු/ඇය විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් කිරීමට සුදුසු බවත්/නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

...................................................................,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

I ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,

II මෙම නිලධාරියා/නිලධාරිණිය* ඒකාබද්ධ සේවයට අයත් බවත්,

III නිලධාරියා/නිලධාරිණිය* මෙම විභාගයට මීට පෙර පෙනී සිටි/ නොසිටි* බවත්,

IV නිලධාරියා/ නිලධාරිණිය* මෙයට පෙර විභාගයට පෙනී සිට ඇති නිසා නියමිත විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපත මෙම ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවත්,

V නිලධාරියා/ නිලධාරිණිය* මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,

මම සහතික කරමි.

* අනවශ්‍ය වචන කපා හරින්න.

...................................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

06 - 926

---

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

**අධිකරණ කළමණාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016**

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමණාකාර සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණියේ තනතුරු සඳහා සුදුස්සන් තෝරා ගැනීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

03. වැටුප් ක්‍රමය ඃ මසකට රු. 13,990/- 10X145 - 11X170 - 6X240 - 14X320 - රු. 23,230/- වැටුප් ප්‍රමාණයක් මෙම තනතුරට අයත්ය. මෙම තනතුරේ ආරම්භක වැටුප් පියවර රු. 13,990 ක් වේ. (මෙම වැටුප් පරිමානය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව සංශෝධනයට යටත් වේ.)

04. වයස ඃ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි. (රජයේ සේවයේ නියුතු නිලධරයන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

05. අධ්‍යාපන සුදුසුකම් :

අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හා ගණිතය ඇතුලුව විෂයයන් 06ක් සමත් වී තිබිය යුතු අතර සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ඇතුලුව විෂයයන් 05කට සම්මාන සාමාර්ථයන් ලබා තිබීම සහ ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික විද්‍යාල හෝ රජයේ ලියාපදිංචි පුහුණු ආයතනයක ලඝු ලේඛන හා යතුරු ලේඛන (ඉංග්‍රීසි) පාඨමාලාවක් සාර්ථකව හදරා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර අවසන් කර තිබිය යුතුය.

06. අයදුම්කරුවන් සඳහා විභාගයක් පවත්වනු ලබන අතර එම විභාගයේ ප්‍රතිඵල මත නියමිත ලකුණු මට්ටමට එළඹ ඇති තැනැත්තන් වාචික පරීක්ෂණයකින් පසු බඳවා ගනු ලැබේ. එලෙස තෝරා ගන්නා ලද අයදුම්කරුවන් සේවයට බඳවා ගැනීමෙන් පසු දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

07. නිර්දේශ පත්‍රය :

(අ) ඉංග්‍රීසි භාෂාව හා වාක්‍ය රචනය

(ආ) ඉංග්‍රීසි ලඝු ලේඛනය - විනාඩියකට වචන 100ක වේගයෙන් විනාඩි 05ක් තුළ කියවනු ලබන පාඨයක් ලඝුලේඛනය කර, එය විනාඩියකට වචන 10ක වේගයෙන් පිටපත් කිරීම.

(ඇ) ඉංග්‍රීසි යතුරු ලිවීම - විනාඩියකට වචන 40ක අවම වේගයෙන් විනාඩි 20ක් යතුරු ලිවීම

(ඈ) වාචික පරීක්ෂණය

සටහන : උත්තර පත්‍ර ලකුණු කිරීමේ දී පිරිසිදුකම හා නිරවද්‍යතාවය සැළකිල්ලට ගනු ලැබේ.

08. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පතක් මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. ආදර්ශ අයදුම්පතට අනුකූලව පමණක් අයදුම්කරුවන් විසින් තමන්ගේ අයදුම්පත් පිළියෙල කර ගැනීම අවශ්‍ය වේ. විභාගය සඳහා අයදුම් කිරීමේදී පරිපාලන ගාස්තු වශයෙන් ආපසු නොගෙවන රු.500/- ක මුදලක් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් මඟින් මහජන බැංකුවේ වේල්ල වීදිය ශාඛාවේ පවත්වා ගෙන යන ගිණුම් අංක : 297100199025039 බැර කර ලබා ගන්නා ලදුපත් අයදුම්පත්‍රයේ නියමිත කොටුවේ ඇලවිය යුතු වේ.

09. අයදුම්පත් 2016 ජූලි 15 වන දිනට හෝ එදිනට පෙර ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය, කොළඹ 12 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ අධිකරණ ලඝු ලේඛක (ඉංග්‍රීසි) යනුවෙන් සඳහන්කළ යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. රජයේ සේවයේ නියුතු නිලධරයන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් එවිය යුතු වේ.

10. අයදුම්පත සම්බන්ධව පැන නඟින ගැටලු පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වනු ඇත.

ප්‍රදීප් ජයතිලක,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2016 මැයි මස 30 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

| |
|---|
| විභාග අංකය<br><br>(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි) |

(සැළකිය යුතුය - අයදුම්පත්‍රය නිවැරදිව සහ පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුවේ. අදළ කොටුවල නියමිත අංකය සඳහන් කරන්න.)

01. (i) මුලකුරු සමඟ අගට යෙදෙන නම :————.

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

02. ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී 01 ☐

පුරුෂ 02

03. ස්ථිර ලිපිනය :———.

04. ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :———.

05. පදිංචි දිස්ත්‍රික්කය :———.

06. දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

07. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

08. (අ). උපන් දිනය :———.

(ආ). අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු : ............... මාස........... දින............

09. රජයේ සේවයේ නියුක්ත නම්—

(i) අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :———.

(ii) දැනට දරණ තනතුර :———.

(iii) එම තනතුරට පත් කරන ලද දිනය :———.

(iv) එම තනතුරේ ස්ථිර කරන ලද දිනය :———.

(v) කාර්යාලීය ලිපිනය :———.

10. අධ්‍යාපන සුදුසුකම් :

(එක් එක් විභාගයේ ප්‍රතිඵල විභාග අංකය සහිතව වෙන් වෙන්ව සඳහන් කරන්න)

(අ) අ.පො.ස.(සා.පෙළ) විභාගය :

වර්ෂය............................ විභාග අංකය.................................. වර්ෂය....................... විභාග අංකය.........................

| අනු. අංකය | විෂය | සාමාර්ථය |
|---|---|---|
| | | |

| අනු. අංකය | විෂය | සාමාර්ථය |
|---|---|---|
| | | |

(ආ) අ.පො.ස.(උසස් පෙළ) විභාගය ඃ

විභාග අංකය ........................... වර්ෂය ...............................

| *අනු. අංකය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |

(ඇ). හඳුරා ඇති පාඨමාලාව පිළිබඳ විස්තර ඃ (*ගැසට් පත්‍රයෙහි 05 වගන්තිය අනුව ඇතුළත් කරන්න*)

.......................................................................................................................................................................................

සටහන ඃ අයදුම්කරුවන් විසින් චක්‍රලේඛයේ සටහන් උපදෙස් පරිදි නියමිත වටිනාකම තැන්පත් කර ලබාගත් රිසිට් පත්‍රය ගැලවිය නොහැකි පරිදි මෙහි අලවන්න.

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බවත්, මෙම විභාගය සඳහා පනවා ඇති නීති පිළිපැදීමට එකඟවන බවත් ප්‍රකාශ කරමි. මෙහි සඳහන් යම්කිසි තොරතුරක් අසත්‍ය බැව් හෝ වැරදි බැව් හෝ මා තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමටද මෙම තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව එම වරද දැනගන්නට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බැව් මා දනිමි.

දිනය ඃ .................................... .................................................,
අයදුම්කරුගේ අත්සන.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ

ඉහත නම් සඳහන් අයදුම්කරු මෙම අමාත්‍යංශයේ / දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත්, ඔහු / ඇය විසින් සපයා ඇති තොරතුරු නිවරදි බවත්, ඔහු / ඇය ඉහත තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මුදා හැරිය හැකි / නොහැකි බවත් දන්වමි.

.............................................,
දිනය ඃ .................................... දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නම ඃ........................................................................

නිල මුද්‍රාව ඃ..........................................................

06 - 922

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2016

**කෘෂිකාර්මික නිෂ්පාදන තාක්‍ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව - 2017/2019**

2017/2019 කෘෂිකාර්මික නිෂ්පාදන තාක්‍ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් 2016 සැප්තැම්බර් මස තුළ ප්‍රධාන නගර කිහිපයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයන්හි පවත්වනු ලැබේ.

02. කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව :

2.1 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලයන්හි ''කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය'' පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව පවත්වාගෙන යනු ලැබේ. මෙම පාඨමාලාව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇති අතර, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 6 මට්ටම ලබා දේ.

2.2 මෙම පාඨමාලාව ගැහැණු පිරිමි දෙපක්ෂයටම විවෘත වන අතර, මෙම විභාගයෙන් සුදුසුකම් ලැබූ අය සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව කුසලතා හා දිස්ත්‍රික් පදනම මත අඟුණකොළපැලැස්ස, කරපිංච, කුණ්ඩසාලේ, පැල්වෙහෙර සහ වවුනියාව යන කෘෂිකර්ම විද්‍යාල පහට තෝරාගනු ලැබේ.

2.3 සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙනුයේ සුදුසුකම් ලැබූ අයගේ සුදුසුකම්වල නිරවද්‍යතාව පරීක්ෂා කිරීම සඳහා පමණි.

2.4 මෙම පාඨමාලාව පූර්ණ ලෙස ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

2.5 මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමට කෘෂිකර්ම විද්‍යාලයේ අවුරුදු දෙකක පුහුණුවෙන් පසු ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරයේ (NAITA) අධීක්ෂණය යටතේ මාස 06ක රැකියාස්ථ පුහුණුවක් නම් කරන ලද ආයතනයකින් ලබාගැනීම අනිවාර්ය වේ.

2.6 කෘෂිකර්ම විද්‍යාලයේ පාඨමාලා පැවැත්වෙන කාලය තුළ නේවාසිකව සිටීම අනිවාර්‍යය වේ.

03. *පාඨමාලා සඳහා ඇතුළත්වීමට තිබිය යුතු සුදුසුකම්* :

3.1 (අ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්‍යයෙන් සම්මාන සාමාර්ථ හෝ විශිෂ්ට සාමාර්ථ ද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය හෝ කෘෂි ආහාර තාක්‍ෂණය හෝ උද්‍යාන විද්‍යාව යන විෂයයන් හයෙන් (06) එකකටවත් සම්මාන සාමාර්ථයක් ද ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන සාමාර්ථ හතරක් (04) තිබිය යුතුය) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක් (6) සහිතව අ. පො. ස. (සා. පෙළ) සමත් වී තිබිය යුතුය. මෙහිදී එක් වරකදී විෂයයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිතව අවම වශයෙන් විෂයයන් පහක් (05) සමත්ව තිබීම;

*සහ*

අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂය ධාරාව තුළ ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, යන විෂයයන් තුන හදාරා එක් විෂයයක්වත් සමත්වී තිබීම. (කෘෂිකර්ම විද්‍යාලවලට තෝරා ගැනීමේදී දිස්ත්‍රික් මට්ටමේදී විෂයයන් තුනක් (03) සමත්වී ඇති සිසුන්ට ප්‍රමුඛතාවක් ලබාදෙනු ලැබේ.)

*හෝ*

අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂය ධාරාව තුළ ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව හා රසායන විද්‍යාව, යන විෂයයන් තුන හදාරා එක් විෂයයක්වත් සමත්වී තිබීම. (කෘෂිකර්ම විද්‍යාලවලට තෝරා ගැනීමේදී දිස්ත්‍රික් මට්ටමේදී විෂයයන් තුනක් (03) සමත්වී ඇති සිසුන්ට ප්‍රමුඛතාවක් ලබාදෙනු ලැබේ.)

(උසස් පෙළ සඳහා ගණිතය විෂය ධාරාව හැදෑරූ සිසුන් රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව සමත්වී තිබීම මෙම පාඨමාලාවට සුදුසුකම් ලැබුවාසේ නොසැලකේ.)

(ආ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථ හෝ විශිෂ්ට සාමාර්ථද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය හෝ කෘෂි ආහාර තාක්‍ෂණය හෝ උද්‍යාන විද්‍යාව යන විෂයයන් හයෙන් (06) අවම වශයෙන් එකකටවත් සම්මාන සාමාර්ථයක් ද ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන සාමාර්ථ හතරක් (04) තිබිය යුතුය) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක් (06) සහිතව අ. පො. ස. (සා. පෙළ) සමත් වී තිබිය යුතුය. මෙහිදී එක් වරකදී විෂයයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිතව අවම වශයෙන් විෂයයන් පහක් (05) සමත්ව තිබීම;

*සහ*

අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී තාක්ෂණවේදය විෂය ධාරාවේ ජෛව තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයයන් තුන හදරා එක් විෂයයක්වත් සමත්වී තිබීම. (කෘෂිකර්ම විද්‍යාලවලට තෝරා ගැනීමේ දී දිස්ත්‍රික් මට්ටමේ දී විෂයයන් තුනක් (03) සමත්වී ඇති සිසුන්ට ප්‍රමුඛතාවක් ලබාදෙනු ලැබේ.)

*හෝ*

අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී තාක්ෂණවේදය විෂය ධාරාවේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව හා කෘෂිකර්මය යන විෂයයන් තුන හදරා එක් විෂයයක්වත් සමත්වී තිබීම. (කෘෂිකර්ම විද්‍යාලවලට තෝරා ගැනීමේදී දිස්ත්‍රික් මට්ටමේදී විෂයයන් තුනක් (03) සමත්වී ඇති සිසුන්ට ප්‍රමුඛතාවක් ලබාදෙනු ලැබේ.)

3.2 2016.07.25 වැනි දිනට අපේක්ෂකයාගේ වයස අවුරුදු 17ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 25ට වැඩි නොවිය යුතුය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 1999.07.25 දින හෝ ඊට පෙර හා 1991.07.25 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි. රජයේ සේවයේ නියුතු අය මෙම තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.)

04. *පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම* :

4.1 මෙම දැන්වීම අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාර අයදුම්කරුවන්ගේ අත් අකුරුවලින් හෝ යතුරුලියනය කර හෝ පරිගණකගත කරගෙන 8"x 12" ප්‍රමාණයේ (A 4 ප්‍රමාණයේ) කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින් තම අයදුම්පත සකස් කළ යුතුය. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍ර වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු වේ. එහි අංක 01 සිට අංක 10 තෙක් මුල් පිටුවේ ද, 11 සිට 13 තෙක් දෙවන පිටුවේ ද, ඉතිරිය 3 වැනි පිටුවේ ද සඳහන් කළ යුතු වේ. අසම්පූර්ණව පුරවා ඇති හා ආදර්ශ ආකෘතිය අනුව සකස් නොකළ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තමන් සම්පූර්ණ කරනු ලබන අයදුම් පත්‍රය මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු/කාරිය විසින් වග බලාගත යුතු වේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් තමන් ළඟ තබාගත යුතු වේ.

4.2 විභාග ගාස්තුව රු. 700කි. අපේක්‍ෂකයා විසින් මහජන බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල්ගේ "අංක 057100179027204" දරන ගිණුමට විභාග ගාස්තුව බැර කළ යුතුය. මුදල් බැරකර ලබාගත් කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ අලවා එවීමට කටයුතු කළ යුතුය. (ගලවා ගැනීමට හැකි වනසේ) තවද මුදල් කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීමට කටයුතු කළ යුතුය. මොනම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගයට ගෙවන ලද ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කළ නොහැක. විභාග ගාස්තු සඳහා වූ මුදල් කුවිතාන්සිය අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.

4.3 සියලුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2016 ජූලි 25 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "අධ්‍යක්‍ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ප්‍රමාද වන හෝ නැතිවන හෝ අයදුම්පත් ගැන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

4.4 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "2017/2019 කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත්වීම" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

05. *විභාග මධ්‍යස්ථාන :*

2017/2019 කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය පිළිබඳව උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුලත් කර ගැනීමේ තරග විභාගය, විභාග දෙපාර්තමේන්තුව මගින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් 2016 සැප්තැම්බර් මස තුළදී පහත සඳහන් නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පවත්වනු ලැබේ.

| *නගර අංකය* | *නගරය* |
|---|---|
| (1) | අනුරාධපුරය |
| (2) | බදුල්ල |
| (3) | මඩකලපුව |
| (4) | කොළඹ |
| (5) | ගාල්ල |
| (6) | යාපනය |
| (7) | මහනුවර |

| *නගර අංකය* | *නගරය* |
|---|---|
| (8) | කුරුණෑගල |
| (9) | මාතර |
| (10) | ත්‍රිකුණාමලය |
| (11) | වවුනියාව |
| (12) | රත්නපුරය |
| (13) | හම්බන්තොට |
| (14) | කිලිනොච්චිය |

කිසියම් විභාග මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් විභාග අපේක්ෂකයන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති විට ඔවුන්ගේ දෙවැනි කැමැත්ත අනුව හෝ අයැදුම් කොට ඇති මධ්‍යස්ථානයට සමීප වෙනත් විභාග මධ්‍යස්ථානයක් හෝ ඔවුන්ට නියම කෙරෙනු ඇත. විභාගය සඳහා ඉල්ලුම් කළ නගරය/නගර හෝ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. තවද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹදී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

06. *විභාග ක්‍රමය :*

6.1 *තරග විභාගය සඳහා වූ විෂයයන් හා කාල සටහන පහත සඳහන් වේ :*

| *විෂයයන්* | | *කාලය* | *කාල සටහන* |
|---|---|---|---|
| 01. පළමු ප්‍රශ්න පත්‍රය | (01) කෘෂිකර්මය (ලකුණු 100 යි)<br>(අ. පො. ස. (සා. පෙළ) කෘෂිකර්ම විෂයය නිර්දේශ මට්ටම හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පොදු විෂය කරුණු ආශ්‍රිතව සකස් කළ බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න අඩංගු වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය). | පැය 1 යි | 9.30 පැය - 10.30 පැය |
| 02. දෙවන ප්‍රශ්න පත්‍රය | (02) බුද්ධි පරීක්ෂණය (ලකුණු 100යි)<br>(රටා, සබඳතා, පුරෝකථන, ගැලපීම්, විශ්ලේෂණ කුසලතා පිළිබඳ හැකියා ආදිය පරීක්ෂාවට ලක් වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ). | පැය 1 යි | 11.00 පැය - 12.00 පැය |

6.2 මෙහි 3.1 සහ 3.2 ඡේදයන්හි සඳහන් සුදුසුකම් ඇති සියලුම අයදුම්කරුවන්ට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාවේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍ර නොලැබුණි නම්, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද, සඳහන් කර පහත අ, ආ, සහ ඇ හි සඳහන් ලියවිලිවල සහතික කරන ලද ඡායා පිටපත් ද සමගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඔබගේ ප්‍රවේශ පත්‍රය නොලැබීම පිළිබඳව දැන්වීම වඩා ඵලදායී වනු ඇත :

(*අ*) අයදුම්පත්‍රයේ ඡායා පිටපතක්,
(*ආ*) විභාගය සඳහා මුදල් ගෙවූ මුදල් කුවිතාන්සියේ ඡායා පිටපතක්,
(*ඇ*) අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සියේ ඡායා පිටපතක්.

6.3 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිසුන් ලබාගත් ලකුණු ඔවුන්ගේ ලිපිනයන්ට දන්වා එවනු ඇත. දිස්ත්‍රික් මට්ටමෙන් ඉහත විෂයයන් දෙකේ එකතුවෙහි වැඩිම ලකුණු ලබාගත් සිසුන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. මෙම ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම මත හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට කැඳවීම මත හෝ අදාළ අපේක්ෂකයාගේ සුදුසුකම් පිළිගැනීමක් නොවන බව සැළකිය යුතුය. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන්

පසුව හෝ යන කවර අවස්ථාවකදී වුවත් මෙම නිවේදනයේ කරුණු අනුව නුසුදුසු යැයි තීරණය වන අයදුම්කරුවකුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

6.4 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අපේක්ෂකයින්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

07. *බඳවා ගැනීමේ ක්‍රමවේදය :*

7.1 බඳවා ගන්නා වර්ෂය තුළදී සියලුම කෘෂිකර්ම විද්‍යාලවලට බඳවා ගන්නා මුළු සංඛ්‍යාව පදනම් කර ගෙන අයදුම්කරුවන් සිටින දිස්ත්‍රික්කවලට ඇතුළත් කරගනු ලබන සංඛ්‍යාව තීරණය කරගනු ලැබේ. ඉන් පසුව දිස්ත්‍රික්කයට,අයත් අයදුම්කරුවන් අතරින් තරග විභාගයේ පළමු හා දෙවන විෂයයන් දෙකේ ලකුණු එකතුව අනුව වැඩිම කුසලතාව පෙන්නුම් කළ අයදුම්කරුවන් හෝ අයදුම්කාරියන් තෝරාගනු ලැබේ. එසේ තේරීමේදී පහත සඳහන් කරුණු ද සැළකිල්ලට ගනු ලැබේ.

7.2 දිස්ත්‍රික් පදනම සළකා බැලීමේදී අ.පො.ස. (සා.පෙළ) විභාගයට පළමුවන වරට පෙනී සිටි දිස්ත්‍රික්කය අයදුම්කරු හෝ අයදුම්කාරිය අයත් දිස්ත්‍රික්කය ලෙස සලකනු ලැබේ. අ.පො.ස. (සා.පෙළ) විභාගයට පළමුවන වරට පෙනී සිටි දිස්ත්‍රික්කයට අදල අංකය සොයා අයදුම්පතේ අංක 5 පිරවීම සඳහා මෙම ගැසට් නිවේදනයේ අවසානයට පළකර ඇති ඇමුණුම් අංක 01 උපයෝගී කරගත යුතුවේ.

7.3 ලිඛිත විභාගයේ කෘෂිකර්මය හා බුද්ධි පරීක්ෂණය යන විෂයයන් දෙකේ ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් දිස්ත්‍රික් පදනමින් තෝරාගෙන සම්මුඛ පරික්ෂණයට කැඳවනු ලැබේ. ප්‍රතිඵල ලේඛනයේ දිස්ත්‍රික් කුසලතාවය ගණනය කිරීම සඳහා අයදුම්පත්‍රයේ අංක 5 යටතේ වූ තොරතුරු පදනම් කරගනු ලැබේ. එහිදී අ. පො. ස. (උ. පෙළ) ජීව විද්‍යා විෂය ධාරාව හෝ තාක්ෂණවේදය විෂය ධාරාව හදාරා විෂයයන් 03කින් එකවර සමත් වූ හා තරග විභාගයේ විෂයයන් දෙකේ එකතුව අනුව වැඩිම ලකුණු ලබාගෙන කුසලතාවය දැක් වූ අයට ප්‍රමුඛතාවය දෙමින් ඒ අය පළමුව තෝරාගනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් එවැනි අයදුම්කරුවන් නොමැති විට හෝ එවැනි අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විට දී පමණක් එම දිස්ත්‍රික්කවලින් තෝරාගනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව සම්පූර්ණ වනසේ අ.පො.ස. (උ.පෙළ) විෂයයන් දෙකක් හෝ එකක් සමත් අයදුම්කරුවන් අතරින් තරග විභාගයේ විෂයයන් දෙක සඳහා වැඩිම ලකුණු ලබාගෙන කුසලතාව දැක්වූ අයදුම්කරුවන් තෝරාගනු ලැබේ. මෙම තෝරා ගැනීම අනිවාර්යයෙන්ම 7.1 හා 7.2 හි සඳහන් ආකාරයට දිස්ත්‍රික්ක පදනමින් හා විභාගයේ දී දැක් වූ කුසලතාව අනුව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් අනුමත කර ඇති ක්‍රමයක් අනුව සිදු කෙරේ. අදාළ වර්ෂයේ දී එක් එක් කෘෂිකර්ම විද්‍යාලයට ඇතුළත් කරගනු ලබන පිරිමි හා ගැහැණු සිසුන් සංඛ්‍යාව එම විද්‍යාලවල පිරිමි හා කාන්තා නේවාසිකාගාරවල ඇති ඉඩකඩ අනුව හා එම විද්‍යාලවල ඇති පුහුණු පහසුකම් අනුව තීරණය කරනු ඇත. මේ නිසා තෝරා ගැනීමට සලකා බලන තරග විභාගයේ විෂයයන් දෙකේ ලකුණුවල එකතුවේ කඩඉම් ලකුණු මට්ටම් දිස්ත්‍රික්කයක පිරිමි හා ගැහැණු අයදුම්කරුවන් අතර වෙනස් වේ. කිසියම් දිස්ත්‍රික්කයකට තෝරා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති විට දී විද්‍යාලවලට උපරිම සිසුන් ප්‍රමාණයක් ඇතුළත් කිරීම සඳහා අනිකුත් දිස්ත්‍රික්කවලින් අවශ්‍ය සිසුන් සංඛ්‍යාව තෝරාගනු ලැබේ.

7.4 ඉහත සඳහන් කරුණු සලකා බලමින් තරග විභාගයේ විෂයයන් දෙකේ ලකුණු එකතුව අනුව වැඩිම ලකුණු සංඛ්‍යාවක් ලබාගත් සිසුන් සීමිත ප්‍රමාණයක්, එක් එක් දිස්ත්‍රික්කයකින් කැඳවා ඔවුන්ගේ අධ්‍යාපනික සහතික හා අදළ වෙනත් සහතික පරීක්‍ෂා කිරීමට සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. අයදුම්පතේ සඳහන් සහතිකවල මුල් පිටපත් මෙහි දී පරීක්‍ෂා කරනු ලැබේ. **සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබාදෙනු නොලැබේ.** කෘෂිකර්ම විද්‍යාලවලට තෝරාගනු ලබන සිසුන් සංඛ්‍යාවට වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

08. *"කුසුමා ලක්‍ෂමී කරුණාතිලක" සිහිවටන ශිෂ්‍යත්වය :*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ දී කෘෂිකර්මය, බුද්ධි පරීක්ෂණය යන ප්‍රශ්න පත්‍ර දෙකේ එකතුව අනුව වැඩිම ලකුණු ලබාගත් අයදුම්කාරියකට ඉහත ශිෂ්‍යත්වයේ කොන්දේසිවලට යටත්ව වර්ෂ දෙකක් සඳහා මෙම ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබේ. තෝරාගත් ශිෂ්‍යත්වලාභිණියට කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ඉගෙනුම ලැබීමට අවස්ථාව සලසා දෙනු ලැබේ. මෙම ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම රු. 10,000ක් වේ.

ආචාර්ය ආර්. ආර්. ඒ. විජේකෝන්,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

දිනය 2016 ජුනි මස 03 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

*ඇමුණුම් අංක 01*

*දිස්ත්‍රික්කවල නම් හා ඒවාට අයත් අංක*
*(7.2 ඡෙදයට අදළ වේ.)*

| දිස්ත්‍රික් අංක | දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් අංක | දිස්ත්‍රික්කය |
|---|---|---|---|
| 01 | අනුරාධපුරය | 13 | හම්බන්තොට |
| 02 | බදුල්ල | 14 | ගම්පහ |
| 03 | මඩකලපුව | 15 | කළුතර |
| 04 | කොළඹ | 16 | මාතලේ |
| 05 | ගාල්ල | 17 | නුවරඑළිය |
| 06 | යාපනය | 18 | මන්නාරම |
| 07 | මහනුවර | 19 | මුලතිව් |
| 08 | කුරුණෑගල | 20 | අම්පාර |
| 09 | මාතර | 21 | පුත්තලම |
| 10 | ත්‍රිකුණාමලය | 22 | පොළොන්නරුව |
| 11 | වවුනියාව | 23 | මොණරාගල |
| 12 | රත්නපුරය | 24 | කෑගල්ල |
| | | 25 | කිලිනොච්චිය |

*ආදර්ශ ඉල්ලුම් පත්‍රය*

*ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2016*
***කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව - 2017/2019***
(Competitive Examination for Admission to Sri Lanka School of Agriculture - 2016)
(Higher National Diploma in Agriculture Production Technology - 2017/2019)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි).

1.

| *විභාගයට පෙනී සිටින නගරය* | *එහි අංකය* |
|---|---|
| 1 වැනි තේරීම .................... | .................... |
| 2 වැනි තේරීම .................... | .................... |

*(ගැසට් පත්‍රයේ මුල් ඡෙදයට අනුව)*

2. *තරග විභාගයට පෙනී සිටීමට කැමති භාෂා මාධ්‍යය*

සිංහල මාධ්‍යය - 2
දෙමළ මාධ්‍යය - 3

............

(අදාළ අංකය ඉදිරිපස කොටුව තුළ ලියන්න)

3. ස්ත්‍රී/පුරුෂ භාවය ඃ

| | |
|---|---|
| පුරුෂ - 0 | |
| ස්ත්‍රී - 1 | |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. සා.පෙළ විභාගයට ප්‍රථම වරට පෙනී සිටි පාසල අයත්වන දිස්ත්‍රික්කය

දිස්ත්‍රික් අංකය

(7.2 ඡෙදයට අනුව/ඇමුණුම 01 බලන්න)

5. අ. පො. ස. (උසස් පෙළ) ජීව විද්‍යා විෂය ධාරාව /තාක්ෂණවේදය විෂය ධාරාව හදාරා සමත් වී ඇති විෂයයන් ගණන :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
විෂයයන් තුනක් එකවර - 3
විෂයයන් දෙකක් හෝ එකක් එකවර - 2

සමත් වූ විෂයයන් ගණනට අදාළ අංකය ඃ
..................

(3.1 ඡෙදයට අනුව)

6. (අ) (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
*උදා.* ඃ (HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDENA)

(ii) අගට යෙදන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :————.
*උදා.* ඃ (GUNAWARDENA H.M.S.K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

7. (i) ලිපිනය :————.

(ii) විභාග ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :————.

(iii) සම්බන්ධ කරගත හැකි දුරකථන අංක :

(i) ස්ථාවර : | | | | | | | | | | |

(ii) ජංගම : | | | | | | | | | | |

8. (අ) අ.පො.ස. (සා.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිටි පාසල හා ලිපිනය :————.

(ආ) පළමුවරට අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය (සිංහලෙන්) :————.

(ඇ) පළමුවරට අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය (ඉංග්‍රීසියෙන්) :————.

9. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

10. (අ) පදිංචි මැතිවරණ කොට්ඨාසය (සිංහලෙන්) :————.

(ආ) මැතිවරණ කොට්ඨාසය (ඉංග්‍රීසියෙන්) :————.

11. උපන් දිනය : අවුරුද්ද : | | | | | මාසය : | | | දිනය : | | |

12. 2016.07.25 වැනි දිනට වයස : අවුරුදු : | | | මාස : | | | දින : | | |

13. *අධ්‍යාපන සුදුසුකම් : (ගැසට් නිවේදනයේ සඳහන් විස්තර අනිවාර්යයෙන් කියවා මෙම කොටස පිරවිය යුතු වේ.)*

(අ) *ගැසට් නිවේදනයේ 3.1 ඡේදය අනුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයන් හය හෝ ඊට වැඩි ගණන :*

| *විභාග අංකය* | *වර්ෂය සහ මාසය* | *සමත් විෂයයන්* | *විෂයය අංකය* | *සමත් ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| | | 1. | | |
| | | 2. | | |
| | | 3. | | |
| | | 4. | | |
| | | 5. | | |
| | | 6. | | |
| | | 7. | | |
| | | 8. | | |
| | | 9. | | |
| | | 10. | | |
| | | 11. | | |

(ආ) ගැසට් නිවේදනයේ 3.1 ඡේදය අනුව සම්මාන සාමාර්ථයන් ලබා ගැනීම අනිවාර්ය කර ඇති විෂයයන් හතර පිළිබඳ විස්තර :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. සිංහල | | |
| | | 2. ගණිතය | | |
| | | 3. විද්‍යාව | | |
| | | 4. කෘෂිකර්මය | | |
| | | 5. සමාජ අධ්‍යයනය | | |
| | | 6. ඉතිහාසය | | |
| | | 7. ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය | | |
| | | 8. කෘෂි ආහාර තාක්‍ෂණය | | |
| | | 9. උද්‍යාන විද්‍යාව | | |

(ඇ) අ. පො. ස. (උ. පෙ.) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාව/තාක්ෂණ වේදය විෂය ධාරාව හදරා ඇත් ද?

ජීව විද්‍යා විෂය ධාරාව ☐
තාක්ෂණ වේදය විෂය ධාරාව ☐

(අදල කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

(ඈ) අ. පො. ස. (උ. පෙළ.) විභාගයෙන් සමත් විෂයයන්

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. ජීව විද්‍යාව | | |
| | | 2. කෘෂිකර්මය | | |
| | | 3. භෞතික විද්‍යාව | | |
| | | 4. රසායන විද්‍යාව | | |
| | | 5. තාක්ෂණ වේදය සඳහා විද්‍යාව | | |
| | | 6. ජෛව තාක්ෂණ වේදය | | |
| | | 7. ඉංජිනේරු තාක්ෂණ වේදය | | |

(ඉ) ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවන්න. (මුල් පිටපත් එවිය යුතු නොවේ.)
අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් අමුණා තිබේද ? :————.

14. (i) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
(සිංහලෙන්)
(ii) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්)

15. මුදල් කුවිතාන්සි විස්තරය :

15.1 මුදල් කුවිතාන්සි අංකය :————.
15.2 මුදල් කුවිතාන්සි නිකුත් කළ දිනය හා ශාඛාව :————.

| |
|---|
| මුදල් කුවිතාන්සියේ උඩ කොටසේ තීරුවක පමණක් මැලියම් ගා මෙහි අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් අනිවාර්යෙන්ම ඔබ ළඟ තබාගන්න. |

*අයදුම්කරුගේ ප්‍රකාශය :*

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති සියලුම විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. අ. පො. ස. (සා. පෙළ.) සමත් බවත්, සිංහල, විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් ඇති බවත්, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය හෝ කෘෂි ආහාර තාක්‍ෂණය හෝ උද්‍යාන විද්‍යාව යන විෂයන් හයෙන් එකකට සම්මාන සාමාර්ථයක් ඇති බවත් හා උසස් පෙළ ජීව විද්‍යා විෂය ධාරාව/තාක්‍ෂණවේදය විෂය ධාරාව හදාරා ගැසට් නිවේදනයේ නම් කර ඇති සියලුම සුදුසුකම් සපුරා ඇති බවටත් සහතික වෙමි. මෙහි සඳහන් කරුණු අසත්‍ය බව හෝ වැරදි බව හෝ හෙළි වුවහොත්, මා තරග විභාගයට පෙනී සිටීමට හා කෘෂිකර්ම විද්‍යාලයට තෝරා ගැනීමට නුසුදුස්සෙකු වන බව මම දනිමි. මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති පිළිපැදීමට මම එකඟ වෙමි.

―――――――,
අයදුම්කරුගේ අත්සන.

දිනය :―――――――.

**අධ්‍යාපන සුදුසුකම් හා අත්සන සහතික කිරීම**

(දෙපාර්තමේන්තුවක හෝ පාසලක ප්‍රධානියෙක්, සාමදාන විනිශ්චයකාරවරයෙක්, නීතිඥයෙක් හෝ රුපියල් 2,40,360 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු විසින් මෙම අයදුම්පත්‍රය සහතික කළ යුතුයි.)

ඉහතින් අත්සන් කර ඇති ................................ මයා/මිය/මෙනෙවිය මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් යෙදූ බවත් මෙයින් සහතික කරමි. තව ද, *ගැසට්* නිවේදනයේ සඳහන් අ. පො. ස. (සා. පෙළ) හා අ. පො. ස. (උසස් පෙළ) සුදුසුකම් ඇති බවට *ගැසට්* නිවේදනය හා අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් පරීක්‍ෂා කර බලා වගකීමකින් යුතුව සහතික කරමි. තව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත මෙම ඉල්ලුම් පතෙහි අලවා ඇති බවත් සහතික කරමි.

―――――――,
අත්සන
සුදුසුකම් සහතික කරන අයගේ
නිල මුද්‍රාව.

දිනය :―――――――.
නම :―――――――.
නිල නාමය :―――――――.
ලිපිනය :―――――――.

06-678

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

(i) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්), III ශ්‍රේණිය
(ii) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (විදුලි), III ශ්‍රේණිය
(iii) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (යාන්ත්‍රික), III ශ්‍රේණිය

1.0 ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි අධ්‍යක්‍ෂජනරාල් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් රාජකාරි කටයුතු සිදුකරන වැඩබිම් දිවයින පුරා විසිරී ඇති අතර, බස්නාහිර පළාතට අමතරව, වැඩිමනත් ඉදිකිරීම් කටයුතු සිදුවන උතුර (යාපනය, වව්නියාව), නැගෙනහිර (අම්පාර) හා උතුරු මැද (පොළොන්නරුව) පළාත් සඳහා නව කාර්මික නිලධාරී (සිවිල්) යෙදවීමට ඒ අනුව අපේක්ෂා කරන අතර, කාර්මික නිලධාරි (යාන්ත්‍රික/විදුලි) ප්‍රධාන කාර්යාලය වෙත අනුයුක්ත කෙරේ.

2.0 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව ඒ4 කඩදාසියේ දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කරන ලද අයදුම් පත්‍රයක් 2016.07.24 වැනි දිනට හෝ එදිනට ප්‍රථම "අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, 28/10, මලලසේකර මාවත, කොළඹ 07" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (සිවිල්/විදුලි/යාන්ත්‍රික) තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන, අපහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.0 *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසිः*

3.1 මෙම තනතුර ස්ථිර ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ.

3.2 රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන්වන ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්ති ද කාර්ය පටිපාටික රීති ද අදාල වේ.

3.3 තෝරා ගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, කලින්කල රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද යටත් විය යුතු ය.

4.0 *සාමාන්‍ය සුදුසුකම්ः*

4.1 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

4.2 විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

4.3 බඳවා ගන්නා නිලධාරීන් දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට කැමති විය යුතු ය.

4.4 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 30ට නොවැඩි විය යුතු ය.

5.0 *අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්ः*

5.1 සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

හා

5.2 භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂය ධාරාවට විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

6.0 *වෘත්තීය සුදුසුකම්ः*

6.1 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්/විදුලි/යාන්ත්‍රික), III ශ්‍රේණිය
ඉහත 5.0 හි අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව කේෂ්ත්‍රයට අදාළ පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් සම්පූර්ණ කර ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනය වන විට අදාළ සහතිකය ලබා තිබීම.

(i) මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව,

හෝ

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව,

හෝ

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව,

හෝ

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව,

හෝ

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම,

හෝ

(vi) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7.0 *තෝරා ගැනීමේ පදනම :*

7.1 *ලිඛිත තරග විභාගයේ කොන්දේසි:*

මේ සඳහා වන ලිඛිත විභාගය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනුවෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ලබන අතර, ඔහු විසින් දැනුම් දෙනු ලබන දිනක දී විභාගය පැවැත්වෙනු ඇත. ඔහු විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතු වේ.

7.2 සුදුසුකම් සහිත අයදුම්කරුවන් ලිඛිත තරග විභාගයකට යොමුකරන අතර, සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

එම විභාගයේ ලකුණු ලබාගත් අනු පිළිවෙල අනුව සම්මුඛ පරීක්‍ෂණයකට භාජනය කර සුදුස්සන් එම ලකුණු අනු පිළිවෙල අනුව තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්‍ෂණයේ දී ලකුණු ලබා දෙනු නොලබන අතර සුදුසුකම් පමණක් පරීක්ෂා කරනු ලැබේ.

7.3 ලිඛිත තරග විභාගයට අදාළ විස්තර පහත පරිදි වේ. :-

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | පැය 1 කි. | 100 | 40 |
| 02. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 3 කි. | 100 | 40 |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | අවබෝධ කර ගැනීමේ ශක්තිය, තර්කාණුකුල විචාර බුද්ධිය, නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යානමය හා ගණිතමය ගැටළු විසඳීමේ හැකියාව, භාෂා ඛණ්ඩ, වගු, පින්තූර, සටහන්, ප්‍රස්ථාර භාවිතය. |
| 02. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | *කාර්මික නිලධාරි (සිවිල්) තනතුර*<br>මාන, සැළසුම් පිළිබඳ දැනුම, අත්තිවාරම්, පස් වර්ග, ගොඩනැගිලි ද්‍රව්‍ය, ගොඩනැගිලි ව්‍යුහය සහ නිමාව, ගොඩනැගිලි සැළසුම් මගින් ප්‍රමාණ ගැනීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම, ජල සැපයුම් හා පල්දෝරු ක්‍රම. |
| | *කාර්මික නිලධාරි (විදුලි) තනතුර*<br>ගොඩනැගිලිවල විද්‍යුත් පරිපථ පිළිබඳ දැනුම, අනුගමනය කළ යුතු රෙගුලාසි, සැළසුම් පිළිබඳ දැනුම, ඇස්තමේන්තු සැකසීම හා පරිපථවල නිවැරදිතාවය පරීක්ෂා කිරීම. |
| | *කාර්මික නිලධාරි (යාන්ත්‍රික) තනතුර*<br>වාහන වර්ගීකරණය, අලුත්වැඩියාවේ දී හා සේවා කිරීම්වල දී භාවිතාවන ආයුධ, එන්ජිමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුම හා එහි එක් එක් කොටසෙහි කාර්ය භාරය, සිසිලන පද්ධතිය පිළිබඳ හා එහි එක් එක් කොටසෙහි කාර්ය භාරය පිළිබඳ දැනුම, සම්ප්‍රේෂණ පද්ධතිය පිළිබඳ දැනුම හා එහි එක් එක් කොටසෙහි කාර්ය භාරය හා විවිධ වර්ගයේ සම්ප්‍රේෂණ පද්ධති පිළිබඳ, විදුලි පද්ධතිය පිළිබඳ, සුක්කානම් පද්ධතිය, අවලම්බන පද්ධතිය, බැටරි වර්ගීකරණය හා පිරිවිතර සකස් කිරීම, ටයර් වර්ගීකරණය පිළිබඳ දැනුම,ටයර් අංකනය කර ඇති ජාත්‍යන්තර ප්‍රමිතිය පිළිබඳ දැනුම, බොඩියේ කොටස් පිළිබඳ දැනුම, ටයර් පද්ධතිය (Wheel Alignment) තබා ගැනීම හා ටයර් තුලනය (Wheel Alignment) කිරීම, වාහනයේ වායු සමීකරණ වර්ගීකරණය පිළිබඳ දැනුම, වාහනයේ වායු සමීකරණ පද්ධතියේ එක් එක් කොටසෙහි කාර්යභාරය, ගොඩනැගිලි සඳහා භාවිතා කරන වායු සමීකරණ යන්ත්‍ර වර්ගීකරණය පිළිබඳ, කාර්යාල උපකරණ වර්ගීකරණය පිළිබඳ දැනුම. |

7.4 ලිඛිත තරග විභාගය සිංහල /දෙමළ භාෂාවෙන් පවත්වනු ලැබේ.

8.0 *බඳවා ගැනීම:*

ඉහත 5.0 සහ 6.0 යටතේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා ඇති ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (සිවිල්/විදුලි/යාන්ත්‍රික) ශ්‍රේණිවලට බඳවා ගනු ලැබේ.

9.0 *වැටුප් පරිමාණය:*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි MN-3-2016 යටතේ

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (සිවිල්/විදුලි/යාන්ත්‍රික), III ශ්‍රේණිය
රු. 31,040 - 10 x 445 - 11 x 660 - 10 x 730 -10 x 750 - රු. 57,550/-

10.0 *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු.1,000 කි. අයදුම්කරුවන් විසින් ආපසු නොගෙවනු ලබන රු.1,000ක විභාග ගාස්තුවක් ශ්‍රී ලංකාව පුරා පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් (උප තැපැල් කාර්යාල හැර) '' SLIDA'' ගිණුම වෙත ගෙවිය යුතු අතර, ඒ ගෙවීමට අදාලව ලබා දෙන රිසිට්පතේ අංකය විභාග අයදුම්පතේ අංක 12 යටතේ ඇතුලත් කළ යුතුයි.

අදාල තැපැල් කාර්යාලයේ දී '' SLIDA'' ගිණුම වෙත මුදල් ගෙවීමේ ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී, මුදල් ලබා ගන්නා ලෙස '' SLIDA'' යන්න ද, මුදල් ලබා ගන්නාගේ ලිපිනය යන ස්ථානයේ ඔබට අදාල විභාගයේ සංකේත නාමය ද සටහන් කරන්න. (සංකේත නාමයන් පහත වගුවේ දක්වා ඇත.)

| | *විභාගයේ නම* | *සංකේත නාමය* |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්), III ශ්‍රේණිය | TOc |
| 02 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (විදුලි) ), III ශ්‍රේණිය | TOe |
| 03 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (යාන්ත්‍රික), III ශ්‍රේණිය | TOm |

තවද, ගිණුම වෙත මුදල් ගෙවීමේ දී මුදල් යවන්නා ලෙස අයදුම්කරුගේ නම ද, මුදල් යවන්නාගේ ලිපිනය යන ස්ථානයේ අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය ද, ඇතුලත් කර ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුතුයි.

11.0 යම් අයදුම්කරුවෙකුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබීම හේතුවෙන් ඔහු/ඇය නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමටත් ඉඩ ඇත.

12.0 *අත්සන සහතික කිරීම :*

අයදුම්කරුවන් තම ආදර්ශ අත්සන, රජයේ පාසල් ප්‍රධානියකු/විශ්‍රාමික ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු.240,360 හෝ ඊට වැඩි හෝ වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික නිලධාරියෙකු හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය තත්ත්වයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු ලවා සහතික කරවා ගත යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයන් සිය අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

මෙහි සඳහන් නොවන කරුණක් සඳහා තීරණ ගැනීමේ බලධාරියා ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් වේ.

එම්. ආර්. ජෙයචන්ද්‍රන්,
ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්.

2016 මැයි මස
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා.

අයදුම්කරන තනතුර :

(අදාල කොටුවෙහි ✓ලකුණ යොදා සලකුණු කරන්න.)

(i) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්), III ශ්‍රේණිය
(ii) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (විදුලි), III ශ්‍රේණිය
(iii) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (යාන්ත්‍රික), III ශ්‍රේණිය

01. (i) සම්පූර්ණ නම : ..............................................................................................................
..............................................................................................................
(ii) මුලකුරු සමඟ නම (සිංහලෙන්) : ..............................................................................

(iii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.) : ..........................................................
..............................................................................................................

02. ලිපිනය හා දුරකථන අංක :

(i) කාර්යාලීය ලිපිනය : ..............................................................................................
..............................................................................................................
දුරකථන අංකය : ..............................................................................................

(ii) පෞද්ගලික ලිපිනය : ..............................................................................................
..............................................................................................................

(iii) දුරකථන අංකය : .............................. (iv) ජංගම දුරකථන අංකය ; ....................................

03. ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. (i) උපන් දිනය : වර්ෂය මාසය දිනය

(ii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු මාස දින

06. විවාහක/අවිවාහක බව :
අවිවාහක - 1
විවාහක - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

07. අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර (පළමුවර) (කරුණාකර පිටපත් අමුණන්න.):

(i) විභාගය සමත් වූ වර්ෂය සහ මාසය : ..............................................................................

(ii) අයදුම්කරුගේ විභාග අංකය : ..............................................................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| ......................................................... | ................ | ......................................................... | ................ |
| ......................................................... | ................ | ......................................................... | ................ |
| ......................................................... | ................ | ......................................................... | ................ |
| ......................................................... | ................ | ......................................................... | ................ |
| ......................................................... | ................ | ......................................................... | ................ |
| ......................................................... | ................ | ......................................................... | ................ |
| ......................................................... | ................ | ......................................................... | ................ |
| ......................................................... | ................ | ......................................................... | ................ |
| ......................................................... | ................ | ......................................................... | ................ |
| ......................................................... | ................ | ......................................................... | ................ |

08. අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර (දෙවැනි වර) අවශ්‍ය නම් පමණක් (කරුණාකර පිටපත් අමුණන්න.) :

(i) විභාගය සමත් වූ වර්ෂය සහ මාසය : ..........................................................................................

(ii) අයදුම්කරුගේ විභාග අංකය : ..........................................................................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| ......................................................... | ................ | ......................................................... | ................ |
| ......................................................... | ................ | ......................................................... | ................ |
| ......................................................... | ................ | ......................................................... | ................ |
| ......................................................... | ................ | ......................................................... | ................ |
| ......................................................... | ................ | ......................................................... | ................ |

09. අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර (කරුණාකර පිටපත් අමුණන්න.):

විභාගය සමත් වූ වර්ෂය : .......................... මාසය : ............................... දිනය : .................

අයදුම්කරුගේ විභාග අංකය : ..........................................................................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| ......................................................... | ................ | ......................................................... | ................ |
| ......................................................... | ................ | ......................................................... | ................ |
| ......................................................... | ................ | ......................................................... | ................ |
| ......................................................... | ................ | ......................................................... | ................ |
| ......................................................... | ................ | ......................................................... | ................ |

10. අනෙකුත් සුදුසුකම්: තාක්ෂණ/වෘත්තීය (කරුණාකර පිටපත් අමුණන්න.) :..........................................
.........................................................................................................................................

11. අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති පළපුරුද්ද : ..........................................................................
.........................................................................................................................................

ඉහත 10, 11 සඳහා සුදුසුකම් සනාථ කරන සහතිකවල පිටපත් ඇමුණුම් ලෙස ඉදිරිපත් කිරීම අනිවාර්ය බව සලකන්න.

12. *විභාග ගාස්තු :*

මුදල් ගෙවූ රිසිට්පත් අංකය

| S | L | D | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|

රු.1,000ක් වන විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න.
(කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

13. *අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම ඃ*

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන .................................................................................................... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, ................................. දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මෙයින් සහතික කරමි.

..................................................................
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනයඃ ...........................

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම ඃ .............................................................................................
තනතුර ඃ ................................................................................................
ලිපිනය ඃ ................................................................................................
නිල මුද්‍රාව ඃ ................................................................................................

14. *අයදුම්කරුගේ ප්‍රකාශයඃ*

ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව මම මෙයින් සහතික කරමි. තවද, මෙහි ඇතුළත් කිසියම් තොරතුරක් අසත්‍ය හා සාවද්‍ය බව සොයා ගතහොත් එම සොයා ගැනීම තෝරා ගැනීමට පෙර සිදුවුවහොත් මා නුසුදුස්සකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසුව සොයා ගනු ලැබුවහොත් කිසිදු වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට ලක්වන බව ද දනිමි.

........................................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය ඃ ......................................

*රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා පමණි*

මෙම ඉල්ලුම්කරු වන ............................................................................ මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ............................................................................ වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක ලෙස සේවය කරන බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

......................................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන

තනතුර ඃ ............................................................ ......................................................................
දිනය ඃ ............................................................... (නිල මුද්‍රාව)

06-720

## සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

### වාග් චිකිත්සක තනතුරට බඳවා ගැනීම - 2016

01. සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් සහ පළාත් සභා යටතේ පාලනය වන රෝහල් හි වාග් චිකිත්සක තනතුරේ III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට පහත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. තනතුරට අදළ අධ්‍යාපන සුදුසුකම් :-

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාග් චිකිත්සාව පිළිබඳ උපාධියක් හෝ වාග් චිකිත්සාව පිළිබඳ වසර 02 කට නොඅඩු පූර්ණ කාලීන ඩිප්ලෝමාවක් ලබා තිබීම.

03. අනෙකුත් පොදු සුදුසුකම් :-

(අ) 2016.07.20 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(ආ) අදළ උපාධිය හෝ ඩිප්ලෝමාව බලපැවැත්වෙන දිනය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පෙර දිනයක් විය යුතුය.

(ඇ) ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟවිය යුතු අතර තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(ඈ) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

(ඉ) අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් දිනට අයදුම්කරුවන් විසින් සියළු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

04. අයදුම් කළ යුතු ක්‍රමය :-

(අ) A4 ප්‍රමාණයේ කඩදසි භාවිතා කර මේ සමඟ ඇති ආකෘති පත්‍රයට අනුව (අංක 1 සිට 9 දක්වා පළමු පිටුවේද, 10 සිට 13 දක්වා දෙවන පිටුවේද වනසේ ) අයදුම්පත සකස් කර ගත යුතුය.

(ආ) අයදුම්පතෙහි "ලදුපත" යන ස්ථානයේ, ලංකා බැංකුව තැප්‍රොබේන් ශාඛාවේ අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - විභාග ගාස්තු රැස් කිරීම යන ගිණුමට රු. 500 ක් බැර කර එම ලදුපත නොගැලවෙන සේ අයදුම්පත්‍රයේ අදළ ස්ථානයේ ඇලවිය යුතුය. (ලදුපත ඇලවීමට ප්‍රථම එහි පිටපතක් තබා ගන්න).

(ඇ) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු/සාමදන විනිශ්චයකාරවරයෙකු/ දිව්රුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු හෝ ත්‍රිවිධ හමුදවේ අධිකාරි බලයත් නිළධාරියෙකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 3,34,452/- කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කල යුතුය.

(ඈ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත 9X4 ප්‍රමාණයේ ලියුම් කවරයකට බහා එම කවරයෙහි ඉහළ වම් කෙළවරේ "වාග් චිකිත්සක තනතුරට බඳවා ගැනීම 2016" යනුවෙන් සඳහන් කර 2016.07.20 දිනට පෙර අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ - 10 යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

05. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

06. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් කොන්දේසි වලට හා ආදර්ශ අයදුම්පත්‍රයට අදළ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය :-

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයේ දී ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව අපේක්ෂකයින් කායික යෝග්‍යතාව සහ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කිරීමෙන් පසුව පුරප්පාඩු සංඛ්‍යාවට අනුව බඳවා ගනු ලැබේ. (බඳවා ගන්නා නිලධාරින් සංඛ්‍යාව අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත.)

08. ලිඛිත විභාගය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ. :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයෝ දක්වන නිගමනය හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහසම්බන්ධතා වටහා ගැනීමෙහි ලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 01යි | 100 | 40% |
| 2. සාමාන්‍ය දැනීම | වාග් චිකිත්සක තනතුරට අදළව තර්කානුකුල කරුණු දැක්වීම සහ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම | පැය 01යි | 100 | 40% |

09. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :-

ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන්නේ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින්ව පමණි.

ලිඛිත පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය.

10. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :-

(අ) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට අයත් ය.
(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/ 2014 හා ඊට ආනුශංගික චක්‍රලේඛ අනුව අදළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.
(ඇ) වසර 03ක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.
(ඈ) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත් වේ.

11. තනතුරුවලට පත් කරනු ලබන සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ එම අවස්ථාවේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පදනම්වය. ඒ අනුව වාග් චිකිත්සක තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය තීරණය කළහොත් බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි හා පවතින පුරප්පාඩු මත එම තනතුරේ III ශ්‍රේණියේ තනතුරකට පත් කිරීමට කටයුතු කෙරේ. වාග් චිකිත්සක තනතුර සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/ 2016 හි MT- 5- 2016 වැටුප් පරිමාණය පරිදි රු. 31, 635 - 445x10 - 660x11 - 730x10 - 750x10 - රු. 58,145 පරිමාණය හිමිවන අතර ගෙවීම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/ 2016 හි විධිවිධාන අනුව සිදු කරනු ලැබේ.

12. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුලත් කල යුතුය. පත්වීම් ලැබීමෙන් පසු සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම් අවලංගු කර තනතුරෙන් පහකර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ ඇයගේ නම ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ.

13. තෝරා ගත් අයදුම්කරුවන් අදළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස තනතුරට පත් වී පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් තනතුරේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

14. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියළුම දෙනා රජයේ සේවකයින්ට අදළ වන සියළුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලටද, රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

15. වාග් චිකිත්සක තනතුරට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්ත්වයක් උද්වුවහොත්, ඒ පිළිබඳ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

අනුර ජයවික්‍රම,<br>
ලේකම්,<br>
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2016 ජුනි මස 06 වැනි දින.<br>
"සුවසිරිපාය",<br>
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,<br>
කොළඹ - 10.

ආදර්ශ අයදුම්පත්‍රය

**සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වාග් චිකිත්සක තනතුරට බඳවා ගැනීම - 2016**

අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනය හොඳින් කියවා බලන්න

1. (අ) මුලකුරු සමඟ අගට යෙදෙන නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) - උද : A.B.C. SILVA

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :—————.

2. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

3. තැපැල් ලිපිනය :- සිංහලෙන්/ දෙමළෙන් ඉංග්‍රීසියෙන්

……………………………… ………………………………
……………………………… ………………………………
……………………………… ………………………………
……………………………… ………………………………

4. (අ) ස්ථිර ලිපිනය :- සිංහලෙන්/ දෙමළෙන් ඉංග්‍රීසියෙන්

……………………………… ………………………………
……………………………… ………………………………
……………………………… ………………………………
……………………………… ………………………………

(ආ) දුරකථන අංක :- ජංගම | | | | | | | | | | | ස්ථාවර | | | | | | | | | | |

(ඇ) පදිංචි දිස්ත්‍රික්කය :- සිංහලෙන්/ දෙමළෙන් :—————. ඉංග්‍රීසියෙන් :—————.

(ඈ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක් ද ? (ඔව් / නැත) :—————.

(ඉ) "ඔව්" නම් කොපමණ කලක පටන් ද ? :—————.

5. උපන් දිනය :- වර්ෂය :—————. මාසය :—————. දිනය :—————.

2016.07.20 දිනට වයස :- අවුරුදු :—————. මාස :—————. දින :—————.

6. ස්ත්‍රී/ පුරුෂ භාවය :- ස්ත්‍රී - ☐ පුරුෂ - ☐ (අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න)

7. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද යන වග :- ඔව් - ☐ නැත - ☐ (අදාල කොටුවේ✓ ලකුණ යොදන්න)

8. විවාහක/ අවිවාහක බව :- විවාහක - ☐ අවිවාහක - ☐ (අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න)

9. අධ්‍යාපන සුදුසුකම් :-

| * | සමත් වූ උපාධිය/ ඩිප්ලෝමාව | සාමාර්ථය | උපාධියේ/ ඩිප්ලෝමාවේ ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA) හා එය බල පවත්වන දිනය | විශ්ව විද්‍යාලය/ ආයතනය | අධ්‍යයන වර්ෂය |
|---|---|---|---|---|---|
| 1 | | | | | |

10. ඔබ කවරදක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරද කරු වී තිබේ ද ? ඔව් - ☐ නැත - ☐
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)
ඔව් නම් විස්තර සපයන්න :————.

11. අයදුම්කරුගේ සහතිකය :-

(අ) මා විසින් ගැසට් නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් බව ද මම දැන සිටිමි.

| |
|---|
| ලංකා බැංකු තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ විභාග ගාස්තු රැස්කිරීම යන ගිණුමට රු. 500/- ගෙවා එම ලදුපතෙහි මුල් පිටපත මෙම ස්ථානයේ නොගැලවෙනසේ අලවන්න. |

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන

දිනය :————.

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන.....…………………….….. මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකවම දන්නා හඳුනන බව ද, ඔහු/ ඇය..……………………... දින මා ඉදිරිපිට දී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ ;

————,
සහතික කරන්නාගේ නිල මුද්‍රාව

* නම :————.
* ලිපිනය :————.

13. ඉල්ලුම් කරන අපේක්ෂකයා රාජ්‍ය සේවාවේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් ද නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාළ නොවන වචන කපා හරින්න)

i. ඉහත අයදුම්කරු/ අයදුම්කාරිය වන ...................... මහතා/මහත්මිය මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ............... තනතුර දරන බව මින් සහතික කරමි.

ii. ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර, ඔහු/ ඇය තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ ඇය දරන තනතුරෙන් නිදහස් කළ හැකි/ නොහැකි බව දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය :————.

————,
- දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල මුද්‍රාව -

* දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :————.
* තනතුර :————.
* ලිපිනය :————.

06-750

## සංවර්ධන නිලධාරී සේවයේ I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2014(II) (2016)

1.0 2012.09.07 දිනැති හා අංක 1774/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මගින් සංශෝධිත , 2012.02.14 දිනැති හා අංක 1745/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10 ඡෙදයේ විධිවිධානයන්ට අනුකූලව සංවර්ධන නිලධාරී සේවයේ III වන පන්තියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයක්, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2016 ඔක්තෝබර් මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 සංවර්ධන නිලධාරී සේවයේ III වන පන්තියේ නිලධාරීන් සඳහා මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම , මුලතිව් , ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුර, බදුල්ල, රත්නපුර, හා කිලිනොච්චිය යන නගරවල දී පැවැත්වේ. අදාළ නගර හා නගර අංක පහතින් දැක්වේ. ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතූන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අපේක්ෂකයින්ගේ දෙවන මනාපය පරිදි මධ්‍යස්ථානය තීරණය කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ. ඉල්ලුම්පත්‍රයේ අදාළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුවට අනුව සම්පූර්ණ කළ යුතු වේ. ඉල්ලුම් කළ නගරය /නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| නගරය | නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 05 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| මුලතිව් | 12 |
| ත්‍රිකුණාමලය | 14 |
| මඩකලපුව | 15 |
| කුරුණෑගල | 18 |
| අනුරාධපුරය | 19 |
| බදුල්ල | 21 |
| රත්නපුර | 24 |
| කිලිනොච්චිය | 25 |

3.0 (i) මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති ගැසට් නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

4.0 සුදුසුකම්.-සංවර්ධන නිලධාරී සේවයේ III වන පන්තියේ පත්වීමක් ලබා ඇති නිලධරයන් සහ සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වී නොමැති, එහෙත් අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කර ඇති නිලධරයන් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

සටහන.- මෙම ගැසට් නිවේදනයට සමගාමීව පළාත් සංවර්ධන නිලධාරී සේවයේ අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ඇත. ඒ ඒ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සහ මෙම විභාගයට අයදුම්කරන අනෙකුත් ආයතනවල නිලධාරීන්ගේ අයදුම්පත්‍ර වෙන් කර ගැනීමේ පහසුව සඳහා අයදුම්පත්‍රයේ ශීර්ෂයේ අදාළ සේවාව හෝ ආයතනය දැක්වීමේ දී සංකේත අංකයක් ඇතුලත් කළ යුතුවේ. ඒ අනුව ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ සංකේත අංකය 10 වේ. එම අංකය අයදුම්පතේ දකුණු පස ඉහළ ඔබ අයත් සේවය යන ස්ථානයේ සටහන් කළ යුතුය.

5.0 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර, ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2016 ජූලි මස 25 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ විභාග කොමසාරිස් ජනරාල් , සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තුමේන්තුව , තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් , විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

6.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව. - අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තුමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවෙකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

7.0 (i) *අයදුම්පත්‍ර .-* ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 1.0 සිට 5.0 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටු වලටද ඇතුළත් වන පරිදි "ඒ 4" ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත්‍රය පිළියෙල කළ යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. අයදුම්පත මේ සමඟ ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර , එක් අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. තව ද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) පළමු වන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වූවත් ඉන්පසු වාර වලදී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් හෝ එක් විෂයකට වඩා පෙනී සිටින්නේ නම් රු.400/- ක් ද එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු.200/- ක් ද විභාග ගාස්තු වශයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ. තවද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

8.0 අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමඟ විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශපත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපතද විභාග ගාස්තු ගෙවන ලද්දේ නම් ඊට අදාළ ලදුපතෙහි පිටපතද අතැතිව, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය , ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් ඔබගේ ඉහත විස්තර සහ විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මඟින් ඔබවෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මඟින් යොමු කරමින්ම විමසා සිටීම ද වඩාත් ඵලදායී වනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

*සටහන.-*අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු/ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

9.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10.0 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පැවැත්වේ. අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුනු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11.0 තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාර වලදී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිය. එතෙකුදු වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) බැගින් ලබාගත යුතුවේ. (වැඩි විස්තර සඳහා සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ 10 ඡේදය බලන්න.)

12.0 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා සියලුම නිලධාරීන් විසින් තමන්ගේ අයදුම්පත් රාජ්‍ය භාෂාවෙන් පිළියෙළ කළ යුතු අතර ඒවා එම භාෂාවෙන් ම පිරවිය යුතුය.

13.0 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ශ්‍රී ලංකා විභාග

දෙපාර්තමේන්තුව මඟින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගය සමත් වූ අපේක්ෂකයන්ගේ නම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ කිරීමට කටයුතු කරනු ඇත.

14.0 *විභාග පරිපාටිය*.-අපේක්ෂකයන් පහත දැක්වෙන විෂයයන් ඇතුලත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

| | විෂය | ලකුණු | කාලය | විෂය අංකය |
|---|---|---|---|---|
| 1. | කාර්යාල ක්‍රම | 100යි | පැය 01 යි | 01 |
| 2. | ගිණුම් ක්‍රම | 100යි | පැය 01 යි | 02 |
| 3. | පරිගණක පරීක්ෂණය | 100යි | පැය 02 යි | 03 |
| | එකතුව | 300යි | | |

14.1 කාර්යාල ක්‍රම :
රජයේ කාර්යාලවල භාවිත වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව ද , රාජකාරි ලිපි ලේඛන මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස් /නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝගය අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව ද පරීක්ෂා කෙරේ.

14.2 ගිණුම් ක්‍රම :
රජයේ කාර්යාලවල භාවිතා වන මූලික ගිණුම් හා මුදල් පාලන පොත්වල කාර්ය පිළිබඳ අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ.

14.3 පරිගණක පරීක්ෂණය :

(i) තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සංකල්ප
(ii) වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය
(iii) ගොනු කළමනාකරණය
(iv) වදන් සැකසුම-
මූලික කුසලතා , තිරයට හුරුවීම, පාඨ සංරක්ෂණය , පාඨ එකේලි කිරීම , අකුරු වර්ග හා උපලක්ෂණ, අනුච්ඡේද, ඡේද, ජේලි අතර පරතරය වෙනස් කිරීම , පිමි අනුයෝගය (Tab Setting) පාඨයක් සෙවීම හා ප්‍රතිෂ්ඨාපනය , අක්ෂර හා ව්‍යාකරණ දෝෂ , සමානාර්ථ පද තීරු යෙදීම, පිටුව සැකසීම , ලේඛණ මුද්‍රණය, වගු නිර්මාණය , අනුපිළිවෙලට සැකසීම, ගොනු කළමනාකරණය, ලේඛණයක් ලිපින කිහිපයකට යැවීමට සැකසීම, මැක්‍රෝ භාවිතය
(v) පැතුරුම්පත් -
මූලික කුසලතා , ආකෘතිකරණය (formatting), සංස්කරණය, තීරු හා පරාස, නව ඇතුලත් කිරීම් හා ඉවත් කිරීම්, දත්ත අනුපිළිවෙලට සැකසීම, ප්‍රස්තාර සැකසීම, මුද්‍රණය, @ ශ්‍රිතය (@ function), මැක්‍රෝ භාවිතය , ගොනු කළමනාකරණය
(vi) දත්ත සමුදාය-

හැඳින්වීමේ මූලික කුසලතා
දත්ත සමුදාය නිර්මාණය හා භාවිතය
ආකෘති
සන්ධානගත ආකෘති, උත්පතන ආකෘති (popup forms)
සංවාද හා පණිවුඩ කොටු
විමසුම්
අනුපිළිවෙළට සැකසීම
වාර්තා ලබා ගැනීම
මැක්‍රෝ භාවිතය

(vii) ඉදිරිපත් කිරීම /චිත්‍ර සටහන් -

මූලික කුසලතා , සංස්කරණය , ආකෘතිකරණය
සැලසුම් යෙදීම
අනුරූප, පසුරු සිත්තම් හා ලුස්තාර නිවේශනය,
කදා මාරුව හා සජීවකරණය, ඉදිරිපත් කිරීමේ මෙවලම් භාවිතය,
මාස්ටර් (Master) කදාව සැකසීම
කදා මුද්‍රණය හා සටහන්

(viii) අන්තර්ජාලය-
අන්තර්ජාලය හැඳින්වීම, විශ්ව විසිරි ජාලය,
මං සොයන ආකාරය, ව්‍යවහාරික අන්තර්ජාලය

(ix) විදුලි තැපැල (E-Mail)

හැඳින්වීම , මූලික කුසලතා, විදුලි තැපැල ලබා ගැනීම, විදුලි තැපැල යැවීම, ඊට ප්‍රතිචාර දැක්වීම, ඇමුණුම් භාවිතය, ලිපිනය හඳුනා ගැනීමට කෙටි නාම භාවිතය, පණිවුඩ සම්පාදනය

15.0 මෙම විභාග නිවේදනය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන බැවින් මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැලකිය යුතුය. තව ද, මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2016 ජුනි මස 10 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

ආදර්ශ අයදුම්පත්‍රය

**සංවර්ධන නිලධාරී සේවයේ I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014 (II) 2016**

**First Efficiency Bar Examination of Development Officers' Service – 2014(II) 2016**

(මෙම විභාග නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබනුයේ ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරී සේවයේ III වන පන්තියේ නිලධාරීන් පමණි.)

ඔබ අයත්වන සේවය (මෙය සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනයේ 4.0 ඡෙදයේ සටහන බලන්න) ☐

(ගැසට් නිවේදනයේ 2.0 ඡෙදයට අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය)

(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

| නගරය | නගර අංකය |
|---|---|
| 1. | |
| 2. | |

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐

සිංහල -2

දෙමළ -3

ඉංග්‍රීසි -4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න )

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.

(උදා. : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.

(උදා. : GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :———.

2.0 සේවා ස්ථානය හා ලිපිනය :

2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :———.

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :———.

2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය ( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :———.

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 ☐

පුරුෂ - 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

5.0 ඔබ ඉදිරිපත් වන විෂයය/විෂයන් :-

| විෂය | විෂය අංකය |
|---|---|
| | |
| | |
| | |

6.0 දැනට දරන තනතුර ඃ

6.1 තනතුර :————.

6.2 පත්වීම් ලිපියේ අංකය ඃ CS/DOS/ :————.

6.3 සංවර්ධන නිලධාරී සේවයේ III වන පන්තියට පත් වූ දිනය/සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහනය වීමට මනාපය පළ කළ දිනය :————.

7.0 7.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද ? :————.

7.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.

7.3 තැපැල් කාර්යාලය :————.

7.4 ලදුපත් අංකය :————.

7.5 දිනය :————.

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත) |

8.0 අයදුම්කරුගේ සහතිකය ඃ

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත්, මා විභාගයට පෙනී සිටින්නේ ........................................... වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/රුපියල් ..................................... ක විභාග ගාස්තුව ............................................... තැපැල් කාර්යාලයට ............................................................ දින ගෙවා ලබාගත් ලදුපත ඉහත අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට හා විභාග පනතේ සියලු විධිවිධානයන්ට මම යටත් වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

————,
අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

සටහන ඃ තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු හෝ ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ............................................................ මහතා/මහත්මිය/මෙනවිය .................................................................. වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, ඔහු/ ඇය විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් කිරීමට සුදුසු බවත්/ නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.

පදවි නාමය :————.

ලිපිනය :————.

දිනය :————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

I ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
II මෙම නිලධාරියා/නිලධාරිණිය * ඒකාබද්ධ සේවයට අයත් බවත්/සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කර ඇති බවත්,
III නිලධාරියා/නිලධාරිණිය* මෙම විභාගයට මීට පෙර පෙනී සිටි/ නොසිටි* බවත්,
IV නිලධාරියා/නිලධාරිණිය* මීට පෙර විභාගයට පෙනී සිට ඇති නිසා නියමිත විභාග ගාස්තු ගෙවූ ලදුපත මෙම ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවත්,
V නිලධාරියා/නිලධාරිණිය* මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,

මම සහතික කරමි.

* අනවශ්‍ය වචන කපා හරින්න.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

06-925

---

**සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ

පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2016

01. සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ පහත සඳහන් පාඨමාලාවන් සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *සංකේත අංකය* | *පුහුණු පාඨමාලාවේ නම* | *පුහුණු කාලසීමාව* | *පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය* |
|---|---|---|---|
| 1. | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | වසර 02 | ඉංග්‍රීසි |
| 2. | ඖෂධවේදී | වසර 02 | ඉංග්‍රීසි |
| 3. | භෞත චිකිත්සක | වසර 02 | ඉංග්‍රීසි |
| 4. | වෘත්තීය චිකිත්සක | වසර 02 | ඉංග්‍රීසි |
| 5. | විකිරණ ශිල්පී | වසර 02 | ඉංග්‍රීසි |
| 6. | අක්ෂි තාක්ෂණවේදී | වසර 02 | ඉංග්‍රීසි |
| 7. | දන්ත කාර්මික | වසර 02 | ඉංග්‍රීසි |
| 8. | පාසල් දන්ත චිකිත්සක | වසර 02 | ඉංග්‍රීසි |
| 9. | සෞඛ්‍ය කීට විද්‍යා නිලධාරී | වසර 02 | ඉංග්‍රීසි |
| 10. | අංගාදේශක හා සෘජුකරණඥ | වසර 02 | ඉංග්‍රීසි |
| 11. | මහජන සෞඛ්‍ය පරීක්ෂක | වසර 1 1/2 (ක්ෂේත්‍ර පුහුණුව මාස 06කි) | සිංහල, දෙමළ |
| 12. | ඛන්තු රේඛණ ශිල්පී | වසර 01 | ඉංග්‍රීසි |
| 13. | විද්‍යුත් නිකර්පණ රේඛණ සටහන්කරු | වසර 01 | ඉංග්‍රීසි |

02. පුහුණු පාඨමාලාවන්ට පළාත්වලින් බඳවා ගත හැකි අභ්‍යාසලාභීන් සංඛ්‍යාව එම පළාතේ පවතින රේඛීය අමාත්‍යාංශයට හා පළාත් සභාවට අයත් රෝහල් හා ආයතනවල පවතින පුරප්පාඩු ප්‍රමාණය පදනම් කර ගනිමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ආකාරයට පළාත් පදනම මත සුදුස්සන් තෝරා ගනු ලැබේ.

03. පාඨමාලාවන් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සඳහා අයදුම් කරන්නන් මෙහි අවසානයේ දක්වා ඇති ඇමුණුම 01 අනුව අදාල පාඨමාලාවන් සඳහා ඉල්ලුම් කළ යුතුය. එම ඇමුණුම අමාත්‍යාංශය විසින් පාඨමාලාවන් සඳහා අභ්‍යාසලාභීන් තෝරා ගනු ලබන ප්‍රමුඛතාවය අනුපිළිවෙලට සකස්කර ඇත. එබැවින්, අයදුම්කරුවන් විසින් පාඨමාලා කිහිපයක් ඉල්ලුම්කර ඇත්නම් , පාඨමාලා සඳහා තෝරා ගැනීම ඇමුණුම 01 හි දක්වා ඇති අනු පිළිවෙලට සිදු කරනු ලැබේ. අයදුම්කරුවන් පළමුව තේරී පත්වන පාඨමාලාවට ඇතුළත් විය යුතු අතර, ඔවුන්ට ඊළඟ පාඨමාලාවකට ඇතුළත් වීමට හෝ වෙනත් පාඨමාලාවකට මාරු වීමට හෝ අවස්ථාව ලබා දෙනු නොලැබේ.

04. මෙම පාඨමාලාවන් පූර්ණකාලීන පාඨමාලාවන් වේ. එබැවින්, සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ විශ්ව විද්‍යාලයක හෝ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ වෙනත් කුමන හෝ පූර්ණකාලීන පාඨමාලාවන් හදාරන සිසුන් මේ සඳහා අයදුම් නොකළ යුතුය. යමෙකු එසේ අයදුම් කර පසු අවස්ථාවකදී හෝ එය අනාවරණය වුවහොත් පාඨමාලාවෙන්/තනතුරෙන් ඉවත් කර ඒ වනතෙක් රජය විසින් ඔහු/ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් අය කර ගනු ලැබේ. විශ්වවිද්‍යාලයක පූර්ණකාලීන පාඨමාලාවක් හදාරන අයෙකු එසේ අයදුම් කිරීමට අදහස් කරන්නේ නම්, ඒ සඳහා පහත දැක්වෙන ආකාරයට ක්‍රියාකළ යුතු ය. සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලාවල ලියාපදිංචි වී සිටින අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.1 කිසියම් දිනක ඔබ කුමන හෝ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචිව සිටියේ නම් හෝ සිටින්නේ නම්, පාඨමාලාවට බඳවා ගනු ලබන දින වන විට ඔබ එම ලියාපදිංචිය අවලංගු කරගෙන තිබිය යුතු ය. ඔබ විශ්වවිද්‍යාලයක ලියාපදිංචිව සිට දේශන සඳහා සහභාගි නොවූ හෝ සහභාගි නොවන අයෙක් වුව ද ඔබ විශ්වවිද්‍යාල සිසුවෙකු ලෙස සලකනු ලබන බැවින්, එවැනි අයදුම්කරුවන් ද තම ලියාපදිංචිය අවලංගු කරගත යුතු ය. අවශ්‍ය අවස්ථාවල දී එය සනාථ කිරීම පිණිස ප්‍රමාණවත් ලිඛිත සාධක ඔබ සතුව තිබිය යුතු ය.

4.2 ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම් එම උපාධිය බලපැවැත්වෙන දිනය (EFFECTIVE DATE) පාඨමාලාවට බඳවා ගන්නා දිනට පෙර දිනයක් විය යුතු ය.

සැලකිය යුතුයි ඃ

* ඉහත 4.1 සිට 4.2 දක්වා සඳහන් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද අනිවාර්යයෙන්ම ඔබ අයදුම් කරන පාඨමාලාව සඳහා ඇතුළත් කර ගන්නේය යන්න මෙම ගැසට් නිවේදනයේ කුමන හෝ වගන්තියක් මගින් අදහස් **නොකෙරෙන** බව ඔබ තරයේ සිහි තබා ගත යුතු ය.

* එම 4.1 සිට 4.2 දක්වා සඳහන් කොන්දේසි සම්පූර්ණ කර තිබුණ ද, ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැතිනම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලාවන් සඳහා සුදුසුකම් නොලබන බව ඔබ දැනගත යුතු ය.

* එමෙන්ම, ඔබ ප්‍රමාණවත් Z අගයක් ලබා මෙහි සඳහන් අනෙකුත් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද, 4.1 සිට 4.2 දක්වා සඳහන් කොන්දේසි සම්පූර්ණ කර නොමැති නම්, කිසිදු අයුරකින් මෙම පාඨමාලාවන් සඳහා සුදුසුකම් නොලබන බව ඔබ තවදුරටත් දැනගත යුතු ය.

05. අධ්‍යාපන හා තනතුරට අදාල වෙනත් විශේෂ සුදුසුකම් ඃ

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ. පො. ස. (සා. පෙළ) සුදුසුකම් | අ. පො. ස. (උ.පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාල වෙනත් විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක්වරකදී විෂයයන් හයකින් (06)කින් අ.පො.ස. (සා.පෙළ) | 2014 හා 2015 යන වර්ෂ වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **රසායන විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ | නැත |

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ. පො. ස. (සා. පෙළ) සුදුසුකම් | අ. පො. ස. (උ.පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාල වෙනත් විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|
| | | සමත්වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි භාෂාව සමත් වීම. | සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් (02ක්) එක්වරකදී සමත්වීම. | නැත |
| 02. | ඖෂධවේදී | සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක්වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත්වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි භාෂාව සමත් වීම. | 2014 හා 2015 යන වර්ෂ වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **රසායන විද්‍යාව** විෂයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් (02ක්) එක්වරකදී සමත්වීම. | නැත |
| 03. | භෞත චිකිත්සක | සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක්වරකදී විෂයයන් හයකින් (06කින්) අ.පො.ස. (සා.පෙළ) සමත්වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි භාෂාව සමත් වීම. | 2014 හා 2015 යන වර්ෂ වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව** විෂයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් (02)ක් එක්වරකදී සමත්වීම. | නැත |
| 04. | වෘත්තීය චිකිත්සක | සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, ඇතුළු විෂයයන් හතරකට (4කට) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් (6කින්) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ. පො. ස. (සා. පෙළ.) ඉංග්‍රීසි භාෂාව සමත් වීම. | 2014 හා 2015 යන වර්ෂ වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව** විෂයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් (02ක්) එක්වරකදී සමත්වීම. | නැත |
| 05. | විකිරණ ශිල්පී | සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව, ඇතුළු විෂයයන් හතරකට (4කට) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් (6කින්) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි භාෂාව සමත් වීම. | 2014 හා 2015 යන වර්ෂ වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී **භෞතික විද්‍යාව විෂයට** සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් (02ක්) එක්වරකදී සමත්වීම. | නැත |

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ. පො. ස. (සා. පෙළ) සුදුසුකම් | අ. පො. ස. (උ.පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාල වෙනත් විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|
| 06. | අක්ෂි තාක්ෂණවේදී | සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06කින්) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2014 හා 2015 යන වර්ෂ වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02ක්) එක්වරකදී සමත්වීම. | නැත |
| 07. | දන්ත කාර්මික | සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06කින්) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2014 හා 2015 යන වර්ෂ වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **රසායන විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් (02ක්) එක්වරකදී සමත්වීම. | නැත |
| 08. | පාසල් දන්ත චිකිත්සක | සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06කින්) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2014 හා 2015 යන වර්ෂ වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02ක්) එක්වරකදී සමත්වීම. | අයදුම්කළ හැක්කේ ස්ත්‍රී පක්ෂයට පමණි. උස අඩි 4 යි අඟල් 10 හෝ ඊට වැඩි විය යුතුය. සියළුම අයදුම්කාරියන් අවිවාහක විය යුතුය. |
| 09. | සෞඛ්‍ය කීට විද්‍යා නිලධාරී | සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06කින්) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2014 හා 2015 යන වර්ෂ වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව, යන විෂයයන් අතුරින් දෙකක් (02ක්) එක්වරකදී සමත්වීම. | අයදුම්කළ හැක්කේ පුරුෂ පක්ෂයට පමණි. |
| 10. | අංගාදේශක හා ඍජුකරණඥ | දෙවරකට නොවැඩි වාර ගණනකදී විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි සහ සිංහල / දෙමළ යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06කින්) අ.පො.ස. (සා.පෙළ) සමත්වීම. | 2014 හා 2015 යන වර්ෂ වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව / ජීව විද්‍යාව** සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන් අතුරින් තුනක් (03ක්) එක්වරකදී සමත්වීම. | නැත |

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ. පො. ස. (සා. පෙළ) සුදුසුකම් | අ. පො. ස. (උ.පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාල වෙනත් විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|
| 11. | මහජන සෞඛ්‍ය පරීක්ෂක | සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06කින් ) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2014 හා 2015 යන වර්ෂවලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව හෝ සංයුක්ත ගණිතය** විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02ක් ) එක්වරකදී සමත්වීම. | අයදුම්කළ හැක්කේ පුරුෂ පක්ෂයට පමණි. උස අඩි 5 යි අඟල් 2ක් හෝ ඊට වැඩි විය යුතුය. |
| 12. | බන්තු රේඛණ ශිල්පී | සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06කින් ) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2014 හා 2015 යන වර්ෂවලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02ක් ) එක්වරකදී සමත්වීම. | නැත |
| 13. | විද්‍යුත් නිකර්පණ රේඛණ සටහන්කරු | සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06කින් ) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2014 හා 2015 යන වර්ෂවලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02ක් ) එක්වරකදී සමත්වීම. | නැත |

06. අනෙකුත් පොදු සුදුසුකම්:-

(අ) පාඨමාලා අංක 01,02,03,04,05 සහ 10 සඳහා ඉල්ලුම් කරනු ලබන, අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු අතර, පාඨමාලා අංක 06,07,08,09,11,12,13 සඳහා ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන්, අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

(ආ) පුහුණුවෙන් පසු මධ්‍යම රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ අවම වශයෙන් වසර 10ක් වත් සේවය කිරීමට කැමති විය යුතු ය.

(ඇ) මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

(ඈ) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතු ය.

07. *අයදුම් කළ යුතු ක්‍රමය:-*

(අ) මේ සමඟ ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පත සකස් කර ගත යුතුය. ඒ සඳහා A4 ප්‍රමාණයේ කඩදාසි භාවිතා කළ යුතුය. අයදුම්පතෙහි 1 සිට 9(අ) දක්වා පළමු පිටුවේද, 9 (ආ) සිට 12 දක්වා දෙවන පිටුවේ ද වන පරිදි සකස් කළ යුතුය. පුහුණු පාඨමාලා දෙකක් හෝ කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම්, එවැනි අයදුම්කරුවන් **එක් අයදුම්පත්‍රයක්** පමණක් ඉදිරිපත් කළ යුතුය. එවැනි අවස්ථාවකදී අංක 3 වගන්තියේ සඳහන් පරිදි ඇමුණුම 01 අයදුම් පත්‍රයට ඇමිණිය යුතුය. (පුහුණු පාඨමාලාවන් සඳහා තෝරා ගනු ලබන ප්‍රමුඛතා ලැයිස්තුව ඇමුණුම 01 හි සඳහන් වේ.)

(ආ) අයදුම්පතෙහි "ලදුපත" යන ස්ථානයේ ලංකා බැංකුව තැප්‍රොබේන් ශාඛාවේ අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - විභාග ගාස්තු රැස් කිරීම යන ගිණුමට පහත පරිදි මුදල් බැර කර එම ලදුපත නොගැලෙවන සේ ඇලවිය යුතුය.ලදුපත ඇලවීමට ප්‍රථම එහි පිටපතක් තබා ගන්න;

පාඨමාලාවන් 01 ක් සඳහා - රුපියල් 300
පාඨමාලාවන් 02 ක් සඳහා - රුපියල් 500
පාඨමාලාවන් 03 ක් සඳහා - රුපියල් 800
පාඨමාලාවන් 04 ක් සඳහා - රුපියල් 1,100
පාඨමාලාවන් 05 ක් හෝ ඊට වැඩි සඳහා - රුපියල් 1,400

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු/අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු/ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 3,34,452 කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ /අයදුම්කාරියගේ අත්සන සහතික කළ යුතුය.

(ඈ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග අදාළ ආකෘති පත්‍රය අමුණා එම කවරයෙහි ඉහළ වම් කෙළවරේ "පරිපූරක හා අතුරු වෛද්‍ය සේවාවන්හි පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම 2016" යනුවෙන් සඳහන් කර,ඊට පහළින් ඔබ ඉල්ලුම් කරන පළාත හා දිස්ත්‍රික්කය සඳහන් කොට 2016.07.20 දිනට පෙර අධ්‍යක්ෂ (පාලන) 02,සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,"සුවසිරිපාය",අංක 385,පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ -10 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

08. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.එමෙන්ම,මෙය බාහිර බඳවා ගැනීමක් බව සිහි තබා ගත යුතුය.

09. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

10. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

11. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට හා අදාල ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් අතුරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය ආමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් හා වෙනත් අමාත්‍යාංශයක මාණ්ඩලික නිලධාරියෙකුගේ නියෝජනයෙන් යුතු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) අ.පො.ස (උ.පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දැක්වෙන සහතිකයේ මුල් පිටපත (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමග අමුණා එවිය යුතුය.),

(ඇ) අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකයේ මුල් පිටපත ( මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමග අමුණා එවිය යුතුය.),

(ඈ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියැදුරු බලපත්‍රය.

(ඉ) ඉහත 6 (ඇ) අනුව පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය(ග්‍රාම නිලධාරි සහතිකය),

(ඊ) අවිවාහක බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු ඉදිරියේ අත්සන් කරන ලද විධිමත් දිවුරුම් ප්‍රකාශයක් (මෙය පාසල් දන්ත චිකිත්සක පුහුණුවට අයදුම් කරන අයදුම්කාරියන්ට පමණක් අදාළ වේ.)

13. පුහුණු කිරීමේ පරිපාටිය:-

I. සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කරුවන් අතුරින් තෝරා ගත් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් අදාළ පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා ඒ ඒ පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලැබේ.පාඨමාලාවන් අංක 1 වගුවේ දක්වා ඇති මාධ්‍යයෙන් හැදෑරිය යුතු ය.

II. පුහුණු පාසල්වලට ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල්වල බල පැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය ආමාත්‍යාංශය මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලටද යටත් වනු ඇත.

III. පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ තමන් ඇතුළත් කරනු ලබන පුහුණු පාසලෙහි විභාග හා නිවාඩුවලට අදාළ කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව, ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි ය.

IV. පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළදී අභ්‍යාසලාභීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන V හි විධිවිධාන වලට අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

V. පුහුණු පාසලට ඇතුලත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම ලදහොත් අවම වශයෙන් වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදයක් රාජ්‍ය සේවය යටතේ / පළාත් රාජ්‍ය සේවය යටතේ අදාළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතුය. පුහුණු කාලසීමාව තුල දී පුහුණුවෙන් ඉවත් වුවහොත්, පුහුණුව හැරගියහොත් ඉහත III වගන්තිය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් හෝ පත්වීම් ලැබ වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදයක් ඉහත පරිදි අදාළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණු කාලය තුළදී ඔහුට/ ඇයට ගෙවන ලද දීමනාව,රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදාල මුදල ඔහු/ ඇය විසින් සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය ආමාත්‍යාංශයට ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත්, එම මුදල් අයකරගැනීමට ගිවිසුම් ප්‍රකාර නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

14. සේවයේ නියුක්ත කරවීමේ නියමයන්:-

පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. එහෙත්, තමන් පුහුණුවට බඳවා ගත් පාඨමාලාවට අදාළව බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි හා පුහුණුව අවසන් කරන දිනය වන විට පවත්නා වූ පුරප්පාඩු මත සකස් කරන ප්‍රමුඛතා පුරප්පාඩු ලේඛනය සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත ස්ථාන මාරු ලබා දීමෙන් අනතුරුව ඉතිරි වන පුරප්පාඩු සඳහා පවත්නා මනාපය හා පුහුණු පාඨමාලාවේ අවසන් පරීක්ෂණ කුසලතාවය සැලකිල්ලට ගෙන අදාළ තනතුරේ III පංතියේ තනතුරකට පත් කිරීම සඳහා සලකා බලනු ලැබේ.

පුහුණු අවසානයේ දී ස්ථිර පත්වීම් ප්‍රදානය කළහොත් සංකේත අංක 1-10 දක්වා MT-6-2016 ද, සංකේත අංක 11 සඳහා MT-5-2016 ද, සංකේත අංක 12,13 සඳහා MT-4-2016 වැටුප් පරිමාණ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ. අදාල වැටුප් පරිමාණ පහතින් දක්වා ඇත.

| *වැටුප් ක්‍රමය* | *වැටුප් පරිමාණ* |
|---|---|
| MT-4-2016 | රු. 31,190-445x10-660x11-730x10-750x10 = රු. 57,700/= |
| MT-5-2016 | රු. 31,635-445x10-660x11-730x10-750x10 = රු. 58,145/= |
| MT-6-2016 | රු. 32,080-445x10-660x11-730x10-750x10 = රු. 58,590/= |

15. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතුය.පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යටකී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, ඒ දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/තනතුරෙන් පහ කරන අතර,ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තව ද, පුහුණු කාලය තුළදී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදාල මුදල ඔහුගෙන්/ඇයගෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

16. තෝරා ගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේදී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

17. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියළුම දෙනා රජයේ සේවයකයින්ට අදාළ වන සියළුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට,සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය ආමාත්‍යාංශය විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලටද,රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

18. පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී.එසේ ලබා දෙන්නේ නම්,ඒ සඳහා තක්සේරු නිවාස කාමර කුලිය,ජල හා විදුලි බිල්පත් අය කරනු ලැබේ.

19.මෙම පුහුණු කාලසීමාව තුළ දී වෘත්තීය සමිති කටයුතුවල යෙදීම හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත.එසේම,පුහුණුවෙන් පසුව ඔබ අදාළ තනතුරේ පත්වීම් ලදහොත්, ඉන්පසුවද පෞද්ගලික සේවයේ යෙදීමට ඔබට කිසිදු අයිතිවාසිකමක් නොමැත.එවැන්නක් සිදු කර අනාවරණය වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

20. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්වයක් උදාවුවහොත්,ඒ පිළිබඳ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය ආමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.මෙම ගැසට් නිවේදනයේ සිංහල,දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

අනුර ජයවික්‍රම,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය ආමාත්‍යාංශය.

"සුවසිරිපාය",
385,පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ -10
2016 ජුනි මස 05 වැනි දින.

**ඇමුණුම 01**

| පුහුණු පාඨමාලාව සඳහා තෝරාගනු ලබන ප්‍රමුඛතා පිළිවෙල | පුහුණු පාඨමාලාවේ නම | ඉල්ලුම් කරනු ලබන පාඨමාලාවට අනුව 1 සිට 13 තෙක් මනාපය අනුපිළිවෙලට අංක යොදන්න |
|---|---|---|
| 1 | වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී | |
| 2 | ඖෂධවේදී | |
| 3 | භෞත චිකිත්සක | |
| 4 | වෘත්තීය චිකිත්සක | |
| 5 | විකිරණ ශිල්පී | |
| 6 | අක්ෂිතාක්ෂණවේදී | |
| 7 | දන්ත කාර්මික | |

| පුහුණු පාඨමාලාව සඳහා තෝරාගනු ලබන ප්‍රමුඛතා පිළිවෙල | පුහුණු පාඨමාලාවේ නම | ඉල්ලුම් කරනු ලබන පාඨමාලාවට අනුව 1 සිට 13 තෙක් මනාපය අනුපිළිවෙලට අංක යොදන්න. |
|---|---|---|
| 8 | පාසල් දන්ත චිකිත්සක | |
| 9 | සෞඛ්‍ය කීට විද්‍යා නිලධාරි | |
| 10 | අංගාදේශක හා සෘජුකරණඥ | |
| 11 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | |
| 12 | ඛන්තු රේඛන ශිල්පී | |
| 13 | විද්‍යුත් නිකර්පණ රේඛන සටහන්කරු | |

එක් එක් පුහුණු පාඨමාලාවන් සඳහා මගේ මනාපය ඉහත වගුවෙහි දක්වා ඇත.මෙම මනාප ප්‍රකාශය කිසිදු අයුරකින් යලි වෙනස්කළ නොහැකි බවත්,මෙම මනාප ප්‍රකාශයට අමතරව කිසිදු මනාප ප්‍රකාශයක් මා ඉදිරිපත් කර නොමැති බවත්,සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ පරිපූරක හා අතුරු වෛද්‍ය පුහුණු පාඨමාලා සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාවය අනුව මා තේරී පත්වන පාඨමාලාවට ඇතුළත් වීමට මා කැමැත්ත පළ කරන බවත් එයට කිසිදු අයුරකින් විරුද්ධත්වයක් නොදක්වන බවත්, ගැසට් නිවේදනයේ සඳහන් සියලු වගන්ති අවබෝධයෙන් යුතුව කියවා තේරුම්ගත් බවත් දිවුරා ප්‍රකාශ කරමි.

.........................................................
අයදුම්කරුගේ අත්සන

ජා.හැ.අංකයඃ-..........................................
දිනයඃ-. 2016.......................................................

සාමාදාන විනිශ්වයකාරතැනගේ සහතිකය ඃ

මෙම මනාප ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන ............................................... මයා./මිය./මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය .......................................................දින මා ඉදිරිපිට දී අවබෝධයෙන් යුතුව ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

.................................................................
( සාමාදාන විනිශ්වයකාරතැනගේ අත්සන)

දිනයඃ-.....................

සාමාදාන විනිශ්වයකාරතැනගේ සම්පූර්ණ නම ඃ-...........................................................................................................
ලිපිනය ඃ- ...................................................................... සාමාදාන විනිශ්වයකාරතැනගේ නිල මුද්‍රාව
.......................................................................
.......................................................................

## ආදර්ශ අයදුම්පත්‍රය

## වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2016

### අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනය හොඳින් කියවා බලන්න

* අයදුම්කරන පාඨමාලාවල සංකේත අංක ඃ-

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | |

1. (අ) මුලකුරු සමඟ අගට යෙදෙන නම ඃ————.

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) - *උදා.* : A.B.C.SILVA

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.

2. ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | | (පිටපතක් අමුණන්න)

3. තැපැල් ලිපිනය :- සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

……………………………… ………………………………
……………………………… ………………………………
……………………………… ………………………………
……………………………… ………………………………

4. (අ) ස්ථිර ලිපිනය :- සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

……………………………… ………………………………
……………………………… ………………………………
……………………………… ………………………………
……………………………… ………………………………

(ආ) දුරකථන අංක :- ජංගම : | | | | | | | | | | | ස්ථාවර : | | | | | | | | | | |

(ඇ) පදිංචි දිස්ත්‍රික්කය : (සිංහලෙන්/දෙමළෙන්) :—————. ඉංග්‍රීසියෙන් :—————.

(ඈ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක් ද? (ඔව්/නැත) :—————.

(ඉ) ''ඔව්'' නම් කොපමණ කලක පටන්ද? :—————.

5. උපන් දිනය :- වර්ෂය :—————. මාසය :—————. දිනය :—————.

2016.07.20 දිනට වයස :- අවුරුදු :—————. මාස :—————. දින :—————.

උස :- අඩි :—————. අඟල් :—————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය :- ස්ත්‍රී - ☐ පුරුෂ - ☐ (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

7. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද යන වග :- ඔව් ☐ නැත ☐ (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

8. විවාහක/අවිවාහක බව :- විවාහක - ☐ අවිවාහක - ☐

9. අධ්‍යාපන සුදුසුකම් :-

(අ) අ.පො.ස. (උ.පෙළ) විභාගය (Z අගය සහිත ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් අමුණන්න)

විභාගයට ඉදිරිපත් වූ දිස්ත්‍රික්කය :—————.
විභාගයට පෙනී සිටි වර්ෂය :—————. විභාග අංකය :—————.
Z අගය :—————. විෂය ධාරාව :—————.

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |

(ආ) අ.පො.ස. (සා.පෙළ) විභාගය ඃ

| | විෂයය | පළමු වර | | දෙවන වර | |
|---|---|---|---|---|---|
| | | වර්ෂය | | වර්ෂය | |
| | | විභාග අංකය | | විභාග අංකය | |
| | | සාමාර්ථය | | සාමාර්ථය | |
| 1 | සිංහල භාෂාව/ දෙමළ භාෂාව | | | | |
| 2 | ගණිතය | | | | |
| 3 | විද්‍යාව | | | | |
| 4 | ඉංග්‍රීසි | | | | |
| 5 | | | | | |
| 6 | | | | | |
| 7 | | | | | |
| 8 | | | | | |
| 9 | | | | | |
| 10 | | | | | |
| 11 | | | | | |
| 12 | | | | | |

* ඔබ විසින් අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටි සියලු විෂයයන් ඉහත වගුවෙහි සඳහන් කළ යුතු වේ.

10. ඔබ කවරදක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේ ද? ඔව් - ☐ නැත - ☐
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් නම් විස්තර සපයන්න :————.

11. *අයදුම්කරුගේ සහතිකය ඃ*

(අ) මා විසින් ගැසට් නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මම වෙනත් කිසිදු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගී නොවන බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම් ලදහොත් ඉන් අනතුරුව හෝ එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් බව ද මම දැන සිටිමි.

| |
|---|
| ලංකා බැංකු තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ විභාග ගාස්තු රැස්කිරීම යන ගිණුමට අදාළ මුදල් ගෙවා එම ලදුපතෙහි මුල් පිටපත මෙම ස්ථානයේ නොගැලවෙනසේ අලවන්න. |

————,
අයදුම්කරුගේ /අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

12. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................... මයා./මිය./මෙනවිය මා පෞද්ගලිකවම දන්නා හඳුනන බව ද, ඔහු/ඇය ........................ දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

සහතිකකරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
* නම :————.
* ලිපිනය :————.

සහතික කරන්නාගේ නිල මුද්‍රාව.

06-749

---

## නිවැරදි කිරීමයි

### ශ්‍රී ලංකා පොලීසිය

පොලිස් ආධුනිකයන් බඳවා ගන්නා කාර්යාලය

2016.06.10 වැනි දින අංක 1971 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* I කොටස : II(අ) ඡේදය - තනතුරු ඇබෑර්තු යටතේ 06-288 නිවේදනයේ,

මාතෘකාව - ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව යන්න ''ශ්‍රී ලංකා පොලීසිය'' ලෙස ද,

නිවේදනයේ පොලිස් දෙපාර්තමේන්තුව ලෙස පළ වී ඇති ස්ථානවල ''ශ්‍රී ලංකා පොලීසිය'' ලෙසද නිවැරදි විය යුතු ය. එමෙන්ම, වැටුප් පරිමාණයට අනුව පහත සඳහන් දීමනා නිවැරදි විය යුතු ය.

| | | |
|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව | රු. 7,800.00 |
| (ආ) | දිරි දීමනාව | රු. 1,500.00 |
| (ඇ) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. 250.00 |
| (ඈ) | මූලික වැටුපෙන් 1/4 දීමනාව | රු. 3,962.50 |
| (ඉ) | දුෂ්කර දීමනාව | රු. 2,000.00 |
| (ඊ) | සංයුක්ත දීමනා | රු. 12,000.00 (400 x 30 මෙහෙයුම් ප්‍රදේශ සඳහා) |
| (උ) | සංයුක්ත දීමනා | රු. 9,600.00 (400 x 24 මෙහෙයුම් නොවන ප්‍රදේශ සඳහා) |

යූ. ඒ. එල්. උඩහවත්ත,
අධ්‍යක්ෂ/බඳවා ගැනීම්.

අංක 375, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත,
කොළඹ 06.

06-931

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.